# 2020/10/13 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2020/10/13 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

2020.10.13 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

විශේෂයෙන්ම පසුගිදා අපි ශ්‍රී ලංකාවෙන් කොවිඩ් 19 වසංගත තත්වය මැඩපැවැත්වුවත්, නැවත දෙවනි රැල්ලක් හැටියට අපේ ලංකාවෙ මේ වෙනකොට මෙම වසංගතය සෑම තැනම පැතිරිල ගිහිල්ල තියෙනවා. නමුත් යථා කාලෙදි ,පෙර පරිදිම, මෙම වසංගතය මැඩ පවත්වලා අපේ රටේ ජන ජීවිතය යථා තත්වයට පත් කරන්නට, වර්ථමාන ජනාධිපතිතුමාට හැකිවේවි කියලා අපි බලාපොරොත්තු වෙනවා. කොහොම නුමුත් අද අපේ නාගොඩ ප්‍රාදේශීය සභාවෙ මහා සභා රැස්වීම පවත්වන්නට අපි නීත්‍යානුකූල මට්ටමින් කටයුතු කරනවා. නමුත් අද රැස්වීම වෙනදා මෙන් නොවෙයි ටිකක් කල්වේලා ඇතුව අවසන් කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් අද පැමිණි උප සභාපතිතුමා ඇතුලු සියලු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා පිළිගැනීම මගේ යුතුකමක්. ඒ අනුව අද දින සභාවට පැමිණි උප සභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා මම ගෞරවයෙන් පිළිගන්නවා.

**(අ)01. 2020.09.08 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

ගරු මන්ත්‍රී එම් එම්.දිසානායක මහතාගේ වෙනත් කරුණු යටතේ සඳහන් කරන ලද ඌරල පහළ ගල් බැම්මක් දැමීමට යෝජනා කරන ලද ස්ථානය ගල්කන්ද ලෙස සභා වාර්තාවේ සටහන් වී ඇති අතර, එය ගල්ඇන්ද ලෙස නිවැරදි විය යුතු බව ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා විසින් පෙන්වා දෙන ලදී.

2020.09.08 ඉදිරි ගෙවීම් වාර්තාවේ අංක 07 යටතේ යූ.ජී.රංජිත් උදය කුමාර මහතාට අගෝස්තු මස අතිකාල දීමනා ලෙස ගෙවන ලද මුදල රු. 4206.25 ක් ලෙස සභා වාර්තාවේ සඳහන් වුවද, එය රු. 5206.25 ක් ලෙස සභිකවරුන්ට ලබා දුන් ඉදිරි ගෙවීම් වාර්තාවේ සඳහන් වී ඇති බව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් පෙන්වා දෙන ලදී. ඒ අනුව සභා වාර්තාවේද එම මුදල රු. 5206.25 ක් ලෙස නිවැරදි විය යුතුය.

**2020.09.08 දින පැවති මහා සභාවේ සභා වාර්තාව ඉහත සංශෝධනයන්ට යටත්ව, සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ආ). සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. සොමරස්ට්වත්ත නිවාස ක්‍රමයේ පොදු කොටස් පවරා දීම යන මැයෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් 2020.09.21 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

02. නිවෙස්වලට යාම සඳහා දැනට ඇති පාර පුළුල් කර ගැනීම යන මැයෙන් උඩලමත්ත දකුණ ඇලෙන්එගොඩ ප්‍රදේශවාසීන් විසින් 2020.09.17 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් මේ පිළිබඳව යෝජනාවක් ඉදිරිපත් කර ඇත. එම යෝජනාව සම්මත කොට ඉදිරි කටයුතු කිරීමට තීරණය කරන ලදී.**

**03.** ගල් මෝලක් සම්බන්ධව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය විසින් 2020.09.09 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

04. කුලී රථ, ත්‍රීරෝද රථ ගාල ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සම්බන්ධව සුභසාධක ත්‍රීරෝද රථ රියදුරන්ගේ සංගමය උඩුගම දකුණ, උඩුගම විසින් 2020.10.06 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**ගාල්ල - උඩුගම මහා මාර්ගය බී ශ්‍රේණියේ මාර්ගයක් වන බැවින් අදාළ මාර්ග රක්ෂිතය වත් මෙම ස්ථානයේ නොමැත. ඉන් ඔබ්බට රෝහල් ඉඩම පවතින බැවින් නීත්‍යානුකූලව මෙම කටයුත්ත කල නොහැකි බැවින් සභාවේ එකඟතාවය හිමි නොවුනි.**

05. සහන පැකේජයක් මත සිම්කාඩ්පත් ලබා දීම සම්බන්ධව ඩයලොග් ආයතනය විසින් 2020.09.24 දිනැතිව යොමු කරන ලද බිල්පත් වාර්තාව සභාගත කරන ලදී.

06. උඩවැලිවිටිය ගම්මැද්දේගොඩ යා කරන මාර්ගය සම්බන්ධයෙන් ගාල්ල දිසා අධිකරණයේ ගොනු කොට ඇති එල් 15888 දරණ නඩුවේ පෙනී සිටීම වෙනුවෙන් නීතිඥ ගාස්තු සම්බන්ධව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා 2020.10.13 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**මේ සඳහා සභාවේ අනුමැතිය හිමි වූ අතර. අදාළ නීතිඥවරයාගෙන් අවශ්‍ය ලිපි ලේඛන ලබා ගෙන ඉදිරි කටයුතු කිරීමට තීරණය විය.**

07. ටයර් නැවත පිරවීම සම්බන්ධයෙන් විජේතුංග පුද්ගලික සමාගම මගින් 2020.10.08 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

08. අනතුරුදායක ගසක අතු ඉවත් කිරීම සම්බන්ධව කොතලාවල, උඩුගම, කන්ද උඩ සුජීවා ලක්මාලි ද සිල්වා මහත්මිය විසින් 2020.06.12 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

09. ස්කවේටර් යන්ත්‍රය යොදවා අකුලහේන ධර්මදූත මධ්‍යස්ථානයට යන මාර්ගය සකස් කිරීම වෙනුවෙන් මුදල් ඉල්ලීම යන මැයෙන් යූ.ජී.ශ්‍රීමාල් සුරංග, උඩලමත්ත, ගාල්ල විසින් 2020.10.01 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම සභාගත කරන ලදී.

10. මා සතු ඉඩම කොටස් වශයෙන් විකිණීම යන මැයෙන් ජී.කේ.ජයසිරි පියසිරි, අරාලකන්ද, යටලමත්ත විසින් යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**බිම් කොටස් අඩු මුදලකට ලබාදීමට කටයුතු සළසා ඇති බැවින් , එම ලිපියට සභා අනුමැතිය ලබා දීමට තීරණය වූ අතර, අවුරුදු 03 ක් යන තෙක් මාර්ග නඩත්තු කිරීම හා අනෙකුත් නඩත්තු කටයුතු ඔහු විසින් සිදු කල යුතු බවටද තීරණය විය.**

**(ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

නැත.

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

01. කොම්පෝස්ට් අංගනයේ කසළ කළමනාකරන කටයුතු සිදු කිරීමේදී නිකුත් වන දුර්ගන්ධය පාලනය කිරීම සඳහා යුනයිටඩ් ග්ලාස් ලංකා පෞද්ගලික සමාගම හඳුන්වාදෙ රීඩ් ඕල් දියර ලබා ගැනීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

02. සභා කටයුතු සඳහා පැවැත්වෙන කමිටුවල සාමාජිකයින් වන ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා සහ විශේෂ ආරාධිත අමුත්තන් සඳහා සංග්‍රහ කටයුතු කිරීමට මසකට රු. 4000.00 ක මුදලක් සභා අරමුදලින් වෙන් කිරීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

03. 2021 වර්ෂයට නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් සති පොළවල් ටෙන්ඩර් කිරීමට සහ අවම ලංසුව තීරණය කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

04. 2021 වර්ෂයට ආදායම් රැස් කිරීමට අදාළ යෝජනාව

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

05. 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාළ දැන්වීම දිවයින පුවත්පතේ පළ කිරීමට යෝජනා කරමි

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

06. 2016 වර්ෂයේ තල්ගස්වල බදාදා සති පොළෙහි හිඟ පොළ බදු මුදල් අය කිරීම සඳහා එම් 343 අංක යටතේ බද්දේගම දිසා අධිකරණයේ විභාගවීමට නියමිත නඩුවෙහි ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම අප නීතිඥ හේමන්ත විතාරණ මහතාගේ උපදෙස් හා නිර්දේශ මත ක්‍රියා කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**07.** ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම

අංක **01** සිට **39** දක්වා ඇති ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීමට යෝජනා කරමි.

**2020.10.13 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.**

**01.ලංකා විදුලිබල මණ්ඩලය**
**2020 සැප්තැම්බර් මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 276.60 |
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු 8328.90 |
| 8617046104 | - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය | - රු. 752.40 |
| 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු. 1594.20 |
| 2809093105 | - කොම්පෝස්ට් ව්‍යාපෘතිය | - රු. 1301.40 |
| 2813038709 | - කැකුළු පෙර පාසල | - රු. 240.00 |
| 4599064300 | - ගෝණදෙනිය පෙර පාසල | - රු. 276.60 |
| 4507357802 | - සමනල පෙර පාසල | - රු. 294.90 |
| 8616374000 | - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් | - රු. 240.00 |
| 8616373802 | - උඩුගම පොළ | - රු. 240.00 |
| 45109082908 | - උක්ඕවිට පෙර පාසල | - රු. 258.30 |
| 8619142704 | - රන්කැකුළු පෙර පාසල | - රු. 240.00 |
| 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු. 1026.90 |
| 2810236100 | - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගණය | - රු. 240.00 |
| 4501096200 | - මාපලගම වෙළෙඳ සංකීර්ණය | - රු. 404.70 |

**2020 ජූනි, ජූලි, අගෝස්තු මාසයන් සඳහා විදුලි බිල්පත්**

| | | | |
|---|---|---|---|
| 4599064300 | - ගෝණදෙනිය පෙර පාසල | - ජූනි | - රු. 240.00 |
| 4599064300 | - ගෝණදෙනිය පෙර පාසල | - ජූලි | - රු. 240.00 |
| 4599064300 | - ගෝණදෙනිය පෙර පාසල | - අගෝස්තු | - රු. 240.00 |
| 8616374000 | - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් | - ජූනි | - රු. 240.00 |
| 8616374000 | - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් | - ජූලි | - රු. 240.00 |
| 8616374000 | - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් | - අගෝස්තු | - රු. 240.00 |
| 8616373802 | - උඩුගම පොළ | - ජූනි | - රු. 240.00 |
| 8616373802 | - උඩුගම පොළ | - ජූලි | - රු. 240.00 |
| 8616373802 | - උඩුගම පොළ | - අගෝස්තු | - රු. 240.00 |

**02. 2020 සැප්තැම්බර් මස දුරකථන බිල්පත්**
**ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**

| | | | |
|---|---|---|---|
| i. | 0912296537 | - සභාපති නිල කාමරයේ දුරකථන බිල්පත පියවීම | - රු. 3501.15 |
| ii. | 0912296433 | - ප්‍රධාන කාර්යාලය | - රු. 4231.11 |
| iii. | 0912296577 | - මාපලගම උප කාර්යාලය | - රු. 422.98 |

**03.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**

33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය (2020.08.20 – 2020.09.21) -රු. 2008.08
33/53/003/009/10 - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය (2020.08.20- 2020.09.21)-රු. 2190.00

**04. ශ්‍රී/ස ලංකාබෙල් පුද්ගලික සමාගම**

උප සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම 091-5701722
(2020.08.16- 2020.09.15) - රු. 613.02

**05. මොබිටෙල් පුද්ගලික සමාගම**

පුරනැගුම ව්‍යාපෘතියේ කෙටි පණිවිඩ සේවාවේ බිල්පත පියවීම (2020.08.25) - රු. 61.30
පුරනැගුම ව්‍යාපෘතියේ කෙටි පණිවිඩ සේවාවේ බිල්පත පියවීම (2020.09.25) - රු. 61.30

**<u>06 .2020 සැප්තැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)</u>**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 6200.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | -සංවර්ධන නිලධාරී | - රු. 6200.00 |

**<u>07. 2020 සැප්තැම්බර් මස ගමන් වියදම්</u>**

**පුහුණු වැඩසටහන් සඳහා**

| | | |
|---|---|---|
| කේ.ඩී.එස්.නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු. 1740.00 |
| එම්.ඒ.ඩී.චන්ද්‍රප්‍රභා මිය | - කළමනාකරණ සහකාර | - රු. 490.00 |
| එන්.එච්.ඩී. නිරෝෂනී මිය | - කළමනාකරණ සහකාර | - රු. 4380.00 |
| බී.ඩී. රුවිනි චතුරිකා මිය | - කළමනාකරණ සහකකාර | - රු. 490.00 |
| ශ්‍රියානි කිරින්දගේ | - පුස්තකාලයාධිපති | - රු. 890.00 |
| ඒ.ඒස්.මසීදා මෙය | - කළමනාකරණ සහකාර | - රු. 3800.00 |
| පී.කේ.එම්.වාසනා මෙය | - කළමනාකරණ සහකාර | - රු. 8060.00 |
| ඩබ්.ජේ.ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක | - රු. 3160.00 |
| ඩබ්.ඒ.සී. මධුෂානි මිය | - කාර්යාල කාර්ය සහායක | - රු. 880.00 |

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - ගරු සභාපති | -රු. 7000.00 |
| කේ.ඩී.එස්.නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු. 1430.00 |
| බී.ඩී.එල්.ඩී.දිල්රුක්ෂි කුමාරි මිය | - පුස්තකාලයාධිපති | -රු. 700.00 |
| ශ්‍රියානි කිරින්දගේ මිය | - පුස්තකාලයාධිපති | - රු. 700.00 |
| ටී.සෙව්වන්දි මනම්පේරි මිය | - පුස්තකාලයාධිපති | - රු. 700.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | - රු. 800.00 |
| අනුර දිසානායක මයා | -රියදුරු | - රු. 700.00 |
| එම්. ඒ වසන්ත මයා | -රියදුරු | - රු. 7000.00 |
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 2125.00 |
| ගංගා පත්මිණී මෙය | - පුස්තකාල සහායක | - රු. 700.00 |
| අනුෂි වසන්තිකා මිය | - පුස්තකාල සහායක | - රු. 700.00 |
| එන්.ජී. ගීතා රංජනි මිය | - පුස්තකාල සහායක | - රු. 700.00 |

**<u>2020 අගෝස්තු මස ගමන් වියදම්</u>**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>**

| | | |
|---|---|---|
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 475.00 |
| ඉන්දික කුමාර මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | |
| (ඡන්ද මධ්‍යස්ථාන විෂබීජහරණ කටයුතු සිදු කිරීම වෙනුවෙන් | | - රු. 700.00 |

**<u>08. අතිකාල දීමනා ගෙවීම්</u>**

**<u>2020 සැප්තැම්බර් මස</u>**

| | | |
|---|---|---|
| එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | - රු. 9046.40 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 7968.75 |
| යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු. 3580.00 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 5958.15 |
| එන්.එම්.රජිත මයා | - අනියම් මුරකරු | - රු. 5555.00 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 8560.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර මයා | - අනියම් රියදුරු | - රු. 8367.00 |
| අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 8989.86 |

**09. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. 2020 ජූනි මස ඉන්ධන ලබා ගැනීමේ බිල්පත - රු. 78000.00

ii. රාජකාරි අවශ්‍යතාවයන් වෙනුවෙන් කැබ් රථය අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් බිල්පත් මුදල් ප්‍රතිපූර්ණය කිරීම - රු. 700.00

iii. ඉන්ධන ඇණවුම්, දෛනික ධාවන සටහන් රජයේ මුද්‍රණාලයෙන් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 4968.00

**10. ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**

**<u>2020 සැප්තැම්බර් මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 591ක් | - රු. 61464.00 |
| 252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 300 ක් | - රු. 31200.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 140 ක් | - රු. 14560.00 |
| RA 8569 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 200 ක් | - රු. 20800.00 |
| RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 30 ක් | - රු. 3120.00 |
| DS 40 Oil 6L | - රු. 3240.00 |
| ජලභීතිකා රෝග මර්ධනය පෙට්‍රල් ලීටර් 15.5 | - රු. 2124.00 |
| 2T Oil 200ml | - රු. 200.00 |
| ගබඩාව පෙට්‍රල් ලීටර් 25 | - රු. 3425.00 |
| 2T Oil ලීටර් 1 | - රු. 580.00 |

**එකතුව** **- <u>රු.140713.00</u>**

**11.නීතිඥ හේමන්ත පී.ඩබ්.විතාරණ මයා, ගාල්ල**

i. 2020.10.09 දින සහ 2020.10.14 දිනයන්හිදී කැඳවීමට නියමිත එල් 16242 සහ (ගෝණදෙනිය පුහුල්හේන ඉඩම) සහ පී 14658 (කනත්තේගොඩ ඕවිට පොදු ළිඳ) දරණ නඩු වෙනුවෙන් නීතිඥ හා පෙනී සිටීමේ ගාස්තු - රු. 10000.00

ii. 2020.09.11 දින එම් 343 (තල්ගස්වල සති පොළ) නඩුවට සහ 2020.10.28 කැඳවීමට නියමිත පී 15977 (පරණතානායම්ගොඩ පඹගොඩවත්ත ළිඳ) නඩුවේ නීතිඥ ගාස්තු - රු. 8000.00

iii. 2020.08.05 දින පී 15977 නඩුව සහ 2020.09.30 දින කැඳවන ලද එල් 13814 (පිංවත්ත ගල්වාන පාර) නඩුවේ නීතිඥ ගාස්තු - රු. 6000.00

**12. ඒ.කේ.ද එස් කුමාරවඩු මහතා, අම්බලන්ගොඩ**

නාගොඩ , මාපලගම, උඩුගම පුස්තකාල සඳහා උපදේශන කමිටුව මගින් අනුමත කරන ලද කෘති 06 ක් මිළදී ගැනීමේ බිල්පත පියවීම - රු. 1608.00

**13. එම්.ඩී.ජනක ප්‍රියදර්ශන මයා, නාගොඩ**

RW 8886 ගාබේජ් ට්‍රේලරයේ වම්පස හා දකුණු පස ගා/නාගොඩ ප්‍රාදේශීය සභාව යන නාමය පින්තාරු කිරීමේ බිල්පත. - රු. 2500.00

**14. ඒ.ඩී.කරුණාරත්න මයා, නාගොඩ**

නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම 2020 සැප්තැම්බර් - රු. 7040.00

**15.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2020 ඔක්තෝම්බර් මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු27500.00

ii. 2020 සැප්තැම්බර් මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු.2625.00

**16. රෙජිස්ටාර් ජනරාල්, රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුව, ඇල්පිටිය**

2019 ඔක්තෝම්බර් මාසය සඳහා මුද්දර ගාස්තු උප ලේඛන සකස් කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 100.00

**17. රෙජිස්ටාර් ජනරාල්, රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුව, මාතර**

2017 සැප්තැම්බර් මාසය සඳහා මුද්දර ගාස්තු උප ලේඛන පිළියෙල කිරීම වෙනුවෙන් කාර්ය මණ්ඩල දීමනාව ගෙවීම - රු. 1000.00

2017 ඔක්තෝම්බර් මාසය සඳහා මුද්දර ගාස්තු උප ලේඛන පිළියෙල කිරීම වෙනුවෙන් කාර්ය මණ්ඩල දීමනාව ගෙවීම - රු. 1100.00

2018 මැයි මාසය සඳහා මුද්දර ගාස්තු උප ලේඛන පිළියෙල කිරීම වෙනුවෙන් කාර්ය මණ්ඩල දීමනාව ගෙවීම - රු. 100.00

**18. රෙජිස්ටාර් ජනරාල්, රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුව, පානදුර**

2018 දෙසැම්බර් මාසය සඳහා මුද්දර ගාස්තු උප ලේඛන පිළියෙල කිරීම වෙනුවෙන්
කාර්ය මණ්ඩල දීමනාව ගෙවීම - රු. 100.00

**19. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**
නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල
බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා ඔක්තෝම්බර් මස මාසික
කුලීය ගෙවීම - රු. 5000.00

**20. අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල**
පී එෆ් 7360 කැබ් රථයේ සේවා කිරීමේ බිල්පත පියවීම - රු. 18020.00

**21. දසමස් වැටුප් අත්තිකාරම්**
i. කේ.ජී. මානෙල් සුදර්ශනී මිය - රු.250000.00

**22. දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම**
i. මාපලගම වෙළඳ සංකීර්ණයේ වැසිකිලි පද්ධතිය අළුත්වැඩියා
කිරීමේ බිල්පත - රු. 885.00
ii. ට්‍රාන්ස්පේරන්ට් කොළ මිළදී ගැනීමේ බිල්පත - රු. 1860.00

**23. චාමින් හාඩ්වෙයාර්, තල්ගස්වල**
ප්‍රධාන කාර්යාලයේ රියදුරු විවේකාගාරය ඉදිකිරීමේ දී අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම
වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 1300.00

**24. එම්.ජේ. ජනිත් ඉරේෂ් කුමාර මයා, වදුරඹ**
i. ප්‍රාදේශීය සභාවේ 2020.09.08 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ
සංග්‍රහ බිල්පත (කෑම සඳහා) - රු. 6350.00
ii. ප්‍රාදේශීය සභාවේ 2020.09.08 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ
සංග්‍රහ බිල්පත - රු. 2881.00

**25. ශ්‍රීනිත් රුක්ෂාන් මයා, උඩුගම**
උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2020 සැප්තැම්බර් - රු. 5600.00

**26. සඳුන් චතුරංග මයා, ඊබේස් කම්පියුටර් ටෙක්නොලොජි, මාපලගම**
පරිගණක සඳහා මූසික 02 ක් සහ වයිෆයි ඇඩප්ටර් 01 ක් මිළදී ගැනීමේ බිල්පත - රු. 2550.00

**27. සදරු ග්‍රයින්ඩ් ඇන්ඩ් ග්‍රොසරි, නාගොඩ**
ජලභීතිකා මර්ධන වැඩසටහන් සඳහා සබන් හා ඩෙටෝල් මිළදී ගැනීමේ බිල්පත - රු. 1440.00

**28. නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ**
i. ජලභීතිකා මර්ධන වැඩසටහන් සඳහා ග්ලවුස් මිළදී ගැනීමේ බිල්පත - රු. 1200.00

ii. විදුලි සැපයුම් පුවරුව අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 2575.00

iii. කසල කළමනාකරණ කටයුතු සඳහා සවල් 02 ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 1580.00

**29. විගණකාධිපති, විගණන කාර්යාලය**

හිඟ විගණන ගාස්තු ගෙවීම - රු.10000.00

**30. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**

සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම (2020 සැප්තැම්බර්) - රු.13000.00

**31. ඒ.ජේ.ජී. ස්ටේෂනර්ස්, ගාල්ල**

පේරෝල් පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා මුද්‍රණ කඩදාසි ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 4300.00

**32. මදුසංක චේන්සෝ සර්විස්, උඩුගම**

තණකොල කපන යන්ත්‍ර 04 ක් අලුතින් උපාංග යොදා අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු.24410.00

**33. සහන ලංකා ට්‍රේඩිං කම්පැනි, උඩුගම**

නාගොඩ ප්‍රාදේශීය සභාවට ෆැන් 01 ක් ලබා ගැනීමේ බිල්පත - රු. 5200.00

**34.කේ.ටී.ආර්.ජී.උමාල් කිරිඇල්ල , වදුරඹ**

i. PF 7360 දරණ කැබ් රථයේ රියදුරු අසුනේ කැඩී ගිය බ්‍රැකට් කොටස අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 2300.00

ii. PF 7360 දරණ කැබ් රථයේ පිටුපස බපර් එකට පෝක් ලයිට් 02 ක් සවිකිරීමේ බිල්පත - රු. 3600.00

**35. ඊ.ඒ. සමන් කුමාර එදිරිසිංහ මයා, උඩුගම**

PF 7360 දරණ කැබ් රථයේ තිරිංග අළුත්වැඩියා කිරීමේ බිල්පත පියවීම - රු. 600.00

**පොදු අරමුදල්**

**36. ඒ.ඒ.ජයන්ත අරුණ, වදුරඹ**

ගල්කැටියාගොඩ මීනුවන්විල මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම වෙනුවෙන් මිළදී ගත් ද්‍රව්‍ය වෙනුවෙන් බිල්පත - රු. 16675.00

**රජයේ ආධාර**

**ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීම - 2019**

**37.තල්ගස්වල ග්‍රාම සංවර්ධන සමිතිය**

තල්ගස්වල නව නගරය මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ 10% රැඳවුම් මුදල් ගෙවීම - රු. 57429.15

**38.යටලමත්ත ගොවි සංවිධානය**
නාගොඩවළකුඹුර 70 කන්ද මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ 10% රැඳවුම් මුදල් ගෙවීම - රු. 56953.16

**පළාත් නිශ්චිත - 2016**
**39.කුරුපනාව ගොවි සංවිධානය, කුරුපනාව**
නාගොඩ විජිතාරාම විහාරස්ථානයේ විදුලිය තැතදීම කර්මාන්තයේ රැඳවුම් මුදල් ගෙවීම - රු. 8461.60

**ඉදිරි ගෙවීම් වාර්තාවේ සදහන් ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

<u>**2020.10.13 දින සභාවට යොමු කරන ආවරණ අනුමැතිය යටතේ කල ගෙවීම් පිළිබඳ විස්තරය**</u>

**01. ලංකා විදුලිබල මණ්ඩලය**
**2020 ජූලි මස විදුලි බිල්පත්**
ගි.අ. 2813189405 - තල්ගස්වල පෙර පාසල - රු. 240.00

**02. ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**

i. 0912231201 - සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත් පියවිම
2020 ජූලි - රු. 4277.70
2020 අගෝස්තු - රු. 4268.98

**03. ප්‍රියන්ත මෝටර්ස්,**
RA8569 ට්‍රැක්ටරයේ හිච් කොක්ක මිළදී ගැනීම සඳහා බිල්පත - රු. 3650.00

**ආවරණ අනුමැතිය යටතේ කල ගෙවීම් සහා අරමුදල් මගින් දැරීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).2 කර්මාන්ත යෝජනා**
**(ඉ) 2. ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

01. උඩලමත්ත අකුලහේන ධර්මදූත බෞද්ධ මධ්‍යස්ථාන මාර්ගය ස්කවේටරයක් යොදා පිළිසකර කිරීමට යෝජනා කරමි.
**ගරු උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

02. උඩලමත්ත ගොරොක්වල කන්ද මාර්ගයේ සෝමවීර මහතාගේ නිවස අසළ සිට උඩගෙදරගොඩ යූ.ජී.මනූර මහතාගේ නිවස දක්වා නව මාර්ගයක් සකස් කිරීමට යෝජනා කරමි.
**ගරු උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

01. උඩුගම අලුත්වත්ත ග්‍රාම නිලධාරී වසමේ 18 කන්ද බෞද්ධ මධ්‍යස්ථානය ඉදිරිපිටින් එම ගම්මානයට යාමට ඇති මාර්ගය දැඩි සෝදාපාළුවීමේ අවධානමක් ඇති බැවින් කඩිනමින් එම මාර්ගය සකස් කිරීමට යෝජනා කරමි.
**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනව ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

02. උඩුගම මධ්‍යම ග්‍රාම නිලධාරී වසමේ කටුකිතුල ආරන්‍ය සේනාසනයට ප්‍රවේශ මාර්ගය සෝදා පාළුවට ලක්ව ඇත. එය කඩිනමින් සකස් කිරීමට යෝජනා කරමි.
**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනව ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රිනී සුභාෂි මධුමාලි ඒකානායක මෙනවිය විසින් ඉදිරිපත් කරන යෝජනා**

01. ගම්මැද්දෙගොඩ උතුර බතලවත්තෙගොඩ ප්‍රධාන මාර්ගයේ කොටසක් සහ ගෝණලගොඩ කිතුල්දූව නියාගම මාර්ගයේ කොටසක් අධික වර්ෂාපතනය නිසා කැඩී ගොස් ඇති බැවින් තාක්ෂණ නිලධාරීයකු යොදවා ඒ පිළිබඳව අවධානය යොමු කොට එම මාර්ගයන් කඩිනමින් සැකසීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

02. ගම්මැද්දේගොඩ කොට්ඨාසයේ පහත සඳහන් ස්ථානවලට අවශ්‍ය කරන බෝක්කු ලබා දෙන ලෙස යෝජනා කරමි.
අශෝකාරාම විහාරස්ථානය අසළ කාණුව සඳහා
ගෝණලගොඩ ගහ අද්දර බෙම්මුල්ල වත්ත මාර්ගය සඳහා
කුරුදුකැටිය මාර්ගය සඳහා
රඹුප්පොත මාර්ගය සඳහා
ගුලනවිල රදාදෙණිය මාර්ගය සඳහා

**ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී එන්.ඩබ්.පතිනායක මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**01.** 222, ඌරල මධ්‍යම ග්‍රාම නිලධාරී වසමේ කොතේගොඩමාර්ගයේ දයාරත්න මහතාගේ නිවස අසළ ජලය බැස නොයා, ජලය රැදෙන නිසා ඉහත මාර්ගය සංවර්ධනය කරන ලද කොටසේ බෝක්කු යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.
**ගරු මන්ත්‍රි එන්.ඩබ් පතිනායක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

01. උඩවැලිවිටිතලාව 294 ඒ ග්‍රාම නිලධාරී වසමේ ප්‍රාදේශීය ලේකම් යටතේ අබරයිගොවිපල අසළ රජයේ ඉඩමෙන් පර්චස් 50 ක් ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට යෝජනා කරමි.
**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

02. ඉහත පවරාගනු ලබන ඉඩමේ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක්, පුස්තකාලයක් හා නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවක් ස්ථාපිත කිරීම සඳහා ගොඩනැගිල්ලක් ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.
**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

නැත.

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**Epson,HP ප්‍රින්ටර් සඳහා සේවා ගිවිසුම් අත්සන් කිරීම**

| විස්තරය | ඩිබග් කම්පියුටර් පෙරිපරල්ස් ප්‍රයිවට් ලිමිටඩ් |
|---|---|
| Epson lq 2090 වාර්ශික සේවා ගිවිසුම | 6048.00 |
| Jolimark DP 350 වාර්ශික සේවා ගිවිසුම | 4212.00 |
| HP laserjet 3069 වාර්ශික සේවා ගිවිසුම | 4644.00 |

**Epson,HP ප්‍රින්ටර් සඳහා සේවා ගිවිසුම් අත්සන් කිරීම සඳහා එම ප්‍රින්ටර් මිළදී ගත් ඩිබග් කම්පියුටර් පෙරිපරල්ස් ප්‍රයිවට් ලිමිටඩ් වෙතින් Epson,HP ප්‍රින්ටර් සඳහා සේවා ගිවිසුම් අත්සන් කිරීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව ඩිබග් කම්පියුටර් පෙරිපරල්ස් ප්‍රයිවට් ලිමිටඩ් වෙතින් Epson,HP ප්‍රින්ටර් සඳහා සේවා ගිවිසුම් අත්සන් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රි ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සහා සම්මත විය.**

<u>නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ සංවර්ධන අංශය සඳහා හිටවන විදුලි පංකාවක් ලබාගැනීමට ලැබී ඇති මිල ගනන්</u>

| විස්තරය | ඩී. ආර්. ඉන්ඩස්ට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ් - උඩුගම | සින්ගර් ප්‍රදර්ශනාගාරය - පිටිගල | සුපර් කූල් ඒයාර් - උඩුගම | සහන ලංකා ට්‍රේඩිං කම්පැනි - උඩුගම |
|---|---|---|---|---|
| හිටවන විදුලි පංකා | දම්රෝ<br>අඟල් 16 - 6545.50<br>අඟල් 18 - 7305.50 | Weeling – 5499.00<br>Sisil - 7199.00<br>Singar - 8099.00 | Amico - 5950.00<br>Mitshu - 6100.00<br>Telisonic – 6450.00 | Pioneer – 4800.00<br>Mitshu – 5200.00 |

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ සංවර්ධන අංශය සඳහා හිටවන විදුලි පංකාවක් ලබාගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කල සහන ලංකා ට්‍රේඩිං කම්පැනි - උඩුගම විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ සංවර්ධන අංශය සඳහා හිටවන විදුලි පංකාවක් ලබා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල සහන ලංකා ට්‍රේඩිං කම්පැනි - උඩුගම වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ සංවර්ධන අංශය සඳහා හිටවන විදුලි පංකාවක් ලබාගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රි ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සහා සම්මත විය.**

<u>නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ **Intercom system** ඒකක් ස්ථාපිත කිරීමට ලැබී ඇති මිල ගනන්</u>

| විස්තරය | දිනූ සොෆ්ට් - වංචාවල | යූනිවර්සල් පී.සී. සිස්ටම් - ගාල්ල | ආකොන් ටෙක්නොලජීස් - ගාල්ල | ඊ බේස් කොම්පියුටර් ටෙක්නොලජී - මාපලගම |
|---|---|---|---|---|
| **Intercom system** සම්බ්ධතා 10 සාමාන්‍ය 7 ඩිස්පලේ 3 | 245350.00 | 234600.00 | 240200.00 | 231500.00 |

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ Intercom system ඒකක් ස්ථාපිත කිරීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කල ඊ බේස් කොම්පියුටර් ටෙක්නොලජී - මාපලගම විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ Intercom system ඒකක් ස්ථාපිත කිරීමේ කාර්යය සිදු කිරීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව ඊ බේස් කොම්පියුටර් ටෙක්නොලජී - මාපලගම වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ Intercom system ඒකක් ස්ථාපිත කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රි ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

<u>නාගොඩ ප්‍රාදේශීය සභාවේ කසල ඒකතුකරන ට්‍රැක්ටරයේ හිච් කොක්ක සඳහා ලැබී ඇති මිල ගනන්</u>

| විස්තරය | ජයසුන්දර මෝටරස් - ගාල්ල | ප්‍රියන්ත මෝටර්ස් - තලගහ |
|---|---|---|
| මැසිෆර්ගියුෂන් 135 වර්ගයේ ට්‍රැක්ටරයේ හිච් කොක්ක | 4950.00 | 3650.00 |

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ Intercom system ඒකක් ස්ථාපිත කිරීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කල ඊ බේස් කොම්පියුටර් ටෙක්නොලජී - මාපලගම විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ Intercom system ඒකක් ස්ථාපිත කිරීමේ කාර්යය සිදු කිරීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව ඊ බේස් කොම්පියුටර් ටෙක්නොලජී - මාපලගම වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ Intercom system ඒකක් ස්ථාපිත කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රි ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**<u>නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රයෝජනය සඳහා භාවිතා වන ඉල්ලුම් පත් මුද්‍රණය කිරීමට ලැබී ඇති මිල ගනන්</u>**

| <u>විස්තරය</u> | <u>යසස් කොම් ඇන්ඩ් ප්‍රින්ට් - උනන්විටිය</u> | <u>ඒස්.ඒන්. ප්‍රන්ටර්ස් - නාගොඩ</u> | <u>ජේ. පී. කොමියුනිකේෂන් ඇන්ඩ් ප්‍රින්ට් ෂොප් - නාගොඩ</u> |
|---|---|---|---|
| ඉල්ලුම් පත් මුද්‍රණය ඒ 4 ප්‍රමානය ඩුප්ලෝ | තනිපැත්ත - 2.10<br>දෙපැත්ත - 2.20 | තනිපැත්ත - 2.00<br>දෙපැත්ත - 2.20 | තනිපැත්ත - 1.90<br>දෙපැත්ත - 2.00 |

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා භාවිතා වන ඉල්ලුම් පත් මුද්‍රණය කිරීමට ලැබී තිබූ මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කල ජේ. පී. කොමියුනිකේෂන් ඇන්ඩ් ප්‍රින්ට් ෂොප් - නාගොඩ විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා භාවිතා වන ඉල්ලුම් පත් මුද්‍රණය කිරීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව ජේ. පී. කොමියුනිකේෂන් ඇන්ඩ් ප්‍රින්ට් ෂොප් - නාගොඩ වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා භාවිතා වන ඉල්ලුම් පත් මුද්‍රණය කිරීමට සුදුසු බව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**<u>නාගොඩ ප්‍රාදේශීය සභාවේ PF 7360 කැබ් රථය කට් ඇන්ඩ් පොලිෂ් කිරීම සඳහා ලැබී ඇති මිල ගනන්</u>**

| <u>විස්තරය</u> | <u>උඩුගම මෝටර් ඉංජිනියර්ස්, උඩුගම</u> | <u>සේන මෝටර්ස් ඇන්ඩ් සර්විස්, නාගොඩ</u> | <u>ග්‍රෑන්ඩ් මෝටර්ස්, වදුරඹ</u> |
|---|---|---|---|
| PF 7360 කැබ් රථය කට් ඇන්ඩ් පොලිෂ් කිරීම | 12500.00 | 12000.00 | 12600.00 |

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ PF 7360 කැබ් රථය කට් ඇන්ඩ් පොලිෂ් කිරීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කල සේන මෝටර්ස් ඇන්ඩ් සර්විස්, නාගොඩ විසින් PF 7360 කැබ් රථය කට් ඇන්ඩ් පොලිෂ් කිරීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව සේන මෝටර්ස් ඇන්ඩ් සර්විස්, නාගොඩ වෙතින් PF 7360 කැබ් රථය කට් ඇන්ඩ් පොලිෂ් කිරීම සඳහා භාවිතා වන ඉල්ලුම් පත් මුද්‍රණය කිරීමට සුදුසු බව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

-

**<u>නාගොඩ ප්‍රාදේශීය සභාවේ තණ කොල කපන යන්ත්‍ර සඳහා තල වෙනුවෙන් ලැබී ඇති මිල ගනන්</u>**

| විස්තරය | නානායක්කාර හාඩ්වෙයාර් - නාගොඩ | ටී.ජී. හාඩ්වෙයාර් - නාගොඩ | දයානි ට්‍රේඩ් සෙන්ටර් මාපලගම |
|---|---|---|---|
| තණ කොල කපන යන්ත්‍ර සදහා තල | 350.00 | 375.00 | 350.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ තණ කොල කපන යන්ත්‍ර සදහා තල වෙනුවෙන් ලැබී තිබූ මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කල නානායක්කාර හාඩ්වෙයාර් - නාගොඩ විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ තණ කොල කපන යන්ත්‍ර සදහා තල මිළදී ගැනීමට තීරණය කරන ලදී. ඒ අනුව නානායක්කාර හාඩ්වෙයාර් - නාගොඩ වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ තණ කොල කපන යන්ත්‍ර සදහා තල මිළදී ගැනීම වෙනුවෙන් කිරීමට සුදුසු බව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

ගාබේජ් ටේලරයේ නාමය සදහන් කිරීම වෙනුවෙන් ලැබී ඇති මිල ගනන්

| විස්තරය | ප්‍රියදර්ශන ඇඩ්ස් නාගොඩ | ධනුශ්ක ඇඩ්ස් යටලමත්ත | නානායක්කාර හාඩ්වෙයාර් - නාගොඩ |
|---|---|---|---|
| නාගොඩ ප්‍රදේශීය සභාව ලෙස සටහන් කිරීමට | 2500.00 | 3000.00 | 3500.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ ගාබේජ් ටේලරයේ නාමය සදහන් කිරීම වෙනුවෙන් ලැබී තිබූ මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කල ප්‍රියදර්ශන ඇඩ්ස් නාගොඩ විසින් ගාබේජ් ටේලරයේ නාමය සදහන් කිරීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව ප්‍රියදර්ශන ඇඩ්ස් නාගොඩ වෙතින් ගාබේජ් ටේලරයේ නාමය සදහන් කිරීමේ කාර්යය සිදු කිරීමට සුදුසු බව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

ගබඩා උපකරණ හා සෞඛ්‍ය කම්කරුවන් සදහා අවශ්‍ය උපාංග වෙනුවෙන් ලැබී ඇති මිල ගනන්

| විස්තරය | රාජ්‍ය වානිජ්‍ය විවිධ නීතිගත සංස්ථාව - මාතර | දයානි ට්‍රේඩ් සෙන්ටර් මාපලගම | නානායක්කාර හාඩ්වෙයාර් - නාගොඩ |
|---|---|---|---|
| සවල් | 650.00 | 577.00 | 750.00 |
| අත්මේස් රබර් | 350.00 | 150.00 | 225.00 |
| ගම් බූට් | 2900.00 | කලු-1350.00<br>කහ-1850.00 | 1350.00 |
| වැහි කබා | - | 1850.00<br>2800.00 | - |
| විල්බැරෝ | 3790.00 | 2950.00<br>3500.00<br>4250.00 | 4400.00 |
| ඉදල් | 150.00 | 150.00 | 130.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ ගබඩා උපකරණ හා සෞඛ්‍ය කම්කරුවන් සදහා අවශ්‍ය උපාංග මිලදී ගැනීම වෙනුවෙන් ලැබී තිබූ මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කල දයානි ට්‍රේඩ්

**සෙන්ටර්, මාපලගම විසින් සවල්, රබර් අත්මේස් සහ විල්බැරෝ මිලදී ගැනීමටද, ඉදල් සඳහා අවම මිලගණන් ඉදිරිපත් කල නානායක්කාර හාඩ්වෙයාර් - නාගොඩ විසින්ද මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සහා සම්මත විය.**

<u>වීථි පහන් උපකරණ ලබා ගැනීම වෙනුවෙන් ලැබී ඇති මිල ගනන්</u>

**නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය වීථි පහන් උපකරණ ලබා ගැනීම වෙනුවෙන් ලැබී තිබූ මිළ ගණන්වලට අනුව (ඇමුණුම 1 හි දක්වා ඇත)**

**එම අයිතමයන්වලින් අංක 1,6,7,814,17,18,19,24,25,29,31,34,35 හා 36 යන අයිතම යක්කලමුල්ල අරුණ ඉලෙක්ට්‍රිකල් මගින්ද, අනු අංක 2,3,4,5,9,12,13,15,16,28,32,37,38,39,හා 40 දරණ අයිතම යක්කලමුල්ල කේ.එම්.ටී. ඩිස්ට්‍රිබියුටර්ස් වෙතින්ද අනු අංක 11,20,21,22,23,26,27 දරණ අයිතම කොළඹ 10 ඔරියන්ට් ඉලෙක්ට්‍රිකල්ස් වෙතින්ද අනු අංක 10,29,දරණ අයිතම නාගොඩ නානායක්කාර හාඩ්වෙයාර් මගින්ද අනු අංක 8 හා 33 දරණ අයිතම නාගොඩ ටී.ජී.හාඩ් වෙයාර් විසින්ද අනුඅංක 41 හා 42 දරණ අයිතම ඒකල එවර්ග්‍රීන් ලයිටින් වෙතින්ද මිළදී ගැනීමප්‍රසම්පාදන කමිටුව වෙතින් තීරණය කරනු ලදුව, එසේ මිලදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සහා සම්මත විය. (ඇමුණුම 1 මේ සමඟ අමුණා එවමි.)**

**(ඊ) කාරක සභා වාර්තා**

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

- ❖ 2020 සැප්තැම්බර් මාසයට අදාල ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් වාර්තාව ඔක්තෝම්බර් මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- ❖ 2020 අගෝස්තු මාසයට අදාළ මාසික ඒකාබද්ධ ආදායම් සාරාංශය ඔක්තෝම්බර් මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- ❖ 2020 සැප්තැම්බර් මාසයට අදාළ මාසික ඒකාබද්ධ වැය සාරාංශය ඔක්තෝම්බර් මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

**(ඌ) වෙනත් කරුණු :-**

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමනි, මේ වනවිට තල්ගස්වල අනවසරව ඉදිකිරල තියෙන කඩවල වැසිකිලි හදනවා. දැනගන්න බැරි විදිහට තමයි මේ ඉදිකිරීම් කරන්නෙ. වටේ ඉටිරෙදි ගහලා තේ කඩේ කරන්නෙ. ඇතුලෙ ඇටැක් බාත්රූම් හදනවා. ඒ පිළිබඳව අවදානය යොමු කරන්න. ඒ වගේම මම ගියවර බැකෝ යන්ත්‍රය පිළිබඳව යෝජනාවක් ඉදිරිපත් කළා. වෙන්දේසිය පිළිබඳව කල්යන නිසා අහන්නෙ. එක්කො හදන්න. නැත්නම් වෙන්දේසි කරන්න. මොකද මිලදී ගන්න කීපදෙනෙක්ම ඉන්නවා. ඒ පිළිබඳව පොඩ්ඩක් අවදානය යොමු කරන්න.

**සභාපතිතුමා පිළිතුරු දෙමින්**

තල්ගස්වල අනවසර ඉදිකිරීම්වල වැසිකිලි හදන එක මම RDA එකට කියල නැවැත්තුවා.

**ගරු මන්ත්‍රිනී කේ. කේ. අයි. නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමනි, මම ස්තුතියක් කරන්න ඕන. මොකද මම ගිය සභාවාරෙ කතා කළා. CTB බස් රථය නියමිත වෙලාවට ධාවනය නොවන බවත්, නාගොඩින් පාසල් ළමුන් ගන්නෙ නැතුව ධාවනය කරන එකත් පිළිබඳව. ඒ පිළිබඳව මෙම ආයතනයෙන් අදාල ස්ථානවලට ලිපි යොමු කරලා මටත් පිටපතක් හම්බ වුනා. ඒ ගැන මම ස්තුතිය පළ කරනවා.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා, ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. ප්‍රථමයෙන්ම ගරු සභාපතිතුමනි, අපි ඉල්ලූ පරිදි මත්ද්‍රව්‍ය සම්බන්ධව ඔබතුමන් අපට නැවත ලිපියක් එවලා තිබුනා. මම ඔබතුමාට ප්‍රථමයෙන්ම ස්තුතිය පුදකරනවා. ඒ වගේම කුඹුස්ස පාලමේ පැති බැම්ම ඉදිකිරීම දැන් කරගෙන යනවා. ඒ සම්බන්ධව ඔබතුමාට ස්තූති වන්ත වෙනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අපට ශෝකජනක අවස්ථාවක් වුනා. අප ප්‍රදේශයේ ගොරොක්ගස්තුඩුව කොටසේ අවුරුදු 12 ක මල් කැකුලක් ඉබේම පරවෙලා ගියා. ඒ පරවෙන්න හේතුව මේ ජලභීතිකා රෝගය. ඒ දරුවා ඉගෙනුම ලැබුවෙ සිරිසුනන්ද මහා විද්‍යාලයේ හත වසරේ. ඒ වගේම දරුවෙක් මටත් ඉන්නවා. අවුරුදු 12 යි. මට මතකයි එදා වසන්ත කුමාර මන්ත්‍රීතුමා ගෙනාවා යෝජනාවක්. මේ අයාලේ යන ගවයන් සහ බල්ලන් ගැන. ඒක නිකන් සමච්චලේකට ගණන් ගත්තෙ. එදා ඒ පියවරේදි සෞඛ්‍ය දෙපාර්තමේන්තුව දැනුවත් කළානම්, ඒ දේ ඇත්තටම වෙන්නෙ නැහැ. මම හිතන්නෙ මේ සභාවෙන් ඒ දේ කෙරුනෙ නැහැ. ඇත්තටම මේ සභාවට තමයි ඒක අයිතිය තියෙන්නෙ. ඒ දරුවන්ගෙ වගකීම තියෙන්නෙ අපේ සභාවට. සභාවට කරන්න තියෙන්නෙ ඒ සම්බන්ධව ලිපියක් සෞඛ්‍ය මධ්‍යස්ථානවලට යවන්න. නැත්නම් PHI මහත්වරු දැනුවත් කරන්න ඕන. එහෙම කෙරිල නැහැ.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා මම ඔබතුමාට බාධා කරනවා නෙවෙයි. අපි සියලුම PHI මහත්වරු සහ අදාල ආයතන කලින් ඉදලම දැනුවත් කරල තියෙන්නෙ.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

PHI මහත්වරු මේ ගැන කිසිම ක්‍රියාමාර්ගයක් ගත්තෙ නැහැ ඒ දරුවා ඇත්තටම මගේ දරුවෙක් වගේ. ඇත්තටම ක්‍රීඩාවලට ඉතාම දක්ෂයි. අපේ විදුහල්පතිතුමත් දන්නවා ඇති. උඩුගම කලාපෙන් තරග කරල පළමු වෙනි ස්ථානයට ලගා වුනේ. ඒ වගේ දරුවෙක් තමයි අපට නැති වුනේ. ඒ වගේම සියලු පොදු කටයුතුවලට ඇත්තටම පුදුමාකාර වෙහෙසක් දරපු දරුවෙක්. ඒ පවුලට හිටපු එකම පිරිමි දරුවා. ගෑනු ළමයි දෙන්නයි. එක දරුවයි. ඒ දරුවගෙ රෝගය අඳුර ගන්න ලැබුනෙ. අපේ පැත්තෙ

තියෙන දංගොඩේ පන්සලේ වැලි හලන්න ගිහින් තියෙනවා. වැලි හලන්න ගියහම, මේ දරුවට තුනටියේ අමාරුව හැදුනා. තුනටියෙ අමාරුව හැදිලා උඩුගම ඉස්පිරිතාලෙට ගෙනිහින් තියෙනවා. දවසක් තියන් ඉදල තියෙනවා. ඒ දරුවට කිසිම ප්‍රතිකාරයක් වෙලා නැහැ. ස්කෑන් යන්ත්‍රයක් නැහැ කියලා, නැවත කරාපිටියට යවලා තියෙනවා. කරාපිටියෙදි මේ ලෙඩේ හඳුනගන්න බැරි වුනා. අර නර්ස් නෝනලා වතුර එකක් එහෙම අරගෙන යනකොට මේ දරුවා හැංගිලා තියෙනවා. හැංගිලා ඒ පාර ඇඳන්යට යන්න වෙලා තියෙනවා. එහෙම තමයි දොස්තර මහත්වරු අඳුරගෙන තියෙන්නෙ ලෙඩේ. ඒ පාර ඒ දරුවගෙන් අහල තියෙනව පුතේ ඔයාලගෙ ගෙදර පූසො ඉන්නවද, බල්ලො ඉන්නවද කියලා. එහෙම ඇහුවයින් පස්සෙ තමයි කියල තියෙන්නෙ. මම මාසෙකට විතර කලින් බල්ලෙක් හීරුවයි කියලා. මාපලගම ටවුන් එකේදි තමයි වෙලා තියෙන්නෙ. ඒකට ඇත්තටම අපිත් වග කියන්න ඕන. ඒ කියන්නෙ අපේ  සභාපතිතුමා කියන කතාව ඇත්ත වෙන්න පුලුවන්. නමුත් ඒක අපේ වගකීමක්. ඒ දෙමව්පියො කියනවා අපිත් එහෙම දැනුවත් වීමක් වුනේ නැහැ කියලා. දොස්තර මහත්තය ඇහුවම තමයි කිව්වයි කියල කියන්නෙ. අපි පත්තරෙත් දැක්ක හේමපාල මහත්තය ලියල තිබුනා. නමුත් අන්න ඒ ටික තමයි වුනේ.

ඒ වගේම තවත් කාරණයක් තියෙනවා. ගරු සභාපතිතුමනි, අපේ ආයතනයේ කැබ් රථයක් යොදාගෙන පාර්ලිමේන්තු මන්ත්‍රී සම්පත් මන්ත්‍රීතුමාට ස්තූති කිරීම සම්බන්ධයෙන්, ඔබතුමාට බලයක් ඇති එහෙම යවන්න. නමුත් මම අහන්නෙ  ඒක සුදුසුද?  අපේ ගම වටේම ප්‍රචාරය ගියා. අපි ගන්න හාල් ටිකෙන් එහෙම නැත්නම් සීනි ඇටෙන් පරිප්පු ටිකෙන් තමයි මේ බදු මුදල් ගෙවන්නෙ. මෙහේ සේවකයෙක් යොදාගෙන ගම වටේ ප්‍රචාරය යන්න බැහැනෙ.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමනි, මම ඕකටත් උත්තරයක් දෙන්නම්. වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන්ගේ, සෞභාග්‍යයේ දැක්ම යටතේ ගමතුල සාකච්ඡා වටයක් පැවැත්වීම සඳහා සියලු දෙනාටම කැදවීමට තමයි ප්‍රචාරය ගියෙ. අපේ ප්‍රාදේශීය සභාවෙ මම සභාපති හැටියට මේවා කරේ. ස්තූති කිරීමත් එකක් මම යැව්වෙ මෙන්න මේ කට්ටිය කැදවන්න කියලා.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

අපෙන් ගම්වාසීන් අහනවා. ඇයි මේ මොකක්ද කරන්නෙ කියලා. සුදු මහත්තයලයි ගෙදර රැස්වීමක් තියෙනවා. ඒ පාර අනිත් පැත්තෙන් දියවර ගම්මානෙ තියෙනවා. අන්න එහෙම එක එක තැන්වලට රැස්වෙනවයි, ඔය ගොල්ලොත් රැස් වෙන්න කියලා. ඇත්තටම එහෙම කරන්න අවශ්‍යතාවයක් නැහැ. අපට එහෙම වෘත්තියක් නැතුව වෙනම යන්න පුලුවන්. ඇත්තටම ඒක සුදුසුද කියල තමයි ගරු සභාවෙන් මම අහන්නෙ.

**ගරු සභාපතිතුමා**

සභාපති හැටියට මම වගකීම ගන්නවා.  සුදුසු නිසා මම ඒක කළා.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගම්වාසීන් අපෙන් අහනවා ඇයි මේ මෙහෙම කරන්නෙ කියලා. අපට වීථි ලාම්පුවක් ඉල්ලුවම, වීථි ලාම්පුව දෙන්නෙ නැහැ. මේක ඇත්තටම අපරාදයක්නෙ. අපේ සභාවෙන්, අපිත් මේකට වග කියන්න ඕන. ඒ ගම්මුන් අහන්නෙ මේ වගේ දේවල් නැත්නම්, අපට බෝක්කුවක් දෙන්න. එහෙම නැත්නම් ඒ සල්ලිවල එක්කො වීථි ලාම්පුවක් දෙන්න බැරිද කියලා? අපේ ප්‍රදේශයේ මාරාන්තික ස්ථානයක් තියෙනවා. මේ අපේ පියල් මන්ත්‍රීතුමත් දන්නවා. දලුවාහනෙත් යනවා. අශෝක මහත්තයලගෙ ගේ ලගට ඒ වීථි ලාම්පුව තවම වැටුනෙ නැහැ. ඇත්තටම. කරුවලේ ඇවිල්ලා, මේ

ඊයෙ පෙරේදත් දෙන්නෙක් ඇක්සිඩන්ට් වුනා. ඒ වගේ ස්ථානවලට වීජී ලාම්පු ලැබෙන්නෙ නැහැ. ඇත්තටම අන්න ඒකයි අපට කණගාටු.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, උඩුගම පොළේ මැහි තියෙනවා. ඒ මැහි යට තණ කොල වැවිලා තියෙනවා. උඩ එලවලු ටික දාගෙන විකුණනවා. නමුත් යටින් සර්පයෙක් ඇවිල්ල කැවත් දන්නෙ නැහැ. මොනව වුනාද කියල දන්නෙ නැහැ. අර ජල භීතිකාව වගේ තමයි ඒකත් වෙන්නෙ. දැන් ගිහින් බලන්න මේ පොටෝ තියෙනව අරගෙන. ඒ පැත්තෙ ඉන්න අපේ මන්ත්‍රීතුමන්ලා දන්නව ඇති. තනිකරම කැලේ වැවිල තියෙන්නෙ. ඇත්තටම කණගාටුයි අන්න ඒව කම්කරුවො යොදවලා කරන්න. දැන් මැෂින් හතරක් ගන්න ඕනලු. අලුත්වැඩියා කරන්න ඕනලු. අන්න ඒවයින් ඒ වගේ දේවල් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, ඔය ගස් කැපීමෙදි අපේ ධනංජය මන්ත්‍රීතුමා කිව්වා. දරුවන්ට හානියක් කියල අපිට ඕන නැහැ කිව්වා. ඒක නෙවෙයි ඇත්ත කතාව. මේ අපේ මානව සම්පතක් බේර ගන්න ඕන. ගහකින් අනතුරක් වෙනවනම්, සභාපතිතුමා අනතුරෙයි කියල පවසනවනම්, ඒකනෙ කෙරෙන්න ඕන. මේ දරුවො තමයි අපි බේර ගන්න ඕන. දරුවො නැත්නම් අපි මොකටද මේ මෙතනට ඇවිත් මොනද මේ කතා කරන්නෙ. අපි මානව සම්පත බේර ගන්න ඕන. ඇත්තටම එහෙම කතා කිරීමත් මට කණගාටුයි. මම කියන්න කැමතියි සභාපතිතුමනි, අපේ වැඩිහිටි සමිතියක් මාපලගම තියෙනවා. ඒකෙත් මේ වගේම ප්‍රශ්න තියෙනව. මම කතා කළේ නැහැ ඒ ගැන. ඒ කියන්නෙ එතන වැට අයිනෙ තමයි ගස් ටික තියෙන්නෙ. අපේ ගයාන් මන්ත්‍රීතුමත් දන්නවා. ඒ ටිකත් ඔන්න ඔය වගේම ප්‍රශ්නයක් ඇදිල තියෙන්නෙ. ඒ කියන්නෙ මෙතුමා කලින් කියල තියෙනවා. ගස් කපල අයින් කරන්න කියලා. නමුත් දැන් කියනවලු ගහ බාගෙට කපල අයින් කරන්න කියලා. අර සමන් මන්ත්‍රීතුමාලගෙ ප්‍රශ්නෙම වගේම තමයි. එතන වෙල තියෙන්නෙ. එක තීරණයක් ගන්න. මෙතනදි ඇත්තටම ගස් කපන්න ඕනනම් එහෙම ගන්න. පනතෙ තියෙනවා. එහෙම කරන්න පුලුවන් කියලා. මම බැලූ හැටියටනම් මම දන්නෙ නැහැ වෙනත් විදිහක් අනිත් එක තමයි ගරු සභාපතිතුමනි, මෙතන අපි කාලය ගන්නව වැඩියි. අර පනතෙම තියෙනවා ඔබතුමා යෝජනාවක් ඉදිරිපත් කළාට පස්සෙ මන්ත්‍රීවරුන්ට අයිතියක් නැහැ එවලෙ කතා කරන්න. මම පැහැදිලි කිරීමක් කරල දුන්නෙ. මෙහෙම වගන්තියක් තියෙනව කියලා. වෙනත් කරුණු යටතෙ තමයි එහෙම කතා කරන්න පුලුවන් ඇත්තටම අපේ සභාවෙ රීති තියෙනවනම් ඒ විදිහට තමයි අපි කටයුතු කරන්න ඕන. කකුලුවො තමයි මෙතන ඉන්නෙ. අන්න ඒකයි අපි මේ හදන්න හදන්නෙ. කතා කරනකොට හිතන්න. අපි මේ කතා කරන්නෙ ගරු සභාවක. එතුමා කියපු කතාව ගැලපෙන්නෙ නැහැ. අපි මෙතන සද්භාවයෙන් වැඩකටයුතු කරමු කියල ඉල්ලමින් මින් අපේ සියලු වැඩකටයුතු ඉදිරියට කරගෙන යැමට සියලු ශක්තිය ධෛර්යය ලැබේවායි කියල ප්‍රාර්ථනා කරමින් මා නිහඩ වෙනවා.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. මුලින්ම ගස සම්බන්ධව කතා කරන්නම්. නාගොඩ ප්‍රාදේශීය සභාවෙ මන්ත්‍රීවරයෙක් විදිහටවත්, එහෙම නැත්නම් මේ දේශපාලන බලය හසුරවන කෙනෙක් විදිහටවත් එහෙම නැත්නම් නාගොඩ ප්‍රාදේශීය සභාවෙ මේකට බලපෑමක් කරන පුද්ගලයෙක් විදිහට නෙවෙයි මම ගහ කපන තැනට ගියේ. මේ රටේ පුරවැසියෙක් විදිහට. යම්කිසි රාජ්‍ය ආයතනයක් හෝ යම්කිසි රාජ්‍ය නිලධාරියෙක් යම්කිසි වැරදි තීන්දුවක් තීරණයක් ගන්නවනම්, ඒ පිළිබඳ සොයා බලලා ක්‍රියාත්මක වෙන්න. මම හිතන්නෙ මේ රටේ පුරවැසියෙක් විදිහට අයිතියක් තියෙනවා. අන්න ඒ පදනමින් තමයි මම කටයුතු කලේ. මමත් ඔය පැත්තෙ ගියහම පොඩිකාලෙ ඉඳලා ඔය දූරියන් ගහේ දූරියන් මමත් කාල තියෙනවා. සමන් මන්ත්‍රීතුමාත් එක්ක ඒ දවස්වල සම්බන්ධතාවයක් නැහැ. දැන්නම් සමන් මන්ත්‍රීතුමාලහ ගියාම තමයි දූරියන් කන්නෙ. ඒ දවස්වල

මම සමන් මන්ත්‍රීතුමා අඳුනන්නෙ නැහැ. නමුත් මගේ ඥාති පිරිස ඉන්නෙ ඔය කොතලාවල ප්‍රදේශයේ. කොතලාවල ප්‍රදේශයේ ඥාති ගෙවල්වල මම ගියහම ඔය ජුලියන් ගහෙන් මමත් දූරියන් කාලා තියෙනවා. ඉතිං ඒ හිතවත්කමට ඇවිල්ල මට කිව්වා බලන්න, ඔබතුමත් දූරියන් කාපු දූරියන් ගහ කපන්න කියල තියෙනවා. දේශපාලනේ මම දන්නෙ නැහැ. අර ගොල්ලො UNP ද මේ ගොල්ලො ශ්‍රී ලංකාද UNP ද ශ්‍රී ලංකාද කියන්න මම දන්නෙ නැහැ. සභාව මෙන්න මේ විදිහට වැරදි තීරණයක් අරගෙන තියෙනවා. අනේ බලන්න මේ ගහෙන් කිසිම හානියක් නැහැ. මේ ගෙදරට මේ කියන විදිහට කිසිම හානියක් වෙන්නෙ නැහැ. මෙච්චර කල් හානියක් වුනෙත් නැහැ. ඒ අයත් මේ ගහේ ගෙඩි අහුලගෙන විකුණ ගත්තා. අපිත් විකුණ ගත්තා. මගේ තමයි ගහ. නමුත් මෙන්න මේ පහුගිය දවස්වල ආරවුලක් ඇතිවුනා. ඒ ආරවුල එක්ක සභාවට දැනුම් දීල තියෙනවා. සභාවෙ අදාළ නිලධාරිතුමිය ඇවිල්ලා ගහේ අනතුරුදායක අතුටික කපන්න කියල විතරක් කිව්වා. නමුත් ඊට පස්සෙ අපට ලියුමක් එවල තියෙනවා. ගහ සම්පූර්ණ කපන්න කියලා. ඇයි මේ ගහ කපන එකේ තේරුම? ඔබතුමාට පේනවද නැද්ද මේ ගහ කපන එක සාධාරණද නැද්ද කියල මගෙන් ඇහුවා. දැන් මට කියන්න බැහැනෙ මෙහේ ඉදන්. තමුන්නාන්සෙලට කියන්න බැහැ වගේම මම කිව්ව ඒ නිලධාරියා ගත්ත තීරණය හරිද වැරදිද කියල දැන ගන්න නම් මට ඒ ගහ බලන්න යන්න ඕන. ඒක නිසා මාව එතනට එක්ක ගෙන ගියා. එක්කගෙන ගියාට පස්සෙ දැන් ඔබ තමුන්නාන්සෙල මෙතන ඉන්න 27 දෙනාම එතනට ගියත් ඔබ තමුන්නාන්සෙලට පැහැදිලිව පෙනේවි ගහ කපන්න කියල ගත්ත තීරණය සම්පූර්ණ වැරදියි කියලා. මම ඒ වෙලාවෙ කිව්වෙ නැහැ. මේ ගහ කපන්න අවශ්‍යතාවයක් නැහැ. මේකෙන් ළමයෙකුට අනතුරක් වෙනවනම්, ඒ කියන්නෙ ගෙයි ඉදල මීටර් 100 ක් විතර මෙහායින් තමයි ගහ තියෙන්නෙ. ළමයෙකුට අනතුරක් වෙනවනම් ගහේ මිදුල පැත්තට තියෙන අතු ටික කැපුවහම ඇති. ඇත්තටම අතුත් අඩුයි. අතු කිහිපයයි තියෙන්නෙ. මොකද ඒ ගෙඩි වැටුනොත් තමයි ප්‍රශ්නයක් තියෙන්නෙ. නැත්නම් දූරියන් ගස්වල අතු කඩන් වැටෙන්නෙ නැහැ. මේ ගහ කඩන් වැටුනත් කඩන් වැටෙන්නෙ නිවස පැත්තට නෙවෙයි. අනිත් පැත්ට මොකද මේක පල්ලමක තියෙන්නෙ. ගේ තියෙන්නෙ කන්දක. ගේ කන්දක තියේනම් ගහ පල්ලමක හෙලකනම් තියෙන්නෙ ගහ කඩන් වැටෙන්නෙ ගරු සභාපතිතුමනි පල්ලමට. කන්ද පැත්තට ගහ කඩන් වැටෙන්නෙ නැහැ. ඒක හොදාකාරවම පැහැදිලියි. ඉතිං මේක නිලධාරියෙක් රාජ්‍ය ආයතනයක් ගත්ත වැරදි තීරණයක්. එතකොට මට මන්ත්‍රීවරයෙක් විදිහට නෙවෙයි. පුරවැසියෙක් විදිහට අයිතියක් තියෙනවා. ඒ තීරණය ගත්ත ආයතනය ගිහිල්ල මුණ ගැහෙන්න. විශේෂයෙන් ගස් කපන එකට මම විරුද්ධයි. මේ මම දේශපාලනය කරන්න අරන් අවුරුදු දෙකයි. 2018 සිට මේ කාලය තුලට පරිසරය වෙනුවෙන් මගේ දායකත්වය මම උපරිමය දීලා තියෙනවා. මගේ දේශපාලන ජීවිතේ තුල මම පරිසරය වෙනුවෙන් සටන් ගොඩක් කරල තියෙනවා. එතකොට මම හිතන්නෙ මම පරිසරය සම්බන්ධව උනන්දුවෙන කෙනෙක් විදිහට පළවෙනි එක කටුපොල් සම්බන්ධව ඒ වගේම තමුන්නාන්සෙල දන්නවා මේක මම සභාවෙදි කියනවා. ලංකාව පුරාම රැල්ලක් ගියා තාප්පවල චිත්‍ර අදින, මම ඒ පරිසරය ගැන කතා කරද්දි, මම ඒ කරපු සටහන නිසා ඒ ලංකාව පුරා ගියපු ඒ රැල්ලෙ පළවෙනි ආරම්භය තිබ්බෙ මමෙයි කියල මම මේ මං ගැන පුරාජේරු කියනවා නෙවෙයි. මමෙයි කියන එක මම සභාවෙ ප්‍රකාශ කරනවා. මෙච්චර කල් මම ඒක ප්‍රසිද්ධියෙ ප්‍රකාශ කලේ නැහැ. මමෙයි කියන එක මම කියනවා. නරාවල පාලම තමුන්නාන්සෙල දන්නවා. ගාල්ල මාපලගම පාරෙ මා ඇතුලු සුරකිමු පරිසරය සේව් නේචර් ටීම් බොල් මමත් එක්ක ආරම්භ කරපු මේ අන්තර් ජාලය හරහා ෆේස් බුක් හරහා එකතු වුනු තරුණයො පිරිසක් එක්ක ආරම්භ කරපු, මම අවසර අරගෙන ඒ කටයුතු සිද්ද කලේ. මම හරියටම චිත්‍ර ඇද ඇද ඉන්න කොට තමයි බෝම්බ ගැහුවෙ. ඒ පළවෙනි පරිසරය සම්බන්ධව ලංකාව පුරා රැල්ලක් විදිහට යන්න කියල මම ඒක ඒවෙලාවෙ ප්‍රකාශ කළා. ඒකත් එක්ක මේක රට පුරා රැල්ලක් බවට පත්වුනා. මම දන්නෙ නැහැ ඒක මොන හේතුවක් නිසාද කියලා. නමුත් ඒක මම කියනවා මම හිත්ද රැල්ලක් පටන් ගත්තයි කියල මම කියන්නෙ නැහැ. නමුත් ඒක තමයි පළවෙනි ආරම්භය. ගාල්ල දිස්ත්‍රික්කයෙ අපි ආරම්භ කරපු පළවෙනි බිත්ති චිත්‍ර ඒ

කියන්නෙ පරිසරය සුද්ද කරලා, පෝස්ටර් ව්‍යාපාරයට එරෙහිව පෝස්ටර් අලවන්න එපා. පෝස්ටර් අපට එපා කියන ඒ තේමාවත් එක්ක අපි ආරම්භ කළේ. මම කියන එක ඔබ තමුන්නාන්සෙලට මතක් කර දෙනවා. මොකද මේ පරිසරය වෙනුවෙන් ක්‍රියාත්මක වෙනව කියන එකට මට පොඩි කින්ඩියක් දැම්මනෙ මම ඒක මතක් කරන්න ඕන. එතකොට ගහක් කපනවනම්, රාජ්‍ය ආයතනයක් වැරදි තීරණයක් ගන්නවනම්, නිලධාරියෙක් වැරදි තීරණයක් ගන්නවනම්, මන්ත්‍රීවරයෙක් විදිහට නෙවෙයි මේ රටේ පුරවැසියෙක් විදිහට ඒ වෙනුවෙන් එරෙහි වෙන්න මම දෙපාරක් හිතන්නෙ නැහැ. ඒක ගාල්ලෙද මාපලගමද හෝමදොලද උඩුගමද නාගොඩද බද්දෙගමද මට අදාන නැහැ. මේ රටේ කොතනක වුනත් එදා විල්පත්තුවෙ වන සංහාරයට එරෙහිව අපි පෙළ ගැහුනා. ඒකෙ ප්‍රතිඵලයක් විදිහට තමයි සේව් නේචර් ටීම් ගොල් අපි ආරම්භ කළේ. එක කොතලාවලද නාගොඩද මාපලගමද විල්පත්තුවෙද පුරවැසියෙක් විදිහට මට කරන්න පුලුවන් දෙයක් තියෙනවනම්, ඒ වෙනුවෙන් ඕනම සටනක් කරන්න සූදානම් කියන එක මේ අවස්ථාවෙදි සභාවෙදි ප්‍රකාශයට පත් කරන්න ඕන.

ඊට පස්සෙ ගරු සභාපතිතුමනි, ගොම සම්බන්ධව සම්බන්ධීකරණ කමිටුවෙදි අපි තීරණයක් ගත්තා. ගොම ගෙන ඒම සම්බන්ධව මේ වන තෙක් ක්‍රියාත්මක වෙලා නැහැ. සමාවෙන්න මට තව පොඩි මතක් කිරීමක් කරන්න ඕන. අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා තර්කයක් ඉදිරිපත් කළා. මොකක්ද මේ ළමයින්ගෙ ආරක්ෂාව සම්බන්ධව, ගරු මන්ත්‍රීතුමනි, මම කිව්වෙ මේ සිද්ධිය සම්බන්ධව, මේ ගෙදර ළමයි පාරට එන එක ආරක්ෂා කර ගන්න ඕන සභාව නෙවෙයි. ළමයි ආරක්ෂිතව ඒ ගෙදර දෙමාපියන් තමයි රැක ගන්න ඕන. ළමයි පාරට එන එකත් මේ හැම ගෙදරකම ළමයෙක් පාරට එන එක සභාව විදිහට ආරක්ෂා කරන්න ගියොත් අපිට වෙන වැඩක් කරන්න හම්බ වෙන්නෙ නැහැ. ළමය යන්නෙ කොහෙද ළමය කන්නෙ බොන්නෙ කොහොමද ළමයා පාරට එනවද එහෙම නැත්නම් ගෙදර ගේ ඇතුලෙ ඉන්නවද කියල හොයල බලන්න ඕන අපි නෙවෙයි. ගරු මන්ත්‍රීතුමනි, මේක සරල දෙයක්. ගරු මන්ත්‍රීතුමා මේ ගහ සම්බන්ධවයි ප්‍රශ්නෙ තියෙන්නෙ. නැතුව සභාවට ළමයින්ගෙ ආරක්ෂාව සම්බන්ධ නැහැ කියන පනතෙ තියෙන කතන්දරේ නෙවෙයි මේක. මේක හොඳට පැහැදිලි කරනවනම්, මේ සිද්ධිය සම්බන්ධ මේ සිද්ධියට ළමයගෙ ආරක්ෂාවට කිසිම සම්බන්ධතාවයක් නැහැ කියන එකයි මට මේ ගහ කපන එකට කිසිම සම්බන්ධතාවයක් නැහැ කියන එකයි මට ප්‍රකාශ කරන්න අවස්ථාව ලැබුනෙ. ඔබතුමන්ලගෙ අර නායකයො එදා ඉදල වපුරන බොරුව වපුරන විදිහටම ඔබතුමත් මේ නාගොඩ ප්‍රාදේශීය සභාවෙ හැසිරීම ගැන මම ඉතාමත් ලැජ්ජාවට සහ කණගාටුවට පත්වෙනවයි කියන එක මේ අවස්ථාවෙදි ඒ සම්බන්ධව ප්‍රකාශ කරන්න ඕන.

ගරු සභාපතිතුමනි, ගොම ගෙන ඒම සම්බන්ධව කටුපොල් තහනම තියෙද්දිත්, මේ පෙරේදා තලංගහ වතුයායේ කටුපොල් ඉන්දීමක් සිදු වුනා. ජනාධිපතිතුමා විශේෂයෙන් ප්‍රකාශ කරල තිබුනා. ජනාධිපතිතුමා කියන ප්‍රකාශන චක්‍රලේඛ සේ සලකන්න කියලා. නමුත් මේ පෙරේදත් ඒක සිද්ද වුනා. වතු අධිකාරීවරයට මම කතා කරලා දැඩිසේ දෝෂාරෝපනය කළා. ඒ අවස්ථාවෙදි ඒක නතර කරන්න කටයුතු කළා. නමුත් ඒ ඉන්දපු ගස්ටික තවම තියෙනවා. ඒ සම්බන්ධව කිසිදු පියවරක් අරගෙන නැහැ. මාධ්‍යවේදී මහත්වරු ඉන්නවනම්, මම හිතනවා මේ පිළිබඳ සටහන් කරාවි. මොකද ජනාධිපතිවරයගෙ තීරණයක් අභියෝගයට ලක් කරන්න හැකියාවක් කිසිදු වතු සමාගමකට නැහැ.

ඒ වගේම අලුත් වත්ත මංසන්දියේ තියෙන අනවසර ඉදිකිරීම්, ඒ වගේම උඩුගම රෝහල දෙපස තියෙන අනවසර ඉදිකිරීම් ඇතුලු උඩුගම තියෙන අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට මම හිතන්නෙ මේ වෙන කොට කටයුතු කරල තියෙනවා. විශේෂයෙන්ම පහුගිය ආණ්ඩුව සමයේ අලුත්වත්ත මංසන්දියේ දේශපාලනය උපයෝගී කරගෙන ඉදිකරපු ඒ ගොඩනැගිල්ල, මම හිතන්නෙ ඒක වහාම ඉවත් කළ යුතුයි. මොකද පහුගිය 07 වෙනිදා වෙන කොට මේක ඉවත් කරන්න කියලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දැනුම් දීල තියෙනවා. නමුත් මේ වන තෙක් කිසිදු ඉවත් කිරීමක් සිදු කරල

නැහැ. මට ආරංචියි යම්කිසි දේශපාලන බලවේග මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙනවා. මේක නැවත ක්‍රියාත්මක කරන්න. මෙන්න මේ දේවල් සම්බන්ධයෙන් සාධාරණය කරන්න කියන එක මම ඉතාමත්ම ඕනෑකමින් ඉල්ලනවා. මේක මේ පහුගිය ආණ්ඩුවෙන් පටන් ගත්තද? මේ ආණ්ඩුවෙන් පටන් ගත්තද? කියන එක නෙවෙයි වැදගත්. මේවා රාජ්‍ය දේපොළ. මේ රාජ්‍ය දේපොළ පහුගිය ආණ්ඩුවෙන් හරි, මේ ආණ්ඩුවෙන් හරි වැරදි විදිහට යොදා ගන්නව නම් මන්ත්‍රීවරු විදිහට මම නම් ඒ වෙනුවෙන් විරුද්ධව පෙනී සිටිනවයි කියන එක ප්‍රකාශ කරන්න ඕන. වහාම මේ අලුත්වත්ත මංසන්දියෙ තියෙන මේ කඩ පේලිය ඉවත් කරලා, ඒක සභාවට පවරා ගන්න කටයුතු කරන්න කියලා මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ අනවසර ඉදිකිරීම් ඉවත් කරන්න. මොකද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ඒ දැනුම් දීම කරලා තියෙනවා. මේක සභාවට පවර ගන්න කිසිම දේශපාලන බලපෑමකට යටත් වෙන්න එපා වහාම මේක ඉවත් කරන්න කටයුතු කරන්න කියලා මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම තමයි රෝහල් කමිටුව මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට, ප්‍රාදේශීය සභාවට, පොලීසියට දැනුම් දීලා ඇති. නමුත් ක්‍රියාත්මක වීම සිදු වෙන්නෙ නැහැ. ඒ බලතල ඔබතුමා සතුව තියෙනවා. ඒ සම්බන්ධව වහාම ක්‍රියාත්මක වෙන්න කියල ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, බණ්ඩාරනායකපුර විදුහල වසා දැම්මා. උප සභාපතිතුමාගෙන් අවසර ඉල්ලනවා මම ඒ ගැන කතා කරන්න. උප සභාපතිතුමා සාක්ෂි දරාවි. බණ්ඩාරනායකපුර පාසල අද ඒ ගොඩනැගිල්ල සහ ඉඩම කිසිම ඵල ප්‍රයෝජනයක් නැතුව, මේ වෙනකොට තියෙනවා. විශේෂයෙන් ගමේ තරුණයන් ඉල්ලීමක් කරනවා. ක්‍රීඩා පිටිය වට කරලා, පිට්ටනියත් එක්ක ක්‍රීඩා පිටියත් එක්ක මේ ගොඩනැගිල්ල සහ මේ සංකීර්ණය ගත්තා. අද වෙනකම් කිසිම දෙයක් කෙරෙන්නෙ නැහැ. තරුණයන් එක්ක සම්බන්ධ වෙන කෙනෙක් විදිහට ගමේ තරුණයන් විශේෂයෙන්ම මගෙන් ඉල්ලා සිටිනවා. ක්‍රීඩා කරන්න මේ ක්‍රීඩා පිටිය නිදහස් කරලා, සභාවට පවර ගන්න කියලා.

**ගරු සභාපතිතුමා**

මේ වෙන ගංවතුර වෙලාවෙ ආපු, නාවික හමුදා අනු කණ්ඩයක් ඉන්නවා. පිට්ටනියෙ නෙවෙයි අර ශාලාවෙ ඉන්නෙ. අපි කියන්නෙ පිට්ටනිය ගමේ සභාවට පවරගෙන, ගමේ තරුණයන්ට සෙල්ලම් කරන්න අවස්ථාව දෙන්න. තරුණයො ගිහිල්ල සෙල්ලම් කරනවා. නමුත් සංවර්ධනයක් කරන්නවත්, කිසිම දෙයක් කරන්නවත්, අපට මුදල් යොදවන්නවත්, එහෙම දෙයක් කර ගන්න බැහැ. මොකද මේක තියෙන්නෙ සභාව සතුව නෙවෙයි. මේක තියෙන්නෙ අර ගොඩනැගිල්ලත් සම්බන්ධවම. ඒක නිසා මේක ප්‍රාදේශීය ලේකම්ට අයිතිය තියෙන්නෙ. ඒක නිසා මම ප්‍රාදේශීය ලේකම් මුන ගැසුනම, ප්‍රාදේශීය ලේකම් කියල තියෙනවා. මේක සභාවෙදි ඉල්ලීම කරන්න කියලා. මට ඊයෙ තමයි දැනුම් දුන්නෙ. මෙය සභාවට පවර ගන්න කියලා මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ප්‍රාදේශීය ලේකම් එකගයි සභාවට පවරන්න. ළමයින්ට සෙල්ලම් කරන්න ක්රීඩා පිටියවත් අරන් දෙන්න කියන එක තමයි යෝජනාව. මැනුමක් කරලා, සභාවට පවර ගන්න. සභාවට සමුපූර්ණ ගොඩනැගිලි ගන්න බැරිනම්, මැදිහත් කරගෙන ඒක වෙන ආයතනයකට ලබා දීලා, ක්‍රීඩා පිටිය අපට ලබා ගන්න කටයුතු කරන්න. මොකද විශාල තරුණයන් පිරිසක් ඒකෙ සෙල්ලම් කරනවා. ගමේ මිනිස්සුන්ට විශාල සම්පතක්. ඒ පිළිබඳව ඔබතුමාගේ දැඩි අවධානය යොමු කරන්න කියලා, ඉල්ලා සිටිනවා.

ඒ වගේම ඔබතුමා කිව්වා සල්ලි ඇවිල්ලා තියෙනවා කියලා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. පළවෙනි ඉල්ලීම, මම දන්නෙ නැහැ ඔබතුමා මන්ත්‍රීවරුන්ට සල්ලි දෙයිද නැද්ද කියන්න. හැබැයි ඔබතුමාට මෙහෙම දෙයක් කරන්න පුලුවන්. මම මේ පුංචි ඉල්ලීමක් කරන්නෙ පක්ෂ විපක්ෂ භේදයකින් තොරව, කොට්ඨාස 15 ක් තියෙනවා. ඒ කොට්ඨාස 15 ට ලබා දෙන්න. මේ මාර්ග ටික

ඉස්සෙල්ලම දෙන්න. ඊට පස්සෙ මාර්ග ටික නඩත්තු කරන්න. ඔබතුමාට පුලුවන් එක ජේසීබී යන්ත්‍රයක් අරගෙන, අපි සම්බන්ධ කරගෙන කරන්න බැරිනම්, ඔබතුමාගෙ මැදිහත් වීමෙන්, සභාවෙ මැදිහත් වීමෙන්, ජේසීබී රථය එක වසමකට, එක කොට්ඨාසයකට, දින කීපයක් දෙන්න. ඒ කොට්ඨාසෙ සම්පූර්ණ මාර්ග ටික සුද්ද කර ගන්න මෝටර් ගේඩරයක් හෝ ජේසීබී රථයක් දෙන්න. ඊට පස්සෙ එක කොට්ඨාසයකට සම්පූර්ණ දෙන්න එකින් එක පටන් ගන්න. එක කොට්ඨාසෙක සම්පූර්ණ ලයිට් ටික දාන්න, සම්පූර්ණ එක සතියක් හෝ දෙකක් ඒ කොට්ඨාසෙ සමුපූර්ණ වැඩකටයුතු ටික ඉවර කරන්න ඒ ප්‍රතිපාදන යොදන්න. මන්ත්‍රීවරු විදිහට අපිට තියෙන ලොකුම ප්‍රශ්නෙ මාර්ග සුද්ද කරන්නෙ නැහැ. ලයිට් නැහැ. හැකි ඉක්මනින් මේ අද ඉදල ඉදිරි මාස දෙක, තුන ඇතුලත මෙන්න මේ කටයුතු කරන්න. ඔබතුමාට සල්ලි ඇවිල්ල තියෙනවා. වෙනද ඔබතුමා කියන්නෙ මට ලයිට් දාන්න සල්ලි නැහැ. මට පාර සුද්ද කරන්න සල්ලි නැහැ. දැන් කම්කරුවො නැහැ. කම්කරුවො නැත්නම් ගරු සභාපතිතුමනි, මොටර් ගේඩරයක් ගන්න. කොට්ඨාසෙකට පැය ගණනක් දීලා, ජේසීබී එකක් දෙන්න. සම්පූර්ණ පාරවල් ටික සුද්ද කරගෙන එනකොට, ලයිට් ටික දාන්න. ඊට පස්සෙ මේ ටික නඩත්තු කරගෙන යන්න. මම ප්‍රාදේශිය සභාවට ඇවිත් අවුරුදු දෙකයි. මේ සමස්ථ නාගොඩ ප්‍රාදේශීය සභාවෙ පාරවල් ටික සුද්ද වුනේ නැහැ.

ඒ වගේම තමයි ක්‍රීඩාපිටි ගැන කතා කරන්න ඕන. මම දැනගන්න කැමතියි. ගරු සභාපතිතුමනි, ප්‍රාදේශීය සභා මට්ටමින් සියලුම ක්‍රීඩා පිටි සංවර්ධනය කරලා සුද්ද කරලා ලබා දෙන්න කියලා ජනාධිපතිතුමා තීරණයක් එවල තියෙනවද?

**ගරු සභාපතිතුමා**

අපට ඇවිල්ල නැහැ

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

මම දැක්කා එහෙම යෝජනාවක් අන්තර්ජාලයේ සැරිසරනවා. මම ඒ පිළිබඳව තමයි මම දැනුවත් වෙලා නැත්තෙ. මොකද අපට ගෝනදෙනිය ක්‍රීඩා පිටිය උඩුගම මහජන ක්‍රීඩා පිටිය මේ වෙනකොට වල් බිහිවෙලා.

**ගරු සභාපතිතුමා**

ලොකු පිට්ටනියක් හැටියට සංවර්ධනය කරල දෙන්න ක්‍රීඩා පිටියක් නම් කරල එවන්න කියල තියෙනවා. මාපලගම ක්‍රීඩාපිටිය නම්කරලා යවලා තියෙනවා.එහෙම නැතුව මේ තියෙන ක්‍රීඩා පිටි සංවර්ධනය කරන්න සල්ලි යොදවන්න කියල ඉල්ලීමක් කරල නැහැ.

මම හිතන්නෙ නාමල් රාජපක්ෂ ඇමතිතුමාගෙ අදහසක් තියෙනවා. මම දැක්කා පත්තරවල ලිඛිතව. මොනවත් අපට සභාවලට දැනුම් දීල නැහැ.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ගරු සභාපතිතුමනි, නමුත් අපට වගකීමක් තියෙනවා. ප්‍රාදේශීය සභාවට අයිති පිට්ටනි ටික ගෙවීමක් කරලා ඒ ටික කරනවා. උඩුගම මහජන ක්‍රීඩාංගනය උඩුගම සතිපොළ මේ ආව තෙක් මෑත ඉතිහාසයේ කවදාවත් සුද්ද කිරීමක් සිදු වුනේ නැහැ. ඇත්ත සේවකයන් නොමැති කමේ ප්‍රායෝගික ගැටලුවක් තියෙනවා. මම නැවතත් ඉල්ලා සිටිනවා. ඒ සම්බන්ධ යන්ත්‍ර සූත්‍ර හෝ වෙනත් ක්‍රමවේදයක් අනුගමනය කරලා පුද්ගලික හරි, ටෙන්ඩර් කරල හරි කමක් නැහැ. මේ ක්‍රීඩා පිටිය සහ පොළ සුද්ද කරලා ලබා දෙන්න. උඩුගම මිනිස්සු සතිපතා යන තැනක් මේ ක්‍රීඩා පිටිය සහ පොළ. මේ සති පොළ ක්‍රමවත් කරල දෙන්න කියලා මම විශේෂයෙන් ඉල්ලා සිටිනවා. උඩුගම විදිහට නෙවෙයි. මේ ක්‍රීඩා පිටිය සකස් කරල දෙන්න. ඊට පස්සෙ ගෝනදෙනිය ක්‍රීඩා පිටිය සුද්ද කරල

දෙන්න. දැන් මේ වෙනකොට මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සිදු කරන නිසා, මම වැඩි උනන්දුවක් කළේ නැහැ. මාර්ගයේ ලයිට් කනු එහෙමත් ගෙනැත් දාල තියෙනවා. නමුත් මාර්ගයේ සංවර්ධන කටයුතු සිදු වෙන නිසා අපි ඒ සම්බන්ධව වැඩි විරෝදයක් දැක්වුවෙ නැහැ. මොකද මාර්ග සංවර්ධන කටයුතු වෙනුවෙන් ඒ දේ සම්බන්ධ වන නිසා

ඒ වගේම අර උඩුගම ඩිපෝව අසල අපේ සභාවට අයිති ඉඩමේ අනවසරෙන් ගස් වගයක් කැපුවා. ඒ සම්බන්ධව සිද්ද වුනේ මොකක්ද කියලා. ගරු සභාපතිතුමනි, මම දැන ගන්න කැමතියි අපෙන් ඒ සම්බන්ධව පරීක්ෂණයක් වුනාද?

**ගරු සභාපතිතුමා**

ඔව් ඔව් උඩුගම ඩිපෝ එක අසල තියෙන සභාව සතුයි කියන ඉඩමේ පිට්ටනියේ පසුගිය දවස්වල ගහක් කපලා තිබුනා. ඒ පිළිබඳ වෙරංග මන්ත්‍රීතුමා මට දුරකතනයෙන් දැනුම් දුන්නට පස්සෙ, මම එතුමාට කිව්වා. විස්තරේ මොකක්ද කියලා, ගිහිල්ලා බලන්න කිව්වා. ගස් දෙකක්ද කොහෙද කපලයි කිව්වා. නමුත් එක මුලයි අපි දැක්කෙ. මම එතුමාට කිව්වා පොලීසියෙ පැමිණිල්ලක් දාන්න. විස්තරෙත් හොයන්න කියලා. පස්සෙ හවස මම ගිහිල්ලා බලන කොට උඩ ඉඩම සුද්ද කරලා, පස්සෙ හොයාගෙන යද්දි මුල් දෙකක් තියෙනවයි කිව්වා. එක මුලයි මට හොයා ගන්න පුලුවන් වුනේ. එක ගහයි කපල තියෙන්නෙ. මාර ගහක් අතු තියෙනවා. කඳ නැහැ. පස්සෙ මම ඩිපෝ එකට ගිහිල්ලා, මැනේජර් හම්බ වෙලා කතා කළා. මම කිව්වා මෙහෙම දෙයක් වෙලා තියෙනවා කියලා. ඔහු කිව්වා නැත කියලා. මම කිව්වා ගිහිල්ල බලන්න කියලා. ඊට පස්සෙ ඉඩම පිළිබඳව ලොකු විස්තරයක් කිව්වා. ඉඩම අක්කර පහමාරක්, පිට්ටනියත් අපේ සභාවට අයිති නැහැ කියලා. සභාවට දීල නැහැ. ඉඩම අපේ කියලා කිව්වා. මම කිව්වා ඒක මට අදාල නැහැ. අපි භුක්ති වින්දා. අපි මුදල් වැය කරලා පිට්ටනියෙ යම් යම් දේවල් කරල තියෙනවා. කරුණාකර ගහ කපපු කෙනා කියන්න අඩු තරමින් කඳන් ටික හරි ගෙනැත් දාන්න කියල මම කිව්වා. එයාල දන්නෙ නැහැ කිව්වා. ඊට පස්සෙ මම පොලීසියට ගිහිල්ල පැමිණිල්ලක් දැම්මා. දැන් පැමිණිල්ල ක්‍රියාත්මක වෙමින් යනවා.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

බොහොම ස්තූතියි මට එහෙමම දැනගන්න ඕන අර අලුත්වත්තෙ කඩ සම්බන්ධව ඔබතුමා පරීක්ෂා කිරීමක් කළාද අලුත්වත්ත හන්දියෙ තියෙන අනවසර ඉදිකිරීම් ඔබතුමා එතනට ගියාද ඒ සම්බන්ධව ඔබතුමාගෙ තීරණය සහ ඔබතුමාගෙ දැක්ම මොකක්ද කියලත් දැන ගන්න ඕන. මට අලුත්වත්ත හන්දියෙ අනවසර ඉදිකිරීම් තියෙනවා ඔබතුමා සම්බන්ධ වුනාද අලුත්වත්ත හන්දියෙ තියෙන අනවසර ඉදිකිරීම් ඔබතුමා දැනුවත් වුනාද

**ගරු සභාපතිතුමා**

ඔව් අලුත්වත්ත හන්දියෙ තියෙන අනවසර ඉදිකිරීම් බලන්න මම පසුගිය දිනක ගියා. ඒ පුද්ගලයට එන්න කිව්වා. ඔහු ආවෙ නැහැ. මම අජිත් මන්ත්‍රීතුමත් එක්ක මෙහේ එන ගමන් ඒ පැත්තෙන් ආවා. මම එයාට කිව්වා මෙන්න මේවා අනවසර. දිසාපතිතුමියත් අපිට දැනුම් දුන්නා. එයාට නඩුදාල තියෙනවා. ඉවත් කරන්න කියලා. මම කිව්වා ඉතිං මේක අනවසරයි. ඉවත් කිරීම් කටයුතු කරගන්න කියලා. මොකද එයාල ඒකෙන් බල ප්‍රදේශයට තියෙන ප්‍රයෝජන ගොඩක් විස්තර කිව්වා. මම කිව්වා ඒකට මට කරන්න දෙයක් නැහැ. ඒක හොඳයි නමුත් අපට නීත්‍යානුකූලව පවරල දෙන්න බැහැ. අපෙන් වෙළඳ බලපත්‍රය ඉල්ලුවා. ඒක නීත්‍යානුකූලව අපට දෙන්න බැහැ.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ඊට පස්සෙ ගරු සභාපතිතුමනි අපි දකිනවා මෙන්න මේක මේ ප්‍රසිද්දියෙ කියන්න වුනාට සමා වෙන්න දැන් මාස ගණනක් තිස්සෙ අර උඩුගම ටවුන් එකේ අපේ ලොරිය ඇදල දාල තියෙනවා. මොකද ඒක මිනිස්සු දකිනවා. බෙලිඅත්තෙ එලවළු ගේන්න ගිහිපු ලොරිය ලක්ෂ තුනක එලවළු ගෙනැල්ලා, ලක්ෂ හතරක රෙපෙයාර් එකක් තියෙනවා. ඒක ගැටලුවක් නැහැ. ගරු සභාපතිතුමනි, හැකි ඉක්මනින් ඒ ලොරිය එතන පෙනි පෙනි තියෙන කොට අපටත් නිකන් කනේ පාරක් වදිනව වගේ. තරංග මන්ත්‍රීතුමා ඔබතුමත් දන්නවා. නිතර තෙමෙන කොට දිරනවා. මම හිතන්නෙ ඔහොම තෙමි තෙමි මාස කිහිපයක් තිබුනොතින් ලොරියෙ අපට ගේන්න වෙන්නෙ වැසියයි. ඉතුරු ටික ගෙනැල්ල ඉවර වෙලා, යකඩවලට වෙන්දේසි කරන්න තමයි ගරු සභාපතිතුමනි වෙන්නෙ. දැන් මුදල් තියෙනවා කියල ඔබතුමා කිව්වා. ඒක නිසා හැකි ඉක්මනින් ඒ ලොරි රථ ටික ඇතුලු අනෙකුත් සභාව සතු වාහන ටික හදලා, නඩත්තු කරන්න ඒ වියදම යොදන්න. මොකද මේ සම්පත් ටිකත් නැති වුනෝතින්, අපේ සභාව මම හිතන්නෙ බංකොලොත් තත්වයට පත් වේවි. අපේ ප්‍රදේශවාසීන්ට සේවය සලසන්න බැරි වේවි. ඒ පිළිබඳ ඔබතුමාගේ දැඩි අවදානය යොමු කරන්න කියලා කියනවා.

නැවතත් ආන්දෝලනාත්මක සිද්දියක් වුනා. මමත් සම්බන්ධ වෙච්ච නිසා කතා කරනවා. නැවත අවසන් වශයෙන් මම ඒක කියන්නම් මෙන්න මේකයි සිද්ද වුනේ. ගහ සම්බන්ධව තීරණයක් ගත්තා. නාගොඩ ප්‍රාදේශීය සභාවේ නිලධාරි වරයෙක් ඒ තීරණය වැරදි බව අපි දැක්කා. මම ගිහිල්ලා ඒ තීරණය වැරදි බව පෙන්නලා දුන්නා. ඒ තීරණය වැරදියි කියන එක සභාපතිතුමත්, අපේ කොට්ඨාසෙ මන්ත්‍රීතුමත්, පිළිගත්තා. එතුමන්ලගෙ කතාදෙකෙන්ම ඊට පස්සෙ ඒ තීරණය නැවත සභාපතිතුමා ගිහිල්ල නිවැරදි කළා. ඒ නිවැරදි කරපු එකට එරෙහිව පෙත්සමක් ගිහිල්ලා තියෙනවා. මෙන්න මේකයි සරලව සභාවෙ නිලධාරියෙක් වැරදි තීරණයක් ගත්තා. ඒක මම සභාවට පෙන්නල දුන්නා. සභාපතිතුමා ඒක නිවැරදි කළා. නිවැරදි කළාට පස්සෙ තමයි ඒ නිවැරදි කිරීම සම්බන්ධව තමයි අභියෝගාත්මක කරල තියෙන්නෙ. එහෙම නැතුව මේක මේ සභාපතිතුමාවත් මමවත් ඒක දේශපාලන ප්‍රශ්නයක් නිසාවත් ගිහිල්ලා, ඒක පක්ෂග්‍රාහී වෙලා ගත්ත තීන්දුවක්. අනිත් පැත්ත හැරවීමක් නෙවෙයි සිදු වුනේ. මම නැවත වරක් කියනවා සභාවෙ නිලධාරියෙක් වැරදි තීරණයක් ගත්තා. වැරදි තීරණය අපි දැක්කා. සභාපතිතුමා නිවැරදි කළා. නිවැරදි කිරීම තමයි අභයෝග කරල තියෙන්නෙ. ඒක මේ ගරු සභාව සරලව මේදේ තේරුම් ගන්න ඕන.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා, නිලධාරිතුමිය වැරදි තීරණයක් ගත්තෙ නැහැ. නිලධාරිතුමිය ගත්ත තීරණය සාධාරණයි. මම අර කිව්වෙ කෙනෙක් මොහොතකට හරි මරණීය දණ්ඩනය ලැබුවට පස්සෙ, එයා ඇපිල් කරනවා. ඊට පස්සෙ එයාට ජීවිතාන්තය දක්වා සිර දඩුවම් හෝ නැත්නම් නිදොස් කොට නිදහස් කරනවා. ගරු මන්ත්‍රීතුමා, ඇත්ත කතාව අපේ ප්‍රාදේශීය සභාවෙ මේ සම්බන්ධව කටයුතු කරන කාන්තා නිලධාරිනියක් ඉන්නවා. ඇත්තටම මම දන්නෙ නැහැ මේ ගස් සම්බන්ධව කටයුතු කරන විට එතුමිය කොහොම මානසිකව වැටිලද කියලා. මොකද මම පුදුම විදිහට මානසිකව වැටිල ඉන්නවා. සමහර වෙලාවට මගේ ආත්මෙත් පාව දීල තියෙනවා. මොකද මේ දෙගොල්ලක්ගෙ තියෙන අසමගිය නිසා තමන් පෞද්ගලිකව රංඩු සරුවල් වුනාම මේ අවුරුදු 30 හ 40 හ තියෙන ගහ ක්ෂණිකව පැය දෙකෙන් තුනෙන් අනතුරුදායක බව පේනවා. ගරු මන්ත්‍රීතුමා, මම හදවතින් ප්‍රකම්පා වෙනවා. මම සාධාරනය කරන්න ගිහිල්ල මාව පාව දීල තියෙනවා. ඒකයි මම කිව්වෙ එක එක අයගෙ කටයුතු නිසා අපේ සභාවෙ මනත්‍රීවරු හැල්ලු වෙනවා. අපිව හැල්ලු වෙනවා. මේ හැම කෙනාම හිතන්නෙ සභාවට හැම දේම කරන්න පුලුවන් කියලා. අන්න එතන සාධාරනව හිතන්න ඕන. මනුස්සකමට මම හැම තැනදිම කටයුතු කළේ. මටත් හරි දුකයි. එදා තමයි මම එතනට ගියෙත්, දැක්කෙත්. අපි සේරම සාධාරණීකරණය කරගෙන යමු.

ගරු සභාපතිතුමනි, අපි අධිකරණයෙදි තීන්දුවක් දෙනවා. අපි හිතමු මහාධිකරණයෙදි මහාධිකරණය තීන්දුවක් දුන්නට පස්සෙ, මහාධිකරණ තීන්දුව අපි අභියෝග කරන්නෙ, මහාධිකරණයෙදි නෙවෙයි. අභියාචනාධිකරණයෙදි හෝ ශ්‍රේෂ්ඨාධිකරණයෙදි. හැබැයි අපි අභියාචනාධිකරණයෙදි අභියෝග කරන තීන්දුව, මහාධිකරණෙ කෙනා ගත්ත තීණ්දුව වැරදි නිසා තමයි අභියාචනාධිකරණයෙදි ඒක නිවැරදි කරන්නෙ. මහාධිකරණ තීන්දුව නිවැරදි නම්, අභියාචනාධිකරණයෙදි නැවත එම තීන්දුවම තමයි හම්බ වෙන්නෙ. නැවත පුලුවන් අපට අභියාචනාධිකරණ තීන්දුව ශ්‍රේෂ්ඨාධි කරණයෙදි අභියෝගයට ලක් කරන්න. හැබැයි අභියාචනාධිකරණ තීන්දුව හරිනම් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කවදාවත් ඒ තීන්දුව වැරදියට දෙන්නෙ නැහැ. එම තීන්දුවම තමයි දෙන්නෙ. හැබැයි අභියාචනාධිකරණයෙදි ගත්ත තීන්දුව වැරදි නිසා තමයි ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නැවත ඒ තීන්දුව වෙනස් කරන්නෙ. එතකොට දැන් මට පුලුවන් පුරවැසියෙක් විදිහට රාජ්‍ය නිලධාරියෙක් ගත්ත තීරණයක් ඉස්සෙල්ලම ඔබතුමාට ඉදිරිපත් කරන්න. ඊට පස්සෙ මට පුලුවන් එතනින් ඉදිරියට අවශ්‍යනම් අධිකරණයට වුනත් ගෙනියන්න. එහෙම වුනොත් මේ තීන්දුව ඔබතුමත් යම් සභාවෙ මන්ත්‍රීවරු ගියත් සාධාරණව, මම මේ යම්කිසි දේශපාලන පක්ෂයක්වත් අරගෙන නෙවේ. ගහ අනතුරුදායකනම් කවදාවත් ඔබතුමාට ඇවිල්ලා කියන්නෙ නැහැ. ඒ ගෙට අනතුරුදායකනම් ඒ ගෙට මේ ගහෙන් යම්කිසි හානියක් වෙනවනම්, මම කවදාවත් කිසිම මනුස්සයෙකුට, යූඑන්පීද ශ්‍රීලංකාද ජේවීපීද අසාධාරණයක් වෙන්න දෙන්නෙ නැහැ. සභාපතිතුමනි, එහෙම දෙයක් වෙන්නෙ නැති නිසා එහෙම වෙන්නෙ ගහ කැපුවොත්. ඒක නිසා ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවටම කියන්නෙ මේ ගහ කපන එක අසාධාරණ නිසා තමයි මම ඉදිරිපත් වුනේ. ඒකට විරුද්ධව එහෙම නැතුව මම එයාගෙ දේශපානයවත් මෙයාගෙ දේශපාලනයවත් මම අදාල කරගන්නෙත් නැහැ. ගරු උප සභාපතිතුමනි, ගරු සභාපතිතුමනි, නිලධාරි වැරදි තීන්දු ගන්නවනම්, අපි මොකක්ද ගන්න පියවර? සභාවෙ මන්ත්‍රීවරු විදිහට නෙවෙයි.මම ඒක බැලුවා. මම ඒක දැනුවත් කළා. සභාපතිතුමා දැනුවත් කළා. සභාපතිතුමා එතනට ගියා. සභාපතිතුමා නැවත තීන්දුවක් ලිඛිතව දුන්නා. එහෙනම් මම නැවත කියනවා. මම නැවත ඉල්ලා සිටිනවා. ඒ නිලධාරියට වඩා ඉහල නිලධාරියෙක් යවලා, මේ ගහ කපන එක සාධාරණද කියලා පරීක්ෂණයක් කරන්.න ඒ ගහ කැපුවොතින් අධිකරණ ක්‍රියාමාර්ග ගන්න මම නැවත ඉල්ලා සිටින.වා නැවත පරීක්ෂණයක් කරන්. ඒ ගහ කපන එක සාධාරණද අසාධාරණද කියලා, ඒ පරීක්ෂණ වාර්තාව සභාවට ඉදිරිපත් කරලා, තීරණයක් ගන්න. නිලධාරියෙක් වැරදි තීරණයක් ගත්තොත් කට පියාගෙන ඉන්න ඕනද?

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා දැන් ඔබතුමාගෙ කතාව අවසන් කරන්න

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ඔබතුමාගෙ දේශපාලනය වපුරන්න ලැස්ති වෙන්න එපා බොහොම ස්තූතියි අවසන් කරනවා.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

සභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, මම ප්‍රථමයෙන්ම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරන්න කැමතියි. මම හිතන්නෙ අද දවසම දූරියන් ගහට ගිහිල්ල ඉවරයි. ඒක මම හිතන්නෙ මම ඔබතුමා අපහසුතාවයට පත් කරන්න අහන ප්‍රශ්නයක්

නෙවෙයි. ඔබතුමාම කියනවා නිලධාරියා වැරදි නැහැ කියලා. මම මේකෙ ඉන්න නිලධාරි කාටවත් චෝදනා කරන්නෙ නැහැ. ගරු සභාපතිතුමනි, නිලධාරින්ගෙ රාජකාරිය හරියට කරල ඇති. ඔබතුමා කියනවා ධනංජය මන්ත්‍රීතුමාගෙ ප්‍රශ්නෙදි නිලධාරිය වැරැද්දක් කරල නැහැ කියලා. නමුත් ඒ වැරැද්ද කරල නැත්නම් ඔබතුමා එතනට ගිහිල්ල තීරණය කරනවා. දූරියන් ගහ කපන්න එපා කියලා. එතකොට මම අහන ප්‍රශ්නෙ තමයි, ඒ දූරියන් ගහ දුර තියෙන නිසා දූරියන් ගහ නොකැපුවට ප්‍රශනයක් නැහැ. අතුටික අයින් කරන්න ඕන. නමුත් නිලධාරී වැරදියි. නැත්නම් එතකොට ඔබතුමාද වැරැද්ද කරල තියෙන්නෙ. එතකොට ඔබතුමාද ගහ කපන්න කියල දීපු තීන්දුව එපා කියල තියෙන්නෙ.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා වටහා ගැනීමේ වරදක්. මට කරන්න දෙයක් නැහැ. මම කිව්වෙ නිලධාරීතුමියට දොස් කියන්න එපා. නිලධාරීතුමිය වැරදි නැහැ. ඒකෙ වැරැද්දක් තියෙනවද කියලා බලන්න. අපි ගියා ඒකෙදි තීරණ තුනක් ගන්න පුලුවන්. ගහ කපන්න මුලින් කපන්න පුළුවන්, නැත්නම් අතු ඉති, ගෙඩි ඉවත් කරන්න පුළුවන්, එහෙමත් නැත්නම් ගහ ඇද බැද තබන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

ගරු සභාපතිතුමනි, ඒ ගන්න තීන්දුව ගැන නිලධාරී දැනුවත් කරන්න. ඒවගේම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්නෙ, තීන්දුවක් ගන්නවනම්, හරි තීන්දුවක් ගන්න කියලා නිලධාරී දැනුවත් කරන්න. මම ඊට වඩා ඒක කතා කරන්න යන්නෙ නැහැ. මගේ කොට්ඨාසෙ ප්‍රශ්නයක්. පක්ෂ බේදයක් නැතුව මම මෙතනට ආවෙ. මට යූඑන්පී මිනිස්සුත් ඡන්දෙ දුන්නා. ජේවීපී මිනිස්සුත් ඡන්දෙ දුන්නා. පොහොට්ටුද ශ්‍රී ලංකාද හැමෝම මට ඡන්දෙ දීල තමයි මම මෙතනට එව්වෙ. මට කට පියාගෙන ඉන්න බැහැ. මගේ කොට්ඨාසෙ ප්‍රශ්නයක් නිසා. මට ඒ දූරියන් ගහේ අයිතිකාරයත් ඕන. අනිත් ගෙදර මිනිස්සුත් මට ඕන. ඒක නිසා ඔබතුමාගෙ වගකීමක්, යුතුකමක් තියෙනවා. කොට්ඨාසෙ මන්ත්‍රීවරය විදිහට මේකට සාධාරණයක් කරන්න කියලා, මෙච්චර කියනවනම්, දූරියන් ගහ කපන එක නෙවෙයි සාධාරණ ඔබතුමාට ගිහිල්ල ඒ අතු ඉවත් කිරීම හරි සාධාරණව කරල දෙන්න කියලා මම ඉල්ලීම කරනවා.

**ගරු සභාපතිතුමා**

ඒ කර්තව්‍යය කෙරෙනවා. දැන් නියෝගය දීල තියෙන්නෙ.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

ගරු සභාපතිතුමනි, අපට තව පුංචි ඉල්ලීමක් කරන්න තියෙනවා. උඩුගම වෙරංග මන්ත්‍රීතුමාගෙන් අවසර ගන්නවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්නෙ. වෙරංග මන්ත්‍රීතුමාගෙ කොට්ඨාසෙ ප්‍රශ්නයක් නිසා වෙරංග මන්ත්‍රීතුමාගෙන් අවසර ගන්නවා. පොදු ප්‍රශ්නයක්. ගරු සභාපතිතුමනි, උඩුගම සති පොළ සඳුදට අපට පොළට යන්න බැරි ප්‍රශ්නයක් වෙලා තියෙනවා. පොළට යන්න බැහැ අඩියක් විතර වතුර. තනිකර වතුරවලක තමයි අපට යන්න වෙන්නෙ. ඒක නිසා ගරු සභාපතිතුමනි, සභාවට මුදලක් පොළෙන් ගන්නවනම්, අපේ යුතුකමක්, වගකීමක් තියෙනවා. පොළ අපට හදල දෙන එක. වෙරංග මන්ත්‍රීතුමාගෙ වසමකට ආපු සල්ලිවලින් ලක්ෂ 10 ක් දාල තමයි පොළ සංවර්ධනය කරන්නෙ. ඒක නිසා සභාවට මුදල් තියෙනවනම්, ඒක කොට්ඨාසෙ ප්‍රශ්නයක් නැහැ. වෙරංග මන්ත්‍රීතුමාගෙ කොට්ඨාසෙ වැඩක් කරනවනම් අපි විරුද්ධ නැහැ. සති පොළ උඩුගම තියෙන සම්පතක්. අපට මිනිස්සුන්ට එහි යන්න බැහැ. මිනිස්සු බනිනවා සභාවෙ මන්ත්‍රීවරුන්ට ලැජ්ජ වෙන්න ඕන කිය.ලා සභාපතිතුමා සඳුද දවසක වහින වෙලාවක පොළට යන්න. ඔබතුමාට මම හිතන්නෙ ප්‍රශ්නයක් නැතුව, එන්න හම්බවෙන එකක් නැහැ. ඒක මේ වෙලාවෙ කියන්න ඕන. අපි

මන්ත්‍රීවරු විදිහට ලැජ්ජ සහගත වෙන්න ඕන. අපට සති පොළට බහින්න බැහැ. අඩියක් විතර වතුරවලවල් ලෑලි උඩින් පැන පැන යන කොට අනිත් මිනිස්සුන්ගෙ ඇගේ ඉහෙනවා. එක නිසා මෙතනට ඇවිල්ල කට පියාගෙන ඉන්න බැහැ. ගරු සභාපතිතුමනි, අපි හැම තැනදිම කිව්වා. අපට මේවට කතා කරන්න අවස්ථාව නොදුන්නොත්, අපි සභාවෙ කතා කරනවයි කියලා. ඒක තමයි ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරන්නෙ ටෙන්ඩර් කරලා, සතිපොළ කාටහරි දුන්නනම්, ඒකට සාධාරණයක් කරන්න. අපට සභාවට මුදලක් එවල තියෙනවා. අපි සභාවෙන් ඒක නඩත්තු කරන්න ඕන. ඒක නිසා අපි තණකොල කපන මැෂින් ගැන කතා කළා. තණකොල කපන මැෂින් ටික හදලා ගේනවයි කිව්වා. මම හිතන්නෙ ඔබතුමා වීථි ලාම්පු ප්‍රශ්නෙ වගේම, මම කතා කරන්න ඕන වීථි ලාම්පුවලට, කොට්ඨාස පිළිවෙලට අපට දින දීල තිබුනා. අපි සභාවට ඇවිල්ලා එකම එක පාරයි පිළිවෙලට ගියේ. උඩුගම ප්‍රදේශයට වීථි ලාම්පු හයි කරන්න යන්නෙ නැහැ. ඊට පස්සෙ අපට කිව්වා කොට්ඨාසවල හැම පාරක්ම සුද්ද කරන්න පිළිවෙලට එවනවයි කියලා දින දුන්නා.

**ගරු සභාපතිතුමා**

අදත් මන්ත්‍රීතුමා උඩුගම වැඩ කරන්නෙ

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

ඉතිං සභාපතිතුමා අපි දැනුවත් කරල කරනවයි කිව්වනෙ. මන්ත්‍රීවරු 27 දෙනාටම ඇහුන් කන් දෙන්න. ඔබතුමාට පීඩනයක් ඇති. අපි දන්නවා. නමුත් තණකොල කපන්න මැෂින් ටික හදල එවන්නම් කිව්වා.

**ගරු සභාපතිතුමා**

අදත් මැෂින් වැඩ කරන්නෙ කොහේද කියල හොයන්න බලන්න

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

සභාපතිතුමා ඒක උත්තරයක් නෙවෙයි. අපේ කොට්ඨාසෙ තියෙන ප්‍රශ්නයක්. මම කියන්නෙ උඩුගම මම දන්නෙ නැහැ තව මන්ත්‍රීවරු 10 ක් 12 ක් විතර ඉන්නවා ඒක නිසා ඒ ගැන සාධාරණය කරන්න.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා පිළිගන්න. දැන් මුදල් එනවා. මේච්චර කල් අපට මුදල් ආවෙ නැහැ. අවුරුදු දෙකක් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තිබුනෙ. අපට පළාත් සභාවෙන් මොනවත් නැහැ. පළාත් සභාවෙ හිටපු ඇමති සත පහක් අපට දුන්නෙ නැහැ. ඊට පස්සෙ ජනාධිපති ගෝඨාභය මහත්තය ආවා. එතුමා ආවට පස්සෙ කොරෝනා වසංගතය ආවා. මේ අවුරුදු තුනට මම මේ හැම එකම මවන්න පුලුවන් පුද්ගලයෙක් නෙවෙයි. මම මේ සත පහක වංචාවක් හොරකමක් නොකර, මම මේ සල්ලි ටික එකතු කරගෙන ඉන්නෙ, යම් දෙයක් කරන්න. අර ලුනු කැවා වගේ කරන්න නෙවෙයි. පොඩ්ඩක් පිළිගන්න. මමත් මනුස්සයෙක්. යතා කාලෙදි ඔය සියලු දේ කරනවා. සල්ලි නැතුව හිටියෙ. දැන් තමයි මේ සල්ලි තියෙන්නෙ. මන්ත්‍රීතුමා අහන්න මේ හිටපු සභාපතිවරු ඉන්නවා. එයාල කොහොමද මේක කළේ කියලා.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

සභාපතිතුමා වංචා කරයි කියලා කියනවා නෙවෙයි. අපි ලොකු දේවල් ඉල්ලන්නෙ නැහැ. අපි ඉල්ලන්නෙ වීථි ලාම්පු ටික දාලා, පාරවල් ටික සුද්ධ කරල දෙන්න කියල විතරයි. සභාපතිතුමා තව මාස 16 ක් විතර තියෙන්නෙ. වෙරංග මන්ත්‍රීතුමාගෙ ලක්ෂ 10 ක් දාන්නෙ නැහැ. සභාවට ඔච්චර සල්ලි එනවනම් ඒක නිසා අපි ඉල්ලන්නෙ වීථි ලාම්පු ටික දාලා, පාරවල් ටික සුද්ද කරලා, දෙන්න කියලා විතරයි. අර සති පොළෙන් එන ගානෙන් සතිපොළ පොඩ්ඩක් කොරිපස් ටිකක් හරි දාලා, වලවල් ටික වහල එහෙම පුංචි දේවල් ටිකක් අපි ඉල්ලන්නෙ. සභාපතිතුමාගෙන් මම ඉතා ගෞරවයෙන් ඉල්ලීමක් කරන්නෙ. සමාවෙන්න මෙහෙම දෙයක් කියන්න වුනාට. අපිට සල්ලි එන්නෙ නැහැ. මුදල් නැහැ. අපට කරන්න විදිහක් නැහැ. මෙතන හිටපු සභාපතිවරු ඉන්නවා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තිබුනෙ. ඒක නිසා අපට කරන්න දෙයක් නැහැ. වීථි ලාම්පු ප්‍රශ්නෙ ඉවර කරල අපට පාරවල් ටික හදලා දෙන්න. මම හිතන්නෙ ඔබතුමා දැඩි තීරණයක ඉන්න බව අපට පේනවා. ඒක නිසා ඉල්ලීමක් කරන්නෙ දූරියන් ගහේ ප්‍රශ්නෙට සාධාරණයක් කරල දෙන්න. ගහ මුලින් ඉවත් කරන්න ඕන නැහැ කියන මතේ ඇති. ඒ නිසා ඒකෙ අතු ටික අයින් කරලා හරි ගරු සභාපතිතුමනි දූරියන් ගහේ ප්‍රශ්නෙට සාධාරණයක් කරන්න. ඔබතුමා අපහසුතාවයෙන් ඉන්න වග ඇත්ත. අපේ ප්‍රශ්න ඔබතුමාට කියනවා ඇරෙන්න, කියන්න වෙන කෙනෙක් නැහැ. ඔබතුමා මොන තීරණයක හිටියත් අපට කියන්න වෙනවා. ඒක නිසා වීථි ලාම්පු ප්‍රශ්නෙ, ඒ වගේම පොළේ ප්‍රශ්නෙ විසඳන්න කියන ගෞරවණීය ඉල්ලීම කරමින්, ප්‍රශ්නයක් මතු වෙච්ච වෙලාවට කොට්ඨාසෙ මන්ත්‍රීවරයාද මොන මන්ත්‍රීවරයාටවත් අසාධාරණයක් නොවෙන තීන්දු පක්ෂ බේදයකින් තොරව ගන්න කියන ගෞරවණීය ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සියලු දෙනාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, මම මීට කලිනුත් අවස්ථා කීපයකදි සභාවට යෝජනාවක් හැටියටත් මලාමුරේ ඇල්ල පිළිබඳව යෝජනා දාලා තියෙනවා. ඔබතුමාට හමුවන අවස්ථාවලත් කිව්වා. ඔබතුමත් එතනට බලන්න ගියා

**ගරු සභාපතිතුමා**

සල්ලි තියෙනවා. අපි ඒක කරමු.

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා**

මලාමුරේ ඇල්ල අන්තර් ජාලය හරහා ලොකු ප්‍රසිද්ධියකට ලක් වෙලා. මම හිතන්නෙ නිවාඩු දිනවල දෙතුන් සීයකට වැඩි පිරිසක් ඒ ස්ථානයට එනවා. ඒ නිසා සභාවට ආදායමක් ලබන්න පුලුවන් විදිහට අපෙන් කෙරෙන්න ඕන යුතුකම, ඒ සංවර්ධන කටයුතු කරලා, ඒ අවශ්‍ය කටයුතු කරන්න කියලා, ඉතා ගෞරවයෙන් ඉල්ලනවා.

ඒ වගේම තමයි, ගරු සභාපතිතුමනි, කැටගොඩ දකුණ එක්සත් මාවත ආරම්භයේ සිට ඉස්කෝලෙ හරියට යනකම් විතර පාරෙ යන්න බැහැ. දෙපැත්තට ඉලුක් වැටිලා, ගමේ මිනිස්සුත් එක්ක කතා කරලා අවස්ථා කිහිපයකදි අපි සුද්ද කර ගත්තා. නමුත් මේ වෙලාවෙ අපට එක වතාවක් හෝ සුද්ද කර ගන්න අපට මැෂින් ටිකත්, කම්කරුවොත් ලබා දෙනවනම් වටිනවා. මොකද හැමදාම මිනිස්සුන්ට කියන්න බැහැ. ඊට එහා ටික පහුගිය දිනක ගම්වාසීන් විසින් පිළිසකර කර ගත්තා. මම හිතන්නෙ ශාන්ත මහත්තයත් ඒක දන්නවා.

ඒ වගේම තමයි, අපේ රංජිත් ජයවීර මන්ත්‍රීතුමා ඉස්සෙල්ල අර පාලම ගැන කිව්වාම, මම හිතුවා බකට් එකක් අදින්නද දන්නැහැ කියලා. ඒක අගය කිරීම පිළිබඳව මම ස්තූතිවන්ත වෙනවා. මම

හිතුවෙ එතන පාර අවහිර වෙලා තියෙන නිසා මොකක් හරි ප්‍රශ්නයක් වෙන්න ඇති කියලා. ඒ වගේම තමයි රංජිත් ජයවීර මන්ත්‍රීතුමා කිව්ව වගේ, මමත් දන්න ඒ වැඩිහිටි සමිතියෙ ඒ ප්‍රශ්නෙට මම කිසිම පිළිතුරක් දෙන්න යන්නෙ නැහැ. මොකද ඒක දෙපැත්තම එක විදිහ ප්‍රශ්නයක් තියෙන්නෙ. එක පාර්ශවයක් සින්නක්කර කියනවා. අනිත් පාර්ශවය කියනවා මේක හදල තියෙන්නෙ එයාලගෙ ඉඩමෙයි කියලා. ඒකට අවසර දුන්නෙ වැඩිහිටි සමිතියෙයි කියනවා. ඒ ප්‍රශ්නයට අපට කිසිසේත්ම මැදිහත් වෙන්න බැහැ. මොකද ඒක ඒ නීතිය අනුව හරියටම ඒකට ක්‍රියාත්මක වෙන්න ඕන. සභාවෙ නිලධාරීන් සහ සභාපතිතුමා අපට මොකුත්ම කියන්න බැහැ. මොකද දෙගොල්ලොම එක වගේ දෙගොල්ලන්ටම එකම ප්‍රශ්නෙ තියෙන්නෙ. කපන්නත් ඕන. නමුත් අනිත් මිනිස්සුත් අමාරුවෙ වැටෙනවා. මම හිතන්නෙ සභාපතිතුමත් ඔය ගැටළුවෙදි හිරවෙලා ඉන්නෙ.

ඒ වගේම තමයි, ගරු සභාපතිතුමනි, විදුලිය පිළිබඳ ප්‍රශ්න, අපේ උඩුගම සමන් මන්ත්‍රීතුමා කිව්වා. එතුමා කියපු නිසා මම කියන්නෙ අපි සභාපතිතුමාගෙ ලගින් ඉන්න නිසා අපේ කොට්ඨාසවල බල්බ් පත්තු වෙනවා. අපට වැඩකරනවා කියලා. මම හිතන්නෙ සමහර වෙලාවට ඇත්තටද විහිලුවටද කොහොමද කියන්න මම දන්නෙ නැහැ. නමුත් ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙ මූණ බලාගෙන වුනත් කියන්න පුලුවන්. මගේ පාරවල් දෙකක් තියෙනවා. තවම සභාව පටන් ගත්ත තෙක් ඒ පාරවල් දෙකට මට බල්බ් එකක් දාන්න යන්න මට පුලුවන් වෙලා නැහැ.

**ගරු සභාපතිතුමා**

පාරවල් දෙක කොහේද මම මේවට උත්තර දෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා**

කොහුලාන මාර්ගය සහ සෝභිත මාවත යන මාර්ගයන් දෙකේ ලයිට් එකක් දාන්න තව වෙනතුරු ගිහිල්ල නැහැ. සභාපතිතුමා අවස්ථා කීපයකදි මම ඒ බව ප්‍රකාශ කළා. සභා වාර්තාවල බලන්න. මීට කලින් ඉල්ලීම් කිහිපයක් කරල ඇති. එතනින් එහාට තවම මට යවා ගන්න බැරි වුනා.

**ගරු සභාපතිතුමා**

විදුලිය හදන්න යවනකොට සියළුම ස්ථාන ආවරණය කරන්න තමයි යවන්නෙ. නමුත් ඔය මාර්ගයන්වල විදුලිය සකස් කළාද, නැත්ද කියන කාරනාව මම දන්නෙ නැහැ. පසුගිය දිනක බංගම පාරෙ මළ ගෙදරක ගියාට පස්සෙ විදුලිය හදන්න අවුරුදු පහකින් ආවෙ නැහැ කිව්වා. මම කිව්වා වෙන්න බැහැ කියලා. සොයා බැලුවම හදලා නැහැ. නමුත් ඒ පැත්තෙ ලයිට් හදන්න ගිහිල්ලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා**

ගරු සභාපතිතුමනි, දැන් අපට ජනතාව ඇහුවම බේරුමට කියන්න දෙයක් ඇත්තෙම නැහැ. ඉතිං ඒ නිසා ඉදිරියෙදි ඒ කටයුතු ජනතාවට සේවයක් කරන්න අවස්ථාව ඔබතුමා මැදිහත් වෙලා ඒ සියලු කටයුතු දායකත්වය දක්වන්න කියලා ඉල්ලනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මම ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ මන්ත්‍රීවරයෙක් විදිහට මේ වෙලාවෙ ඇත්තටම සතුටු වෙන්නෙ නැහැ. ලැජ්ජා වෙනවා. ලැජ්ජ වෙන්නෙ, මොකුත් නෙවෙයි ඔබතුමාල වැරදියට තේරුම් ගන්න එපා. මෙතන ප්‍රශ්නයක් වුනාම, නිතර නිතර අපි හමුවෙන මිනිස්සු. අපිට මේක අපිට හමුවෙලා කතා කරලා, අපට මෙතනට එන්න පුලුවන්. මේ දවස් දෙකෙන් තුනෙන් හමුවෙච්ච අපි මේ මෙතන ඇවිල්ලා සභාපතිතුමාටත්, මේ ඔක්කොම පිරිහෙන විදිහට කතා කරනවා. ගරු සභාපතිතුමනි මම පෞද්ගලිකව ඒකට විරුද්ධයි. අපි කණ්ඩායම් රැස්වීමක් තියනවා.

ඒ දේවල් අපි හමුවුනාම කතා කරගන්න පුලුවන්. ඔක්කොම ඇවිල්ල මෙතනට අත අරිනවා. මෙතන ඒ අවශ්‍ය සංවර්ධන කටයුත්තක් කරන්න මේ ජනතාවට සේවයක් කරන්න කතා කරන්න තියෙන වෙලාව වැඩක් නැති ප්‍රශ්නවලට යොදා ගන්නවා.

ඒ වගේ තමයි ඔය දූරියන් ගහේ ප්‍රශ්නෙත් මම හිතන්නෙ ඔච්චර දුර දිගට ඇදගෙන යන්න දෙයක් නැහැ. ඒකත් මේ වරුවක් තිස්සෙ ඇදගෙන ගියා. මම හිතන්නෙ ගරු සභාපතිතුමනි, ඉදිරියට මේ වගේ කටයුතු නොවෙන්න ඔබතුමා නායකත්වය හැටියට සභාපතිතුමා හැටියට ඔබතුමා ඒ තීන්දු තීරණ අරගෙන මෙතනට ඒ වැඩක් කරන්න පුලුවන් දැක්මක් ඇතුව සභාව පවත් වන්න කටයුතු කරන්න කියලා මම ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. සමහර විට එහෙම මට කියන්න අයිතියක් නැතුව ඇති. නමුත් මම ඉල්ලනවා දිගින් දිගටම ඔබතුමත් අපහසු තාවයට පත් වෙනවා. ඒ පාලකපක්ෂය හැටියට මන්ත්‍රීවරු හැටියට අපිත් අපහසුතාවයට පත්වෙනවා. ගරු සභාපතිතුමනි, මෙතනින් අපි හවස ගෙදර යන කොට ගමේ මිනිස්සු දන්නවා මෙතන කතා වුනේ මොනවද කියලා. ඒ පාර අපෙන් අහනවා සමහර තැන්වලදි ඇත්තටම ලැජ්ජයි. ඒ නිසා ඉදිරියට මේ වගේ වැඩ කටයුතු සිදු නොවෙන්න කටයුතු කරන්න කියලා ඔබතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, මට අත්‍යවශ්‍ය කාරණා කීපයක් සඳහා මෙතනින් පිටවෙලා යන්න අවසර ඉල්ලනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. අද දිනයේ මුලින්ම මම ස්තූතියක් කරන්න ඕන අපි සභාවෙ කතා කරන සමහර දේවල් සිදු කිරීමට යම් උත්සාහයක් අරගෙන තියෙනවා. ඒවා නිවැරදි කරන්න මම වාර දෙක තුනක්ම පහුගිය දවස්වල මම කතා කළා. මට මතකයි ගිය සභාව දවසෙ මම උඩුගම විදුලිය අලුත්වැඩියා නොකිරීම සම්බන්ධව කතා කළාම, ඒ සඳහා අලුතෙන් නිලධාරියෙක් බඳවගෙන තිබුනා. ඊට පහුවදා ඉඳලම උඩුගම ප්‍රදේශයට ඒ විදුලි කටයුතු නිවැරදි කරන්න මම අදහස් කරපු ආකාරයට ඔබතුමා එවල තිබුනා.

ඒ වගේම තමයි, මම පහුගිය සභාවල වාර දෙකක්ම කතා කළා. සෞඛ්‍ය ආරක්ෂිත වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක නොකර සැලුන්වල අධික ලෙස මිල මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන්. ඒ ගැනත් ලිපියක් සභාවෙ ලේකම්ගෙ මාර්ගයෙන් අදාල ආයතනවලට යොමු කරලා තිබුනා. ඒකෙ පිටපතක් අපටත් ලැබුනා. නමුත් ගරු සභාපතිතුමනි, ඒ දෙකම යම් මට්ටමකට ක්‍රියාත්මක කරන්න උත්සහ කරත්, ඒ ගැන පසු විපරමක් කළාද කියලා මම දැනුවත් වෙන්න කැමතියි. මොකද මුලින්ම කියන්න ඕන. මම මුලින්ම කතා කරපු කාරණය විදුලිය සැදීම ගැන මම ගිය සභාවෙදි ඉල්ලා සිටියේ උඩුගම ප්‍රදේශයේ බද්දෙගම පාර, බාර් හන්දියේ සිට ගෝනදෙනිය හරහා නාගොඩට එන මාර්ගය සංවර්ධන කටයුතු සිදුවෙන මාර්ගය හැමදාම කණ්ඩි කපලා, බෝක්කු කඩලා තියෙන මාර්ගයේ ඒ අවදානම ඉවත් කරන්න මාර්ගය දෙපස විදුලිය හදල දෙන්න කියලා තමයි මුලින්ම ඉල්ලා සිටියේ. නමුත් උඩුගම ගාලු පාරෙ තමයි වැඩ කරලා තියෙන්නෙ. මම දැක්කා හවස හය හතටත් වැඩ කරනවා. මේ සභාවෙ නිලධාරි ගිහිල්ලා, මේ අලුතෙන් පත්වුන නිලධාරියත්, රියදුරු කැලුම් මහත්මයත් ඇත්තටම කැපවීමෙන් වැඩ කරන එක ගැන මුලින්ම ස්තූති වන්ත වෙනවා. ඔබතුමා ඒක මෙහෙය වීම ගැනත් ස්තූති වන්ත වෙනවා. නමුත් කෙරෙන්න ඕන නිවැරදි අවශ්‍ය තැනට ඒක යොමු කළානම්, ඊට වඩා ප්‍රයෝජනයක් ගන්න තිබුනා. අපි ඉල්ලා සිටියෙ නාගොඩ පාර, බාර්හන්දියෙන් බද්දෙගම පාර තමයි ඒ අවදානම් ස්ථාන තියෙන්නෙ. ඒක නිසා ඒ ස්ථානවලට මොකද කළේ නැත්තෙ කියලා ඇහුවා. එතකොට තමයි කිව්වෙ බඩු ඉවරයි කියලා. ගාලු පාරෙ වැඩ කරල තිබුනා. නමුත් එවිට මූලික අවශ්‍යතාවය නිවැරදි කරන්න උත්සහයක් කරල නැහැ. මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. පළවෙනි අවස්ථාවෙදිම ඒ මාර්ග සංවර්ධනය කරන ස්ථානයේ ඒ පාර දෙපස නිවැරදි කිරීම් කරලා, විදුලිය සවි කිරීම් ඉතාමත් ඉක්මනින් කරලා දෙන්න කටයුතු කරන්න කියලා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අර සැලුන්වල අධික ලෙස මුදල් අය කිරීම ඒ ආකාරයෙන්ම අද වෙන කොටත් සිදු වෙනවා. ඒ ගැන ලිපියක් යොමු කළාට, එතනින් පස්සෙ ඒක සිදු වුනාද ඒ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු හරි, ඒ අදාල ආයතනයෙන් හරි ගිහිල්ලා, ඒක නිවැරදි කිරීම් කරන්න යම් උත්සහයක් අරගෙන තියෙනවද කියලා පසු විපරමක් කරලා, ඒ සඳහා ක්‍රියාත්මක වෙන්න. නමුත් අද වෙනකොට දැන ගන්න ලැබිල තියෙන දේනම් ඒක වෙන්නෙ නැහැ. මොකද සභාපතිතුමනි, මම පහුගිය දවසක මේ පුද්ගලික උදාහරණයක් කියන්නෙ අපේ තාත්ත හිනිදුම ඉදලා අපේ ගෙදර ආපු වෙලාවෙ මම සැලුන් එකට කොණ්ඩෙ කපන්න එක්කගෙන ගියා. ඒ සැලුන් එක කරන මනුස්සයා හොදටම බීලා කෙලින් ඉන්න බැරි ගානට බීලා එන්න එන්න කිව්වා. මම කිව්වා පස්සෙ එන්නම් දැන් වෙන ගමනක් යන්න තියෙනවයි කියලා. තාත්ත එක්ක ගෙන ගියා. නමුත් මෙච්චර ක්‍රමවේද ක්‍රියාත්මක වෙන මේ වගේ කාලෙකත්, සැලුන් හිමියන් හැසිරෙන්නෙ අන්න ඒ ආකාරයෙන්. වෙනදා රෑට අරක්කු බීල උදේට වැඩ කරන එක වෙනම දෙයක්. දැන් බීලා සැලුන් එකේ වැඩ කරනවා. දැලි පිහියෙනුත් වැඩ කරනවා. ඉතිං ඒ වගේ වෙනද සිගරට් බොන එකා, දැන් බීඩි බොන්නෙ. බීඩි බීලා තමයි මිනිස්සුන්ගෙ ඔලුව අත ගාන්නෙ. මම දන්නෙ නැහැ. මොනම ආරක්ෂිත ක්‍රමවේද තියා මේ දක්වා කරපු ක්‍රමවේදවත් ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. මම කියන්නෙ හැම තැනම නෙවෙයි සමහර තැන්වල. මේක උඩුගම ප්‍රදේශයේ විශේෂයි. ඒ ගැන වහාම නැවතත් සොයා බලා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද මේක සභාවෙ වගකීම නොවුනත්, අපේ ප්‍රදේශය ගැන අපට හොයන්න පුලුවන් අවස්ථාවක් නිසා, ඒ ගැන යම් අධීක්ෂණයක් කරන්න කියලා මම නැවතත් ඉල්ලා සිටිනවා. වැඩිම උඩුගම ප්‍රදේශයේ තමයි මේ ගැටලුව තියෙන්නෙ. උඩුගම සියලුම මන්ත්‍රීවරුන් සහ ප්‍රදේශ වාසීන් වෙනුවෙන් තමයි මම මේ ඉල්ලීම කරන්නෙ.

ඒ වගේම ගරු සභාපතිතුමනි, ජල භීතිකා රෝගය ගැන අපේ රංජිත් ජයවීර මන්ත්‍රීතුමා වෙච්ච සිද්දිය ගැන කතා කළා. මම ඒ ගැන අලුතෙන් කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. නමුත් ගරු සභාපතිතුමනි, මේ කාලය පුරාවටම අපේ බල ප්‍රදේශයේ මේ ගැටලුව හැම තැනම තියෙනවා. ගිය සතියේ මම උඩුගම රෝහලට ගියා. උඩුගම බස් නැවතුම් පොළේදි කොන්දොස්තර මහත්තයෙක්ගෙ කකුල බල්ලෙක් කාලා, බෙහෙත් හතරක් විදලා. යටලමත්තෙ, මාපලගම බල ප්‍රදේශයේ හැම තැනම අයාලෙ යන සුනඛයන්ගෙ ප්‍රශ්නෙ තියෙනවා. මට මතකයි ගිය සභාවෙ වනමල් මන්ත්‍රීතුමා කතා කරපු එක මම වාර්තාවෙ නැවත කියෙව්වා. නමුත් අපි ඒ කතා කරන දේවල් ගැන පොඩි හරි අවධානයක් යොමු කරනව නම් අපට මේක 100% ක් වලක්වන්න බැහැ. නමුත් අපට යම් උත්සහයක් කරනව නම් ඒ ගැන යම් උත්සහයක් හරි කරන්න පුලුවන් තැන තමයි සභාව. ඒ අවස්ථාවන්හි අපේ ක්‍රියාත්මක වීම අඩුබව මම මේ අවස්ථාවෙ ප්‍රකාශ කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අපි හැමදාම කතා කළා කොවිඩ් ප්‍රශ්නෙ ගැන. ඒ වෙළඳ ආයතන සහ ඒ ස්ථානවල නිසි ක්‍රමවේද පාවිච්චි කරන්නෙ නැහ කියලා. මේ රෝගයෙන් වැලකීම සඳහා ක්‍රමවේද අනුගමනය කලේ බැංකු විතරයි. ඇත්තටම අපිවත් මේ රජයවත් මේ සභාවවත් කිසිම කෙනෙක් ක්‍රියාත්මක වුනේ නැහැ. ඒකෙ ප්‍රතිඵලයක් විදිහට තමයි පහුගිය කාලෙ වෙනකොට මහ ජනතාව වැරදි දේ වැරදි ආකාරයෙන් කරලා, අන්තිමට අවසානය වෙන කොට අද සමාජය තුලින් කොවිඩ් රෝගීන් මතු වෙන්න පටන් ගත්තෙ. අපේ ප්‍රදේශවලිනුත් රෝගීන් මතුවෙන්න පටන් අරගෙන තියෙනවා. ඊයෙ වෙනකොට ගාල්ලත් අවදානම් දිස්ත්‍රික්කයක් බවට පත්වෙලා. අපේ බන්දුල මන්ත්‍රීතුමාගෙ බස් එකත්, මාර්ගයත් ඊයෙ රූපවාහිනියෙ පෙන්නලා. ඉතිං මම එතුමට එවලෙම කොල් කරල ඇහුවා. මොකද ඔබතුමාගෙ බස් එකටත් මොකක් හරි ප්‍රශ්නයක් තියෙනවද කියලා. නමුත් ඒ වගේ අහන්න සිදු වෙන්නෙ මේ ප්‍රශ්නෙ තියෙන උග්‍රතාවය නිසා. ඉතිං ඒ වගේ අවදානම් තත්වෙකට අපේ ප්‍රදේශය අද වෙන කොට පත්වෙලා තියෙනවා. හෙට අනිද්ද වෙන කොට මොන වගේ ප්‍රතිඵලයක් ඒද දන්නෙ නැහැ. අපි මේ සභාවෙ මාස දෙකතුනක් කතා කරපුවා ඇත්තටම ක්‍රියාත්මක කරන්න පොඩිහරි උත්සහයක් කළා නම්, අපට යම් ආකාරයකින් අපි ඒක ගැන

ක්‍රියාත්මක වුනා කියල හරි සතුටු වෙන්න පුලුවන්. නමුත් අපි කතා කරපු කිසිම දෙයක් සභාව හරහා කලේ නැහැ. අපි කොවිඩ් වලට කරන්න ඕන නැති දේවල් කළා. අපි එලවළු බෙදුවා. අවශ්‍ය ප්‍රමාණයටත් වඩා වෙන දේවල්වලට මැදිහත් වුනා. නමුත් අපි කරන්නම ඕන දේවල් වලට අපි යොමු වුනේ නැහැ කියල තමයි කණගාටුවෙන් වුනත් මේ අවස්ථාවෙ කියන්න වෙන්නෙ.

ඒ වගේම සභාපතිතුමනි, උඩුගම පොළ ගැන අපේ මන්ත්‍රීතුමන්ලා කීප දෙනෙක්ම කතා කළා. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා සහ බලය තියෙන පක්ෂයේ මන්ත්‍රීවරු. ඉතිං මම ඒ ගැන අමුතුවෙන් කතා කරන්න ඕන නැහැ. සමන් මන්ත්‍රීතුමයි මමයි දවසක් පුද්ගලිකවත් කතා කළා. මමත් හැම සතියකම උඩුගම පොළට යන කෙනෙක් විදිහට දන්නවා. උඩුගම පොළට අඩිය තියන්න බැහැ. මේ පහුගිය වැහි කාලෙ ඇත්තටම ඒක මිහිපිට අපායක්. 2011 වර්ෂයේ මම සභාවට ආපු දවසෙ සිට කතා කරනවා. අපේ විලේගේ සභාපතිතුමයි මමයි එක පාරක් කතා කරපුවා පුවත්පතකත් පළවෙලා තිබුනා. පොටෝ ගහල යම් යම් ක්‍රමවේද කළා. නමුත් අද වෙනකොට සභාවෙන් පොළට සෑහෙන්න වියදම් කරලා තියෙනවා. මේ රටේ මහජන මුදල් වියදම් කරලා, අලුතින් බිල්ඩින් ගහලා, සංවර්ධනය කළාට, ඒ පැත්ත පළාතක නෙවෙයි පොළ ක්‍රියාත්මක වෙන්නෙ. පොළ තියෙන්නෙ පැත්තක. හදපු පොළ පැත්තක. ටයිල් අල්ලලා බිම කැට ගල් අල්ලලා, නමුත් වෙළෙන්දො ඉන්නෙ අර මන්ත්‍රීතුමන්ල කිව්ව වගේ කසල ගොඩේ. ඒව හරියට අස් කරන්නෙ නැහැ වරුසාව කාලෙට අපාය වගේ අඩිය තියන්න බැහැ. ඉතිං ඒ ගැන 2011 ඉදල මේ මන්ත්‍රීවරයෙක් විදිහට අපි මේ කාරණා ඉදිරිපත් කරනවා. මේව ක්‍රියාත්මක වෙන්න, ඒ කාලෙත් යම් මට්ටමක උත්සහයක් ගත්තා. නමුත් අද වෙනකොටත් ඒ උත්සහයක් පමණක් වෙලා තියෙනවා. නමුත් අද තියෙන පහසුකම් වලින් ප්‍රයෝජනයක් ගන්නවනම්, අපට මේ විදිහට කතා කරන්න සිදු වෙන්නෙ නැහැ.

ඒ වගේම ගරු සභාපතිතුමනි, උඩුගම මහජන ක්‍රීඩාංගනය අපේ සහබන්දු මහත්තයා සභාපති කාලෙ අපට මතකයි ක්‍රීඩාංගනය වටේ වැට ඉදි කරලා, ගේට්ටු දාලා, ඒව සම්පූර්ණ කළා. නමුත් මාර්ග සංවර්ධන සිදු වෙන කාලේ, සභාවෙන් ගිහිල්ලා, ඒ ගේට්ටු ගලවගෙන ගියා. ඒ ගේට්ටු දිරුවා. එක එක තැන්වලට අරගෙන ගියා. අද වෙන කොට පිට්ටනියට ගේට්ටුව නැහැ. පිට්ටනිය අනාරක්ෂිතයි. අයාලේ යන ගවයන් ඉන්නවා. වාහන දාලා ඒක විනාශ වෙනවා. නමුත් අපි ඒ හැම දෙයක්ම කතා කරනවා විතරයි. සල්ලි එනවා. සල්ලි අවශ්‍ය දේට යොදවන්නෙ නැහැ. අපි මෙච්චර කල් මේ සභාවෙ හිටියට විශේෂයෙන්ම ඒ අපේ උඩුගම මන්ත්‍රීවරු සියලුම දෙනා වෙනුවෙන් අපේ කණගාටුව ප්‍රකාශ කරනවා. උඩුගම පොළ සහ කීඩා පිටිය ගැන මීට වඩා අවදානයක් යොමු කරන්න කියලා කියනවා. මොකද මේ ගැටලු තියෙන තැන් නෙවෙයි. අපට අයිතිය තියෙන පහසුවෙන් නිරවුල් කරල තියා ගත්ත තැන්. පැහැදිලිවම ඒවා වෙන් කරලා ගේට්ටුදාලා ආරක්ෂිතව කරපු තැන්. එදා තිබුන තත්වෙන් දවසින් දවස අපි පහලට ඇද වැටෙනවා. ක්‍රීඩා පිටිය වටා තණකොල වැවිලා, ක්‍රීඩාගාරෙ කැලෙන් වැහිලා, සමහර වෙලාවට සමාජ මාධ්‍ය ජාලාවල දැම්මට පස්සෙ අපෙනුත් අහනවා. පහුගිය දවස්වල තරුණයො පිරිසක් මගෙනුත් ඇහුව ඔබතුමා ඇයි සභාවට යන්නෙ. ඔබතුමාල මේව ගැන කතා කරන්නෙ නැත්තෙ ඇයි කියලා .ඇත්තටම අපි කතා කරන ඒව දන්නෙ මාධ්‍යයේ ගියොත් විතරයි. මොනව හරි මාධ්‍යයක පළවුනේ නැත්නම් ඔය ගමේ මිනිස්සු දන්නෙ නැහැ. අපි සභාවට ඇවිල්ල කතා කරනවද නැද්ද කියලා. ඒ ඇරෙන්න අපි සභාවෙ පක්ෂ විපක්ෂ වැඩක් නැහැ. අපි කොහොම හරි මන්ත්‍රීවරු විදිහට කවුරුත් එක හඬින් ඉල්ලා සිටිනවා. මේ ගැන ක්‍රියාත්මක වෙන්න කියලා. නමුත් ඒ ගැන ඔබතුමාට මේ දොස් කියනවා නෙවෙයි. ගරු සභාපතිතුමනි, ඔබතුමාට තනියෙන් කරන්න පුලුවන් දෙයකුත් නෙවෙයි. නමුත් හැම කෙනාගෙම ඉල්ලීම මේක නම්, මේවට ප්‍රමුඛතාවය දීලා, ඒව හොයා බලන්න කියලා නැවතත් ඉල්ලා සිටිනවා.

ඒ වගේම සභාපතිතුමනි, මම ගිය සභා වාරෙදි ඉල්ලා සිටියා. මේ සභාවට එන මන්ත්‍රීවරු 27 දෙනාගෙන් සභාපතිතුමා උප සභාපතිතුමා ඇරෙන්න අනෙක් අයට යම් ස්ථානයක් සභාවෙ වෙන් කරල දෙන්න කියලා. මොකද රියදුරු කාමරය හදල දුන්න වගේම මේ 27 දෙනාම බදාද දවසක හරි

සතියෙ දවසක ආවොත්, ඒ එන කොට ගේන තමන්ගෙ ෆයිල් එක හරි තියලා මොනව හරි කෙනෙක් එක්ක ඇවිල්ල හම්බවෙල කතා කරන්න අවශ්‍ය තැනක් වුනොත් ඒකට ස්ථානයක් වෙන් කරන්න. ඇත්තටම අපි නිරන්තරයෙන් සභාවට සතියේ දවස්වල එන අය නෙවෙයි. නමුත් එහෙම ආවොත්, ඒ අයට ඇවිල්ල ඉන්න ස්ථානයක් අඩු ගානෙ පුටුවක්, මේසයක් වත් වෙන් කරල ස්ථානයක් වෙන් කරන්න කියලා 1991 වර්ෂයේ සිට ඉල්ලීම් කරනවා.

**ගරු සභාපතිතුමා**

බිල්ඩිමක් හදන්න වෙන තැනක් නැහැ. ඔබතුමාම කියන්න කොහේ හරි හදන්න ඉඩ තියෙන තැනක්.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමනි පොඩ්ඩක් හිතලා බලලා, අඩුම ගානෙ මේ රැස්වීම් ශාලාව පැවැත්වෙන්නෙ මාසෙට එක දවසයි. අන්න ඒ වගේ ස්ථානයකින් හරි අපි කියන දේ ගැන යම් අවධානයක් යොමු කරලා පොඩි ස්ථානයක්. වෙන්කරන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද රැස්වීම දවසට බැහැ. මන්ත්‍රීවරයෙකුට ගැලපෙන ස්ථානයක්. මොකද මන්ත්‍රීවරු ඇවිල්ලා එක ස්ථානයකින් නැගිටලා, උප සභාපතිතුමාගෙ පුටුවෙ ඉස්සරහ පුටුවෙ ටික වෙලාවකුයි, තවත් ස්ථානයක ටික වෙලාවකුයි, යම් පුද්ගලයෙක් මොනව හරි අවශ්‍යතාවයකට ආවොත්, කෙනෙක් ඉස්සරහ මහජනතාවත් එක්ක කටයුතු කරන මහජන නියෝජිතයන්ට තමන්ගෙ සභාවෙ ස්ථානයක් වෙන් කරන්න. මේක ඉතිහාස ගත වෙන වැඩක්. ඒ නිසා පුලුවන් වැඩ පිළිවෙලක් යොදන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් පුංචි ස්තුතියක් කරන්න ඕන. අපි හැමදාම ඔයිල් ෆාම් සහ වතු සමාගම්වලට බනිනවා. ඒ බනින්න ඕන එකට බනින්න ඕන. අපේ මන්ත්‍රීතුමාල කිව්ව වගේ ගොම ප්‍රශ්නෙ එහෙමමයි. කටුපොල් හිටවන ප්‍රශ්නෙ එහෙමමයි. නමුත් ඒ ගොල්ලන්ගෙ යම් හොඳ වැඩක් කළොත්, ඒකත් අගය කරන්න ඕන. වටවල වතු සමාගම මගින් හගරංවල සභාවෙ පෙරපාසලට යම් වියදමක් කරල පොඩි උත්සවයක් තියලා, පෙරපාසල සංවර්ධනය කරලා ළමයින්ට භාර දුන්නා. ඇත්තටම ඒක විදිමත් විදිහට ඒ ස්ථානයට ගැලපෙන ආකාරයෙන් හොඳම මට්ටමෙන් ඒ කටයුත්ත කරල තියෙනවා. බනින දේට බනින්න ඕන. වැරදි දේ වැරදියි කියනව වගේම, එතුමන්ලා ඒ ආයතනයක් විදිහට වටවල වැවිලි සමාගමේ නාකියාදෙනිය වත්තෙ ළමයි තමයි හගරංවල පෙරපාසලෙ වැඩි හරියක් ඉගෙන ගන්නෙ. ඒ සභාපතිතුමා සහ ඒ පෙරපාසල් ගුරුතුමියගෙ සහ දෙමව්පියන්ගෙ ඉල්ලීම මත ඒක සංවර්ධනය කරල භාර දුන්නා. ඒ කරපු වියදම ගැන අපි ස්තුති වන්ත වෙන්නත් ඕන. ඒ සඳහාත් මම මේක අවස්ථාවක් කර ගන්නවා.

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් මම ඔබතුමාට පුංචි යෝජනාවක් කරනවා. සභාවට මෙපමන මුදලකුත් ආපු වෙලාවෙ, ඔබතුමාගෙ කාලෙ, උඩුගම තියෙන ඇප්තෝප්වත්තෙ තියෙන බංගලාව අපේ උඩුගම මන්ත්‍රීතුමන්ලා මම හිතන්නෙ එකගවෙයි. හිටපු අපේ සභාපතිතුමන්ල දන්නවා. ඇප්තොප් වත්තෙ අපේ පවරා ගත්ත බංගලාවෙ, අපේ සභාවෙ තිබුන පොටෝ එහෙම ගිහින් දාලා තියෙනවා හිස් බංගලාවක්. ඒකට යම් මුදලක් වෙන්කරලා, යම් යම් සමිති තියන්න එහෙම නැත්නම් නිවාඩු නිකේතනයක් විදිහට සකස් කරන්න කියලා යෝජනා කරනවා. අපේ උඩුගම තියෙන සභාවට අයිති නගර ශාලාව බදු දෙනවා වගේ, අපි අම්පාරෙ ගිහිල්ලා, අම්පාරෙ තානායම, අම්පාර නගර සභාවෙන් අපට දුන්නෙ. අපි සල්ලිවලට ගත්තෙ. හිනිදුම කල්වරියට එනවා. උඩුගම එනවා. කන්නෙලියට එන පිටින් එන කෙනෙකුට හරි, ගමේ කෙනෙක්ගෙ සමිතියක් තියන්න. පොඩි උපන්දින උත්සවයක් ගන්න ඒ වගේ එකකට යොදා ගෙන මොනව හරි ක්‍රමවේදයක් ඇති කරලා, ඒ බංගලාවෙන් ප්‍රයෝජනයක් ගන්න ආකාරයට සකස් කරන්න. ඒ කියන්නෙ අපට වුනත් අපේ උත්සවයක් තියන්න පුළුවන්. සභාවට ආදායමක් එන ආකාරයට. ඒක විධිමත් ආකාරයට, භාවිතා කළොත්, ඒකෙන් ප්‍රයෝජනයක් ගන්න පුලුවන්. මේ සභාවට එන මුදලක් වියදම් කරලා, සංවර්ධනය

කරන්න. ඒකත් මම හිතන්නෙ මේ සභාවට ඉතිහාස ගත වෙන වැඩක් වේවි. ඒ සඳහා ඔබතුමාගෙ අවධානය යොමු කරන්න කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මම මුල ඉඳල කියපු ඒ දේවල් ගැන නැවත වතාවක් සලකා බලන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද මේ සමහර දේවල් අපි කිව්වම ඔබතුමාගෙ මූලාසන කතාවෙදි අපි යම් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. මම නම් දැකල නැහැ. මගේ ප්‍රශ්නයක්ද දන්නෙ නැහැ. මම කියන කිසිම දේකට අවසානෙ ඔබතුමාගෙ පිළිතුර. මම ගෙදර ගිහිල්ල හරි බලනවා නැවතත් ඔබතුමා කරපු කතාවෙදි, කවදාවත් මම දැකල නැහැ .මේක මේ වැදගත්ද නැද්ද කියලවත් ක්‍රියාත්මක වෙල තියෙනවා. ඒක නිසා මේකෙ වැදගත් දෙයක් තියෙනවනම්, නැවත සලකා බලලා, ඒ ගැන ඔබතුමාගෙ අවධානය යොමු කරලා, මේ සභාවෙ මන්ත්‍රීවරුන් හා සියලුම දෙනා වෙනුවෙන්, ඒ කටයුතු වලට ඔබතුමාගෙ දායකත්වය මැදිහත්වීම දක්වන්න කියලා, ගෞරවයෙන් ඉල්ලා සිටිමින්, මා නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා**

මූලාසනාරූඪ ගරු සභාපතිතුමාගෙන් අවසරයි. මම පළමුවෙන්ම ඊයේ දිනයෙදි උපන් දිනය සැමරූ අපේ තරංග සුදර්ශන අපේ ආදරණීය මන්ත්‍රීතුමාට මේ සභාව නිවැරදි කරන්නට අපිත් එක්ක චිරාත් කාලයක් නිරෝගීව ඔබතුමන්ට ජීවිතය විඳින්න අවස්ථාව ලැබේවා, සුභ උපන් දිනයක් වේවා කියලා, ප්‍රාර්ථනා කරනවා.

ගරු සභාපතිතුමනි, 2018 අප්‍රේල් මාසෙන් පටන් ගත්තු මේ සභාව අද වෙන කොට අවුරුදු දෙකහමාරක් සම්පූර්ණ වෙලා. මම හිතනවා අපි මේ අවුරුදු දෙකහමාරෙ කාලය පුරාවටම රජයේ ගිණුම් ආපු සල්ලි ප්‍රමාණය බැලුවොත්, එක්කෝටි දහඅට ලක්ෂයක මුදලක් ඇවිල්ලා තියෙනවා. එක්කෝටි දහඅට ලක්ෂයක මුදල දැන් වියදම් වෙලා දැන් එක්කෝටි හත් ලක්ෂය දක්වා අඩුවෙලා තියෙනවා. මේ මුදල ආවෙ මේ අද ඊයෙ නෙවෙයි. මේක 2020 ජනවාරි මාසෙ ඉඳලා අන්තිමටම ආවෙ. 2020.09.22 තමයි ලක්ෂ විසි ගණනක් ඇවිල්ලා තියෙන්නෙ. මේ එකපාර ආපු ලක්ෂ 18 ක් නෙවෙයි. නමුත් අපි හැමදාමත් බලනවා මේ සභා වාර්තාව ගෙදරට ආවට පස්සෙ මේ එන මුදල්වලින් තියෙන නව ව්‍යාපෘති මොනවද කියලා. සභාවෙන් විය යුතු, අපි යෝජනා කරපු ව්‍යාපෘති සඳහා මුදල් යෙදෙව්වද? හැම අවුරුද්දකම අය වැයක් එනවා. අය වැය වලට අපි අවශ්‍ය කරන අපේ ගමේ තියෙන අඩු පාඩු පිළිබඳව අපි ඒ අයවැයට යෝජනා ඉදිරිපත් කරනවා. ඒ අයවැයේ සඳහන් වෙනවා. එතකොට අපි 2019/2020 ට දීපු අයවැයේ තිබූ ක්‍රියාකාරකම් නෙවෙයිද මේ මුදල් වලින් කරන්න ඕන. අපි දකිනවා මුදල් ආවත් මේ සභාවේ කිසිදු ව්‍යාපෘතියක් සඳහා මුදල් වෙන් වෙලා නැහැ. ඉතිං ඒක ලොකු දුර්වලතාවයක් හැටියට මම දකිනවා. මොකද දැන් මාස ගණනකට කලින් උඩුගම ශ්‍රවනාගාරය සඳහා කර්ටන් එකක් දාන්න යෝජනා කරලා තියෙනවා. මේ ඔක්කෝම අපි ගිහිල්ලා හරි ලස්සනට උජාරුවට ඉස්සරහින් වාඩිවෙලා ඉන්නවා. හැමදාමත් උත්සව වලට ගිහිල්ලා දෙන්නෙක් දෙපැත්තෙන් අවිල්ලා තිරය වහනවා. ඉතිං දැන් මාස තුනක්ද හතරක්ද වෙනවා කර්ටන් එක යෝජනා කරලා. නමුත් ශ්‍රවනාගාරයට කර්ටන් එක දාන්න තවම බැරිවෙලා තියෙනවා. මේව අපේ තියෙන අඩුපාඩුකම්.

ඒ වගේම කොඩිකනු වලට මහා ලොකු වියදමක් යන්නෙ නැහැ. ඒ වගේම අද වෙන කොට කැට ගල් 15000 ක් විතර උප කාර්යාලයේ තියෙනවා. ඒ කැට ගල් 15000 න් ගත්ත ප්‍රයෝජනය මොකක්ද? අඩුම ගානෙ පාරකට ඇල්লුවද? පොළකට ඇල්ලුවද? නැහැ සභාපතිතුමනි, මේක මේ පරිපාලනමය දුර්වලතාවය හඳුනාගෙන ඉදිරි අනාගතේදි ශක්තිමත් නිවැරදි කාර්යක්ෂම සභාවක් විදිහට පත් කරන්න ඔබතුමාට බලය තියෙනවා. මේ 26 දෙනාම ඔබතුමා කරන නිවැරදි ඕනම දේකට අත උස්සනවයි කියල මම දන්නවා. මෙතන හිටපු සභාපතිවරු දෙන්නෙක් ඉන්නවා. එතුමන්ලගෙන් ඔබතුමාට ගන්න පුලුවන් ගොඩක් දේවල් තියෙනවා. ඉතිං ඒක නිසා මම අහන්න කැමතියි අපි හැමදාමත් මේ සභාවට සභාවෙ ආදායම් උත්පාදනය කිරීම පිළිබඳව මොනව හරි

ව්‍යාපෘති ඉදිරිපත් කළාද? සභාවෙ ආදායම් උත්පාදනයක් හැටියට මෙන්න මේ අවශ්‍ය දේවල් කරන්න කියලා මම මේ ආපු දවසෙ ඉඳලම යෝජනා කළා. තවමත් මහජන මුදලින් යැපෙන සභාවක් බවට පත්වෙලා තියෙන්නෙ. හැමදාමත් පොළ ටෙන්ඩරයට තවත් වැඩිපුර ගණනක් එකතු කරනවා. එතකොට ඒ කඩකාමර හිමියා ඒක අල්ලන්නෙ අහිංසක මිනිහා ගන්න එළවළු ටිකෙන්. එහෙම නෙවෙයි සභාපතිතුමනි, ආදායම් උත්පාදක වශයෙන් අපි ගතයුතු ක්‍රියාමාර්ගයන් ගැන සාකච්ඡා කරන්න, උත්සහ කරන්න. මේ සභාව තුල අපි මේ ගහක් ගැන කතා කරනවා. මොකක් හරි දෙයක් අරගෙන පැය එකහමාරක් දෙකක් අපි කාලය ගත කිරීමෙන්, මේ අපි 27 දෙනෙක් අද මේ සභාවෙ මාසෙට ඇවිල්ලා, මේ රුපියල් 18000 ක් අරගෙන ගිහිල්ලා, ඔබතුමා නඩත්තු කරන්න ලක්ෂ දෙකහමාරක් තුනක් වැනි මුදලක් මේ ප්‍රාදේශීය සභාව දරද්දි, මම හිතනවා ඒකට සාධාරණයක් මේ සභාව තුල ඉටු වෙලා තියෙනවද කියලා. මේ නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල අපි කණගාටුවට පත් වෙනවා. අපි දුක්වෙන්න ඕන. අපි මන්ත්‍රීවරු හැටියට අපි මෙතන ජ්ලේන්ටියයි කහට එකයි බීලා මාසයක් ගිහිල්ල ඊගාව මාසෙ එන්නෙ මේව දකින්නද? නැහැ. අපිටත් මේ සියලු දෙනාටම වගකීමක් හා යුතුකමක් තියෙනවා. මේ පිළිබඳව ඔබතුමත් එක්ක නිවැරදි මාවතකට මේක ගෙනියන්න. නැතුව ඔබතුමා තනි කරන්නවත්, ඔබතුමා පහලට හෙලන්නවත්, ඔබතුමාගෙ අධිෂ්ඨාණය බිඳ හෙලන්නවත් නෙවෙයි, මම මේ කතා කරන්නෙ. මේක නිවැරදි මාවතකට අපේ ප්‍රාදේශීය සභාව මෙහෙවර සහ දැක්ම අපේ මිනිස්සුන්ට යතාර්ථයක් බවට පත්කරන්නයි. මම මේ කතා කරන්නෙ.

ඔබතුමා දන්නවා. මම ආපු පළවෙනි දවසෙම උඩුගම පොළ වෙනුවෙන් මේ සභාවට යෝජනාවක් දැම්මා. ඒ වෙනුවෙන් මම මහන්සි වුනා. මම මගේ වාහනේ ගිහිල්ලා, ගස් කපාගෙන ඇවිල්ලා, ලනු ගෙනැල්ලා ඒ සියලු කටයුතු කරලා, අන්තිමට පස් නඩුවකුත් දාගෙන, මම පැත්තකට වෙලා ඉන්නවා. මේ වෙනකොට රුපියල් 50000 කට වැඩිය නීතීඥයන්ට ගෙවලා තියෙන්නෙ. මේ වෙන කොටත් මගේ උඩුගම බටහිර කොට්ඨාසෙට ආපු ලක්ෂ 20 න් ලක්ෂ 10 ක් දාලා වැඩ අවසන් කරලා, කඩ කාමර 18 ක් හදල තියෙන්නෙ. අද තව වෙන තුරු මේ සඳහා ක්‍රියා මාර්ගයක් අරගෙන නැහැ. ඒ පැත්තට පොළ අරගෙන සංවර්ධනය කරලා, මිනිස්සුන්ගෙ සල්ලිවලින් හදපු දේට සාධාරණයක් ඉටු කරන්න. ඉතිං ඒක අපේ දුර්වල කමක්. අපි මේව කතා කරන්නෙ නැද්ද කියලා මිනිස්සු අහනවා. මේවා ධාරණය කරගන්න. සභාපතිතුමනි, මේවට සාධාරණයක් ඉටු කරන්න. මේ තුලින් තව අවුරුදු එකහමාරක් වගේ කාලයක් මේ ප්‍රාදේශීය සභාවට බලය තියෙන්නෙ. අපට මිනිස්සු ලගට යන්න පුලුවන් වාතාවරණයක් තියෙන්න ඕන. මේ එක්කෝටි දහඅට ලක්ෂයේ මුදල සාධාරණ ලෙස, දැක්මක් ඇතිව, හොඳ ව්‍යාපෘති වෙනුවෙන් වියදම් කරලා, මේක මිනිස්සුන්ට දැනෙන විදිහේ වියදමක් කරලා, ඔබතුමා අපි කරන යෝජනාත් එක්ක, ඔබතුමාගෙ නායකත්වයත් දීලා, මේ ගමන යන්න උත්සහ කරන්න.

ඉතිං අද ජේසීබී යන්ත්‍රය බැලුවොත්, එක්කො හදා ගන්න ඕන. එහෙම නැත්නම් මේක විකුණල සල්ලි කරගන්න ඕන. අද වෙනකොට පොලවට පස්වෙන තත්වෙට පත්වෙලා තියෙනවා. මම හිතනවා මේ අපේ මාධ්‍ය මහත්වරු ගිහිල්ල පොඩ්ඩක් බලන්න. උඩුගම උප කාර්යාලය කියන එක ගරා වැටෙන තත්වෙට ඇවිල්ලා. ලක්ෂ දහතුනයි ගණනක් වියදම් කරලා, පහුගිය දවස්වල ටොයිලට් කම්ප්ලෙක්ස් එකක් හැදුවා. කෝ ඒවයි ප්‍ර යෝජන. ඉතිං ඒක නිසා ගරු සභාපතිතුමනි, ලොකු පීඩනයක් දෙන්න නෙවෙයි මේ කියන්නෙ. ඒක නිසා මම මේ අවස්ථාවෙදි එදා මම කිව්වා. උඩුගම සති පොළේ ඒ පස් පිරෙව්වෙ මගේ ඉඩමකින් කපලත් නෙවෙයි. මගේ ඉඩමකටත් නෙවෙයි. එක නිසා අද දිනයේ මම කියනවා මෙච්චර උත්සහ කරලත්, මේ පොළේ ප්‍රශ්නෙ මිනිස්සුන්ට ඒ යතාර්තයක් කරන්න බැරිවුන නිසා, මම ඉතාම කණගාටුවට පත්වෙනවා. ඒ නිසා මම ඒ වගකීම නැවත වාරයක් මේ ප්‍රාදේශීය සභාව භාරයට තියනවා. මම හිතන්නෙ ඔබතුමාල සියලු දෙනාම දන්නවා ඇති මම ඒ කරපු මෙහෙවර පිළිබඳව. ඒ උත්සහය පිළිබඳව. නමුත් ඒ උත්සහයත් අරගෙන

අන්තිමට මම පස් නඩුවක් කරේ තියා ගත්තා. ඒක නිසා ප්‍රාදේශීය සභාවට තියෙන නඩුව මම කරේ. තියා ගන්නෙ නැහැ. ඒක නිසා මින් ඉදිරියට නඩුවේ ඉතිරි වැඩ ටික මම ප්‍රාදේශීය සභාවට භාර කරනවා. ඒ මගේ උත්සාහයට ප්‍රතිඵලයක් නොලැබීම  නිසා. කාට හරි මන්ත්‍රීවරුන්ට ඒ පිළිබඳව චෝදනාවක් ඉදිරිපත් කරන්න තියෙනවනම්, ඉදිරිපත් කරන්න. මම ඒක සාධාරණය කරගෙන යනවා.

ඒ වගේම හැමෝම කතා කළා. අර අපද්‍රව්‍ය ගෙනයන අපේ ලොරි රථය දැන් මාස හතරක් තිස්සෙ අර පාර අයිනෙ තෙම් තෙම් තියෙනවා. අපි තුන් වේලටම දකිනවා ඕතනින් යන කොට විලි ලැජ්ජයි. අපටත් වාහන තියෙනවා. සභාපතිතුමනි, අපි දන්නවා වාහනයක් ගොඩ දාන ක්‍රමය. ඔබතුමාට මෙතන 27 දෙනාම බලය දීල තියෙනවා. වාහනය ඉක්මනින් හදලා, මිනිස්සුන්ගෙ වැඩ ටික කරගන්න පුලුවන් විදිහට, කොළඹ ගිහිල්ල බඩුටික ගෙනැල්ලා, දවස් දෙකෙන් හයි කරන්න. මේවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න. ඔබතුමාට බලය තියෙනවා. අපි කවුරුවත් අත පහල දාන්නෙ නැහැ. ඔබතුමාගෙ ඒ කරන වැඩවලට අපි ඇස්තමේන්තුවලට අත උස්සල තියෙනවා. වැරදි දෙයක් නෙවෙයි වාහනේ හැදෙන්න ඕන.

ඒ වගේම තමයි. සභාපතිතුමනි, අතුරු මාර්ග අතුරු මාර්ග සම්බන්ධව. කතා කරද්දි, මම මීට කලිනුත් සදහන් කළා. ප්‍රාදේශීය සභාවෙනුයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙනුයි අතුරු මාර්ග අපි සංවර්ධනය කරනවා. නමුත් ඒ පාර දෙපැත්තෙ පස් දාන්න ඇස්තමේන්තුවෙ නැහැ. අද වෙනකොට ත්‍රීවිල් එකක් ගියත්, බයිසිකලේ වැටිලා එහා පැත්තෙ වෙලට තල්ලු වෙනවා. ඒක නිසා මෙන්න මේ වැරැද්ද නිවැරදි කරන්න. ඒ වගේම අතුරු මාර්ග හැම එකක්ම එලිපෙහෙලි කරන්න පුලුවන් විදිහට, අඩුම ගානෙ කොට්ඨාසයකට, රුපියල් 50000 ක් හරි යොදවලා ස්කැවේටරයක් නැත්නම්, අඩුම ගානෙ කම්කරුවො ටිකක් යොදවලා ඒ අවශ්‍ය කරන මාර්ගය නම් කරලා සුද්ද කර ගන්න වැඩපිළිවෙලක් කර ගන්න පුලුවන්. ඉතිං මේව අපේ කරපිට එනකොට මේ පීඩනය ඔබතුමාට එල්ල කරනවා. ඒකයි මේ කියන්නෙ. නැතුව මේව පුද්ගලික දේවල් නෙවෙයි. සභාපතිතුමනි, අධ්‍යාපනය වගේම තමයි මේ රටේ ක්‍රීඩාව කියන්නෙ. අද නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩා පිට්ටනි කීයක් තියෙනවද?  අද හවසකට අපි එදා දකින ක්‍රීඩකයන් එක පිට්ටනියකවත් සෙල්ලම් කරනවද? අපි දැකල නැහැ. වෙනද අපේ කාලෙ ක්‍රිකට් ගහන.වා වොලි බෝල් ගහනවා. එල්ලෙ ගහනවා. මම හිතනවා ක්‍රීඩාවට මුල් තැනක් දෙන්න ඕන. ක්‍රීඩාව තුලින් තමයි මානසික පීඩනය, ශරීරයේ සෞඛ්‍ය සම්පන්න බව රැකෙන්නෙ. අපි නිරෝගී පරපුරක්, මේ ප්‍රාදේශීය සභාවෙන් බිහි කරන්න නම් ක්‍රීඩාවට අවශ්‍ය පහසුකම් ප්‍රමාණය අපි ලබා දෙන්න ඕන. මෙන්න මේක තමයි අපේ ප්‍රාදේශීය සභාවකින් විය යුතු යුතුකම වෙන්නෙ. ඉතිං නිරෝගී දරු පරපුරක් ඉදිරියට දායාද කරන්න නම් අපි අවශ්‍ය කරන භෞතික සම්පත් ගොඩනගන්න වෙනවා. ඒ භෞතික සම්පත් ගොඩනැගීමේ බලය ඔබතුමා සතුව සහ මේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු හැටියට අපටයි තියෙන්නෙ. ඒක නිසා මම පහුගිය මැතිවරණ කාලෙදි මම ගියා දෙල්ලව සිට මිල්ලවට. ඒ කියන්නෙ මොරවක එහා කොනේ .අති දුෂ්කරයි. සභාපතිතුමනි, යනකොට මම හරිම ලස්සන තැනක් දැක්කා ක්‍රීඩා කරන්න වොලිබෝල් ගහන්න හොදට කවර් කරපු ලයිට් ගහපු ස්ථානයක්. නෙළුව ප්‍රාදේශීය සභාව කියන්නෙ අපටත් වඩා අන්ත අසරණ දුප්පත් සභාවක්. ඒ වගේ සභාවකටත් ක්‍රීඩාවට කියන තැන මුල්තැන දීල තියෙනවා. නෙළුව පොළට ගිහිල්ල බලන්න.  නෙළුව ප්‍රාදේශීය සභාව, නෙළුව පොළ තියන තැන, පිරිසිදු ඉතා ක්‍රමවත් ස්ථානයක් බවට පත්කරල තියෙනවා. අපට බලන්න පුලුවන් හොදම උදාහරණය ප්‍රයෝජනයට අරගෙන, ඉදිරියෙදි මේවා ක්‍රියාත්මක කරන්න.

ඒ වගේම තමයි, ඉදිරියෙදි සභාපතිතුමා අපේ සංස්කෘතිය අපේ ආගම වෙනුවෙන් එන කඨින පිංකම් ප්‍රාදේශීය සභා ආවරණය කරමින් හැම පන්සලකම ක්‍රියාත්මක වෙනවා. ඒ ක්‍රියාත්මක වෙනඅතරෙ මේ ග්‍රාමීය අතුරු මාර්ග සියල්ලේ තණකොල වැවිල සවුත්තු වෙලා තියෙන්නෙ. ග්‍රාමීය මාර්ගවල විදුලි ආලෝකය නැ.හැ මම ඉතාමත් සතුටට පත්වෙනවා. ඔබතුමා මගේ කොට්ඨාසයේ විදුලි ප්‍රශ්නෙ

75% ක් 80% ක් විසදල තියෙන්නෙ. ඒ ගැන මම එතුමාට ස්තූති කරනවා. ඒ ගැන වරදක් කියන්නෙ නැහැ. එක නිසා ඉදිරියෙදි ඒ කටින පිංකම්වලින් හැම පේරුවක්ම නියෝජනය වෙන පරිදි, පාරෙ ගමන් කරන්නෙ අපේ ගමේ ජනතාවට අපට එලියක් බලා දෙන්න ඕන. ඒ නිසා අතුරු මාර්ගවල විදුලි ආලෝකය සම්පූර්ණ කරල දෙන්න. මම ඔබතුමාට යෝජනා කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මම මේ සභාවට ඇවිල්ලා ඡායාරූප සහිතව යෝජනාවක් ඉදිරිපත් කළා. ඔබතුමාට මතක ඇති. උඩුගම බාර් හන්දියේ බද්දෙගමට යන පාරෙ කන්තෝරු කඩේ අසළ, පාසල් ළමුන් වැහිදාට ඉස්කොලෙ ගියේ කලිසම් උස්සගෙන, ගවුම උස්සගෙන, සපත්තු දෙක, මේස් දෙක ගලවගෙන, තරංග මන්ත්‍රීතුමා, ධනංජය මන්ත්‍රීතුමා, සමන් මන්ත්‍රීතුමා කතා කළා. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවෙදිත් මම මේ සම්බන්ධව කතා කළා. නමුත් මේ පහුගිය සතිය වෙනකොටත් ඒවට කිසිම අයුරකින් උත්තරයක් හම්බ වුනේ නැහැ. උඩුගම ප්‍රදේශයෙන් බිහි වුන හිටපු නායකයො හිටියා. ආසනේට වග කියන ආසනේ මන්ත්‍රීවරු හිටියා. ඇමතිවරු හිටියා. පළාත් සභාවෙ ඇමතිවරු හිටියා. නමුත් මම දකුණු පළාත් වාරිමාර්ග ඉන්ජිනේරුතුමා හම්බවෙලා, එක්ලක්ෂ දහදාහක මුදලක් වෙන් කරලා, පෙරේදා වෙනකොට සම්පූර්ණයෙන්ම ඇල කපලා, ඒ මහජන පීඩාව ඉවත් කර ගැනීමට මට හැකිවුනා. ඒ කිසිම දේශපාලන බලපෑමකින් තොරව, රාජ්‍ය නිලධාරිත් එක්ක වැඩ කරන්න පුලුවන් කියන හැකියාව මම පෙන්නලා තියෙනවා. ඒ නිසා මම වාරිමාර්ග ඉන්ජිනේරුතුමාටත්, ඒ වගේම කෘෂිකර්ම පර්යේෂන නිලධාරිතුමාටත් ස්තූති වන්ත වෙනවා. මේ පිළිබඳව ඒ මුදල් ලබාදෙමින් ඒ අවශ්‍ය කටයුතු, ඒ මහජන පීඩාව ඉවත් කිරීම සම්බන්ධව. ප්‍රාදේශීය සභාවෙ ඔබතුමාටත් ගෞරවයක් අපි ප්‍රාදේශීය සභාව තුලින් තමයි ඒක කළේ. ඒක නිසා මම හිතනවා. මේ මන්ත්‍රීවරු සියලු දෙනාටත් ඒක ආඩම්බරකමක්, අභිමානයක්. ඒක නිසා උඩුගම තෙල් පිරවුම්හලේ පොඩි ප්‍රශ්නයක් තියෙනවා. ගරු සභාපතිතුමනි, මාර්තු මාසෙ රු. 50960.00 ක තෙල් බිලක් ගෙවල නැහැ කියලා තියෙනවා. ඒක නිසා ඒ හිඟ බිල ඉතාම ඉක්මනින් ගෙවන්න කියලා, මම ඔබතුමාට කාරුණිකව මතක් කරනවා.

**ගරු සභාපතිතුමා**

පොඩි ප්‍රශ්නයක් නිසා ඒක නොගෙවා හිටියෙ. මම බලන්නම් එක.

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා**

ප්‍රශ්නයක් තියෙනවනම් සභාපතිතුමනි මෙච්චර කල් ඇදගෙන යන්න එපා. කළමනාකාරතුමා අපහසුතාවයට පත්වෙනවා. ඒ ගැනත් සදහන් කරමින්, මම හිතනවා අපි ප්‍රාදේශීය සභාවක් විදිහට, මම මේ කියපු කරුණු කාරණා පිළිබඳව ඔබතුමා විශ්ලේශනාත්මකව බලන්න. අපි මේ හැම මන්ත්‍රීවරයෙක්ම කියන කරුණු ඔබතුමා ඔලුවට අරගෙන ලොකු පීඩනයක් ගන්න එපා. නමුත් ඒකට අවශ්‍ය කරන ක්‍රියා පටිපාටිය ඔබේ ආයතනය තුල ක්‍රියාත්මක කරන්න ඔබට අවස්ථාව තියෙනවා. ඒ කරුණු කාරණා බෙදා හදාගෙන, වැඩපිළිවෙලක් හදාගෙන, ඔබතුමාට අවශ්‍ය කරන නිලධාරි ප්‍රමාණයක් මේ සභාව තුල ඉන්නවා. එතකොට ඔබතුමාට එන පීඩනය වලක්වන්න තමයි ඔබතුමා ආයතනයේ ප්‍රධානියා වශයෙන් මෙතනට පත්කරලා, ඔබතුමාට පනතක් ගෙනැල්ලා ඒ පනතේ විධි විදාන අනුව, ඔබතුමාට කටයුතු කරන්න බලයක් දීල තියෙනවා. ඒ බලයත් එක්ක මෙතන 27 දෙනාගේ බලයකුත් ඔබතුමාට ලබල දීල තියෙනවා. ඒ නිසා ඔබතුමා වැඩකරන සභාපතිවරයෙක් විදිහට, වැඩකරන නායකයෙක් විදිහට, වැඩකරන රටක, වැඩකරන ප්‍රාදේශීය සභාවක් වශයෙන්, අපේ ප්‍රාදේශීය සභාවෙ දැක්ම සහ මෙහෙවර, මේ අපේ ප්‍රාදේශීය සභාවේ ජනතාවට දැනෙන විදිහට නියාමනය කරන්න ඔබතුමාට ශක්තිය ධෛර්යය ලැබේවා. ඒ වගේම කාර්යක්ෂම, ඵලදායී පරිපාලනයක් තුලින් ප්‍රාදේශීය සභාවෙ ඉදිරි ගමන් මග තීරණය කරන්නෙ ඔබතුමා. ඉතිං මම හිතනවා ඔබතුමා මේ ප්‍රාදේශීය සභාවෙ ප්‍රධානියා වශයෙනුත්, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රධානියා වශයෙනුත්, ඔබතුමාට ලොකු වගකීමක් තියෙන බව ඔබතුමා අමතක කරන්න එපා. ඒක

නිසා මෙතන පරිපාලනමය දුර්වල කම් ගොඩක් තියෙනවා. ඒ නිසා පරිපාලනමය දුර්වල කම් හදා ගන්න ඕන. ඔබතුමාටයි නායකත්වය තියෙන්නෙ. ඔබතුමා එතන ගිහින් ඒ පුටුවෙ වාඩිවෙලා, ඒ වැඩටික කරන්න. ඒ නිසා මම කියන්නෙ, සභාපතිතුමනි, මේකට ඔබතුමා වැඩපිළිවෙලක් හදාගන්න. කලින් හිටපු දක්ෂ සභාපතිවරු දෙන්නෙක් ඉන්නවා. ඊට කලින් හිටපු ජොෂ්ඨ මන්ත්‍රීවරු කොටසක් ඉන්නවා. අපෙනුත් අදහස් අරගෙන, මේ පිළිබඳව ඉතා ශක්තිමත් අත්තිවාරමක් එක්ක, මේ ඉදිරි මාස 16වත් මේ ප්‍රාදේශීය සභාවෙන් වියයුතු යුතුකම් කොටස ඉටු කරන්නට, සභාපතිතුමා ඇතුලු අපි සියලු දෙනාටම ශක්තිය ලැබ්වා. මම නැවත වාරයක් කියන්නෙ ඔබතුමා පීඩනයකට පත්කරන්නවත්, ඔබතුමා අපහසුතාවයට පත්කරන්න නෙවෙයි. නිවැරදි මාවතකට මේ ප්‍රාදේශීය සභාව පත්කරන්නට මේ උත්සහය ගන්නෙ. ඒක නිසා මේ සියලු කරුණු කාරණා පිළිබඳව, ඔබතුමාගේ අවදානය යොමුකර, මේ සියලු කරුණු කාරණාවලට අවශ්‍ය විසඳුම් ලබාදෙන මෙන් ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා. බොහොමත්ම ස්තුතියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, දීර්ඝ වශයෙන් සාකච්ඡා වුනු වෙලාවක මම කතා කරන්න හිටපු මාතෘකා කීපයක් කතා වුනා. මම පළමු කොටම අහනවා. ඌරල උතුර ග්‍රාම නිලධාරී වසමේ පොලිස් ස්ථානයට ලිපියක් යොමු කරල තියෙනවා. මම කතා කරන්න ඉස්සෙල්ල බලාපොරොත්තු වුනා. මේකට පොලිස් ස්ථානයෙන් මොනව හරි තීන්දුවක් තීරණයක් ගත්තද කියලා. ඌරල බෝඩ් එක ගලවපු එකට පොලිස් ස්ථානාධිපතිතුමා ලියුමක් යවලා තියෙනවා කියලා මට පිටපතක් ආවා. ඌරල උතුර ග්‍රාම සේවා වසමේ ඉහල කටඹුරාව මාර්ගයේ ඇති නාම පුවරුව කිසියම් පුද්ගලයෙකු විසින් ගලවාගෙන යෑම සම්බන්ධව පොලීසියෙන් ආවා. කට උත්තර ගත්තා. මේක තමයි රාජ්‍ය නිලධාරීන්ගෙ කල්මැරීම. මේ සිද්ධිය බලන්න කල්මරපු ලස්සන. දැන් මෙතුමලා කියනවා මේ ඔය තමුන්නාන්සෙලගෙ ප්‍රශ්නෙම තමයි. මම මේ කතා කරන්න නෙවෙයි. හොරකම සිදු වුනයි කියලා පළවෙනි රාත්‍රිය එළිවෙන කොට මම කිව්වා සීසීටීවී කැමරා හයි කරල තියෙයි කියලා. තමුන්නාන්සෙලගෙ අතිගරු ජනාධිපතිතුමා කියන්නෙත් ලිපි ගොනු වලට ලියුම් වැඩක් නැහැ. ක්‍රියාවෙන් මේක ඔප්පු කරල පෙන්නන්න කියලා. රාජ්‍ය සේවකයා මොකක්ද කරන්නෙ? එයාගෙ ලිපි ගොනුවෙ ලිපියක් තියෙනවා. හරි ගස්සලා දාල තියෙනවා. අපි උනන්දු නොවී පොලිස්ථානාධිපතිතුමා මේ කටයුත්ත කරාවිය කියල හිතාගෙන ඉන්නවා. එතනට ගිහිල්ලා පැමිණිල්ලක් දාන්න තිබුනා. ඒ නියෝගය ලැබුනා. නමුත් ඒ නියෝගය ලැබුනට පොලීසියට ගියේ නැහැ. රුපියල් 10000.00 ක වත්කමක්, රාජ්‍ය දේපොළක්. රාජ්‍ය සේවකයන්ට කතා කරන්නෙ රාජ්‍ය නිලධාරි කියලා නෙවෙයි. රාජ්‍ය සේවකයො. අහිංසක මිනිස්සුන්ගෙ සේවකයො. නමුත් මෙන්න කල් මරපු හැටි. හොරකම අල්ල දුන්නා. තියෙනවා කියලා දුරකතන ඇමතුම් මට එන්න පටන් ගත්තා. රාජකාරි කිරීම සඳහා මෙතනින් කිසිම නිලධාරියෙක් යවන්න බැරි වුනා. ඊලග සභාවෙ මම කතා කළාම, මෙන්න ලියුමක් එනවා. අපේ බෝඩ් එක ගලවගෙන තියෙනවා. පුලුවන්නම් හොයල කියන්න කියලා, පොලිස් ස්ථානාධිපතිතුමාට ලියුමක් යවලා තියෙනවා. ඒ වෙලාවෙ ගිහිල්ලා පොලීසියෙ පැමිණිල්ලක් දැම්ම නම්, පොලීසිය ඇවිල්ලා, සීසීටීවී කැමරාව තියෙනවා. තාක්ෂණය අද දියුනුයි. මෙන්න මෙතන තියෙනවයි කියලා දුරකතන ඇමතුම් එනවා. නමුත් කිසි කෙනෙක් උනන්දු වුනේ නැහැ. පතිනායක මන්ත්‍රීතුමා දන්නවා. මේක පළවෙනි එක නෙවෙයි. අපි කණගාටු වෙනවා. රාජ්‍ය නිලධාරියා කියන්නෙ මේ උදවිය නෙවෙයි. ඇත පළාත් වලින් අහිංසක මිනිස්සු මෙහේ ජීවත් වෙන්න එනවා. ඒ මිනිස්සුන්ගෙ කැක්කුම තියෙන්නෙ මන්ත්‍රීවරුන්ට. ඒ වේදනාව තියෙන්නෙ අපි ගාව. ඒ කැක්කුමෙන් මේ කතා කරන්නෙ. මාසෙ 25 වෙනිදට ගිහිල්ල පොත අත්සන් කරලා, වේතනය ගන්න විතරයි කියන එක ඔය ලියුමෙන් සනාථ වෙලා ඉවරයි. ඒක තමයි ඇත්ත කතාව. මමත් ඇත්තටම දකින්නෙ ඔන්න ඕක තමයි. ඇතැම් නිලධාරි ඉන්නවා. දක්ෂයො ඉන්නවා. වැඩකරන උදවිය ඉන්නවා. මම එදත් කිව්වා. මේකෙ හිටියා.

ඒ විදිහෙ උදවිය ඉන්නවා. නමුත් ඒ උදවියටත් වැඩ කරගන්න බැහැ. හතර පස් දෙනෙක් මේකට ගොනු වුනාට පස්සෙ කරන පුද්ගලයා කරන්නෙත් නැහැ. ගරු සභාපතිතුමාගෙ දැන ගැනීම පිනිසයි මම කිව්වෙ. තමුන්නාන්සෙත් කිව්වට මේවා නියෝග ක්‍රියාත්මක වෙන්නෙ නැහැ කියන එක අපට පේනවා. එක තමයි කණගාටුව. අන්න ඒක නිසා ඒ පිළිබඳව මම තවදුරටත් කතා කරන්න යන්නෙ නැහැ .

ඒවගේම ජල භීතිකා රෝගය ගැන මීට වැඩිය සැලකිලිමත් වෙන්න කියන ඉල්ලීම කරනවා. ප්‍රදේශයේ සෑම තැනකම මේ මොහොත වෙන කොට, ඒක පාලනය වෙලා නැහැ. අපි පනිවිඩය දෙන්නෙ මේ සෑම නිලධාරියෙක්ම එක මරණයක් සිදු වෙනකම් හිටියා. අහිංසක ඒ දරුව මැරෙනකම් ක්‍රියාත්මක වුනේ නැ.හැ අපි සභාවෙන් සමහරවිට දැනුම් දීල තියෙන්න ඇති. නමුත් අහිංසක බිල්ලක් ගන්නකම්, කිසිම නිලධාරියෙක්, රාජ්‍ය සේවකයෙක් ක්‍රියාත්මක වුනේ නැති එකයි වැරැද්ද. වනමල් මන්ත්‍රීතුමා දාස් වාරයක් කතා කළා. මේ සියලුම මන්ත්‍රීවරු ඔය ගවයින්, සුනඛයින් පිළිබඳව කතා කළා. සභාව හැටියට කතා කළාට, මම හිතන්නෙ ඒකටත් මෙන්න මේ වගේ ලියුම් කැල්ලක් ගහලා යවන්න ඇති. කෑවට පස්සෙ, මැරුණට පස්සෙ, අවසන් ගමන ගියාට පස්සෙ. මේ රටේ අහිංසක දරුවෙක් අවසන් ගමන ගියාට පස්සෙ තමයි ක්‍රියාත්මක වෙන්න පටන් ගත්තෙ. එහෙමනම් ඒ පිළිබඳවත් මම දීර්ඝ වශයෙන් කියන්න යන්නෙ නැහැ.

අන්න ඒක නිසා මේ ගස් කොලන් පිළිබඳව අපි බොහොම සැලකිලිමත් වෙන්න ඕන. සමහර උදවිය හොඳින් ඉන්නකම්, ගහේ ගෙඩිය හැදෙනකම්, එළදාව භුක්ති විඳිනකම්, බෙදාගෙන කනවා. තරහ වුන දාට ඒක කොඩිවිනයක් වෙනවා. ඒක නිසා ඒ පිළිබඳව අපි කතා කිරීමේදී මම හිතන්නෙ අපි සැලකිලිමත් වෙන්න ඕන. දෙපැත්තම අපි බලලා, සර්ව සාධාරනව, අපට පුද්ගලයො වැඩක් නැහැ. අපි දේශපාලනය මෙතෙක් කතා කරන්නෙත් නැහැ. දේශපාලනීකරනය නෙවෙයි, අහිංසකයන් වෙනුවෙන් අපි කතා කරන්න ඕන. ඒකයි සිදු විය යුතුදේ.

ඒ වගේම මම තව දෙයක් කිව්වා. තමුන්නාන්සෙලගෙ උඩවැලිවිටිය ජල යෝජනා ක්‍රමය, ගරු සභාපතිතුමනි, මම හිතන්නෙ මේ මොහොත වෙන කොට අර මම කිව්ව ඒ ජල ටැංකිය සවි කරපු තැන එතනින් එහාට වතුර බෙදා හරින්නෙ නැහැ කියලා ගිය සභා වාරෙ කතා කෙරුවා. මම දන්නෙ නැහැ. මන්ත්‍රීවරු දෙපොළක් ඉන්නවා. ඒක ක්‍රියාත්මක වුනාද නැද්ද? තවමත් ඒ ආකාරයෙන්ද කියන එක. අපි සභාවෙ ඇවිල්ලා මාසෙකට සැරයක් අර මෙතුමන්ලා කිව්ව වගේ, අහිංසක මිනිස්සුන්ගෙ දීමනාව අරගෙන යනවා. පාරෙ හිඟා කන, පාන් කාල කඩේට ගිහිල්ල කන, ඒ සත 25 නුත් අපිත් ණය කාරයො වෙලා ඉන්නෙ. මොකද ඒ මිනිස්සුත් මේ බද්දක් ගෙවනවා අපි ණය කාරයො වෙලා ඉන්නෙ. ඒක නිසා ඒ වගේ ප්‍රශ්න කතා කළාම, සභාව සතු දෙයක්. අපේ වත්කමක්. මටනම් පේන දෙයක් තමයි. යම් කිසි දෙයක් නිවැරදි කිරීම සඳහා සභාපතිවරයා හෝ මන්ත්‍රීවරු යන්න ඕන. නැත්නම් මේක නිවැරදි කරන්න බැහැ. මොකද අපට අවශ්‍යතාවයක් තියෙනවා. අපේ ඥාතියා, අපේ මිත්‍රයා, අපේ හිතවතා, මේ වගේ රාජකාරි හරියාකාරව සිදු වෙන්නෙ නැති නිසා තමයි මේ සියලුම ප්‍රශ්න. මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලනවා. ඊලග සභා වරෙත් මේ ප්‍රශ්න අහන්න නොලැබේවායි කියලා තමයි මම ප්‍රාර්ථනය කරන්නෙ.

ඒ විතරක් නෙවෙයි. රාජ්‍ය දේපොළ දේශපාලන කටයුතු සඳහා යොදවන්න බැහැ. ගරු සභාපතිතුමා කිව්වා. ඒක මම පිළිගන්නවා කියලා. ඔය කාරණේ මේ 27 දෙනාටම ඇසුනා.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා, මම කිසියම් හෝ වෙලාවක රාජ්‍ය දේපොළ දේශපාලනයට යොදාගෙන නැහැ.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

රාජ්‍ය දේපොළ නෙවෙයි. සභාවෙ කැබ් එකට ඩීසල් වලට අනුමත කරන්නෙ අපිනෙ. රු. 50000.00 ක් ගෙවන්න තියෙනවා. දේශපාලනය කියන්නෙ පිළිගැනීමක්. ඊට පස්සෙ ස්තූති කිරීමක්. වචන මෙහෙය වීම හරියාකාරව කරන්න ඕන. ඒක නිවේදකයට කියන්න ඕන. එහෙමනම් මෙන්න ප්‍රදේශයේ සංවර්ධනය සඳහා අසවල් දවසේ අසවල් නිවසේ සාකච්ඡාවක් තියෙයි කියලා. එම සාකච්ඡාවෙදි ස්තූති කරගන්න එකයි තියෙන්නෙ. නමුත් දේශපාලන ස්තූති කිරීම් කිරීම සඳහා රාජ්‍ය දේපොළ භාවිතා කිරීමට සභාපතිවරයාටවත් පූර්ණ බලතල නැත. ගහක් කොලක් කපන්න. ගහක අත්තක් කපන්න. පාරක ආරවුලක් ලිහන්න පුලුවන්. හැබැයි දේශපාලනය මෙතනට ආවට පස්සෙ, ඔබතුමාටත් දේශපාලනය කිරීමේ අයිතියක් නැත. ඔබතුමා මධ්‍යස්ථ පුද්ගලයෙක්. රටේ ජනාධිපතිතුමා තමුන්නාන්සෙලගෙ පක්ෂ යෙන් පත්වුනාට, අපෙත් ජනාධිපති වරයා එතුමා. මේ රටේ ජනාධිපතිවරයා සකස් පක්ෂයකට අයිති නැහැ. එක නිසා තමයි, රටේ ජනාධිපතිවරයාට අපි සියලු දෙනාම ගරු කරන්නෙ. තමුන්නාන්සෙ මෙතනට ශීට් එකට ආවහම, තමුන්නාන්සෙ සභාපතිවරයා හැටියට සියලු දෙනා ගරු කරන්නෙ ඒකයි. එහෙමනම් ඒ ගරුත්වය ආරක්ෂා වෙන විදිහට වැඩ කරන්න. ඒක නිසා මේ රාජ්‍ය දේපොළ මේ යාන වාහන එක එක්කෙනාගෙ දේශපාලන කටයුතු සඳහා එක යොදවා ගන්න එපා කියලා මම තමුන්නාන්සෙගෙන් ඉල්ලා සිටිනවා.

මේ වෙලාවෙ අවසාන වශයෙන් කියනවා. දැන් එලොව පොල් පෙනිච්ච වෙලාවක්. තමුන්නාන්සෙලගෙ ආණ්ඩුවෙන් මේ ඉතිහාසය වෙනස් කෙරුවා. රනිල් වික්‍රමසිංහ නායකයා කොරෝනා දෙවෙනි රැල්ල පිළිබඳව කතා කෙරුවා. දෙවෙනි රැල්ල පිළිබඳ කතා කරලා, අද එතුමට ජනතාව නිවාඩු දීල තියෙන්නෙ. ඒක නිසා එතුමා අද වේදිකාවට ඇවිල්ලා දැන් සැපද කියලා අහන්නෙ නැහැ. එතුමා බලාගෙන ඉන්නවා. කොරෝනා වසංගත යේ ඉදිරිය දැක්කා. දැකලා මේ විදිහට කරන්න කියලා අවශ්‍ය උපදෙස් දුන්නා. ඒ දේ ක්‍රියාත්මක වුනානම්, අපි අද මේ දෙවෙනි රැල්ලට යොමු වෙන්නෙ නැහැ. මේ මොහොත වෙන කොට මාපලගම විතරක් නෙවෙයි. මේ ප්‍රදේශය කොයි වෙලාවෙ මේ කොරෝනා රැල්ලෙන් බිලි ගනීද කියන එක දන්නෙ නැහැ. ඒක නිසා අපි සියලු දෙනාම පරිස්සම් වෙන්න ඕන. සභාවට ඇතුල් වෙන කොට මම අදත් බැලුවා. මේ අපි ඇතුල් වෙලා ඉන්න ක්‍රමය වැරදියි. අද අපි මෙතන ආදර්ශයක් දෙන්න ඕන. මෙතන ඇත්තටම අද මීටරේ දුර නැහැ. අද මේ එක්කෙනෙක් ගාලු ගිහිල්ල අර බස් එකේ ඇවිත් තිබුනොත්, 27 දෙනාම ලොස්. මම මෙතන වාඩි නොවෙන්නත් හදලා මම ආයිත් කල්පනා කෙරුවා. මම අදත් එනවා. ඊලග දවසෙනම් මෙහෙම බැහැ. ඒවගේම බ්‍රැන්ඩෙක්ස් ආයතනයේ ඉදලා සේවකයෙක් පරණතානායම්ගොඩ ප්‍රදේශයට ඇවිල්ලයි කියලා කතාවක් තියෙනවා. ඉතිං එහෙමනම් අපි ප්‍රවේසම් විය යුතුද නැද්ද කියන එක අපි තේරුම් ගන්න ඕන. මෙන්න මේ අපේ ප්‍රවේසම නැතිනිසා තමයි අද දෙවෙනි රැල්ලට අපට මුහුණ දෙන්න සිදු වුනේ. මාසයක් විතර ගිහිල්ලා පහුගිය කාලෙ මෙතනට එනකොට, පාසල්වල බස්වල යන කොට, මෙහෙම කොරෝනා රැල්ලක් රටේ තිබුනද කියලා මිනිස්සු ගණන් ගත්තෙ නැහැ. ප්‍රභාකරන් කියපුදේ හරි. අපි හරිදේ හරිය කියන්න ඕන. අපේ සිංහලයට වෙලා තියෙන්නෙ ඔන්න ඕක තමයි. දින දාහතරක් නෙවෙයි සතියක් යන කොට අම්ම තාත්ත මැරුනත් මතක නැති ජාතියක්. ඒකනිසා මේ වෙලාවෙ හෙට අනිද්ද වෙන කොට මෙන්න මේකට අපි මුහුන දෙන්නෙ කොහොමද කියන එකයි ප්‍රධාන තර්කය විය යුත්තේ. සංවර්ධනය සියල්ලම පස්සට යාවි. අන්න ඒක නිසා මේක තව තවත් දුරට ඉදිරියට ගියොත්, මේක ආණ්ඩුවකටවත් පළාත් පාලන ආයතනයකටවත් මේක බේරෙන්න පුලුවන් වෙන්නෙ නැහැ.

ඒ විතරක් නෙවෙයි අද බලන්න ජීවත් වෙන්න බැහැ. අද හාල් කිලෝ එක අද රුපියල් 100 පැනලා. අලුත්ම ක්‍රමය තමයි පොල් ගෙඩිය ගෙනියන කොට දැන් ටේප් එක සාක්කුවෙ දාගෙන යන්න ඕන. මේ කට්ටිය පොල් ගෙඩියෙ හැබැයි මෙහෙම එකක් තියෙනවා ගෙඩිය ලොකු වුනාම 70 වයි. හැබැයි ගෙඩිය පුංචි එකේ තමයි පොල් මදේ ලොකු. ඒක නිසා අද පොල් ගෙඩියකට වෙච්ච දේ. අද ඇත්තටම මේ ආණ්ඩුව හැටියට අපි කණගාටු වෙනවා. මේ වගේ බොලද කටයුතු සිදු වීම ගැන. මේ

සියල්ලම නිකන් වෙච්ච දේවල් නෙවෙයි. අර කැළනි විහාරෙ පහුගිය කාලෙ දේශපාලන වාසි ගන්න අපේ හාමුදුරුවරු එහෙම නැත්නම් චීවරධාරී හාමුදුරු නමක් එතන ගෙනාවා. අපි හිතුවා ශ්‍රී ලංකාවටම දෙයියනේ ශාන්තියක් වෙනවයි කියලා. බලන්න සාසනයට කරපු අගෞරවය. මේ රටේ බෞද්ධයො, මේ රටේ සියලුම ජනතාව මෝඩයින් බවට පරිවර්ථනය කරනවා. තවම ඇති ඔය තමුන්නාන්සෙලගෙ ෆේස් බුක්වල තවමත් ඕව යනවා ඇති. ජාතියටම අගෞරවයක් කළා. ආගමට අගෞරවයක් කළා. කැළනි ගගේ ගං පතුලට ගිහිල්ලා, නාගලෝකෙන් දීපු කරඬුවක් අරගෙන ආවා. එතකොට නාග ලෝකෙ තියෙන්නෙ බොහොම සැහැල්ලු තැනක තියෙන්නෙ. කැලනි ගඟට බැහැලා, ගං පතුලට ගිහිල්ලා, විනාඩි 20 ක් යනකොට නාග ලෝකෙ තිබුන ඒ කරඬුව ඉල්ල ගන්නවා. කරඬුව අරගෙන එනවා. ගඟ දෙබෑ වෙනවා විදුලි කොටනවා බුදුරැස් විහිදෙනවා මෙන්න දෙවියනේ කැලනි ගඟෙන් කරඬුවක් මතුවෙනවා. අපි සාදු කියන්න ඕන තමයි අපි නෙවෙයි අපේ උපාසක අම්මලට හාමුදුරු කෙනෙක් පොහොට්ටුව පොහොට්ටුව දෙනවා. සාදු සාදු කියනවා. කියල ගිහිල්ලා මෙන්න පොහොට්ටුව වඩින්න කියලා. මේ හාමුදුරුවො පොහොට්ටුවක් දෙනවා. මෙන්න මේ වගේ මේවට වචන නැහැ මේකට කියන්න සිංහල බෞද්ධයො හැටියට අපේ ගෞතම බුදු රජාණන් වහන්සේට අගෞරව කිරීමේ පාප කර්මය තමයි අද අපි මේ ගෙවන්නෙ.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා කොරෝනා ගැටලුවක් එක්ක කතාව කෙටි කරනව නම් හොදයි.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

තමුන්නාන්සෙලා ජයග්‍රහනය ලබා ගත්ත ආකාරය මතක් කරන කොට තමුන්නාන්සෙලට දුක හිතේවි. නමුත් අපි සියලු දෙනාම ගෝඨාභය මහත්තයා පත්වෙන කොට අපි බලාපොරොත්තු වුනා යමක්. ඒවයින් අල්පයක් සිදු වුනා. මේ මොහොත වෙන කොට දැන්නම් සිදු වෙනදේ හෙට අනිද්ද වෙනකොට 20 වෙනි සංශෝධනය කරුමෙටවත් සම්මත වුනොත්, රටත් ජාතියත් ආගමත් මේ ඔක්කොම අපට නැති වෙයි. ඒක නිසා අවසාන වශයෙන් මම තමුන්නාන්සෙලට කියන්නෙ නාගොඩ ප්‍රාදේශීය සභාව හැටියත්, ඒ ජනතාව වෙනුවෙනුත් අපි කියන්නෙ අපි මීට වැඩිය සර්ව සාධාරණ දෙයක් මේ රටේ බලාපොරොත්තු වුනා. අන්න ඒ දේ මේවගේ පට්ට පල් බොරු කරලා පට්ට පල් විදිහට අපේ හාමුදුරුවරු ඉස්සරහට දාල රගපාලා මේ සියලුම කැලැල් වහන්න සූදානම් වෙන්න එපා කියන පනිවිඩය දෙන්නෙ. තමුන්නාන්සේලාගෙ මේ ලක්ෂ කෝටි කීය ආවත් කමක් නැහැ. තමුන්නාන්සෙත් එක්ක ප්‍රාදේශීය සභාවෙ මේ 27 දෙනාම දීර්ග ගමනක් යනවා. එහෙමනම් සමහර වෙලාවට තමුන්නාන්සෙලගෙ මන්ත්‍රීවරුන්ට වීදි ලාම්පුවක්වත් නොලැබෙන කොට, මම කල්පනා කෙරුව අපි මොනවද ඉල්ලන්නෙ කියලා. ඒ කොහොම වුනත් මම හිතනවා. තමුන්නාන්සෙට මම යෝජනාවක් කරනවා. මේ සියලු දෙනාම කැමතියි. මොනව හරි ගමට වැඩක් කරන්න. ඒ සල්ලි තියෙන වෙලාව බලලා අඩුම ගානෙ රුපියල් ලක්ෂෙකවත් ප්‍රතිපාදනයක් අපි මේ 27 දෙනාටම දෙන්න කියලා, ඉල්ලා සිටිනවා. ප්‍රතිපාදනයක් ලක්ෂෙකවත් දුන්නොත් තමුන්නාන්සෙ සභාපතිවරය හැටියට, අපේ නම් ගම් ගහන්න නෙවෙයි. නාගොඩවිතාන සභාපතිතුමාගෙ කාලෙ සභාවෙ අපි නියෝජනය වුනා. ඒ කාලෙ සභාවෙන් අපට ප්‍රතිපාදනයක් රුපියල් ලක්ෂයක් ලැබුනා අන්න ඒකට තමයි අපි මේ බෝක්කු කට දැම්මෙ කියලා .

ඒක නිසා අවසාන වශයෙන්, මම කියන්නෙ තමුන්නාන්සෙට එවැනි සිතක් පහල වේවායි කියල මම ප්‍රාර්ථනය කරනවා. ඒක තමයි අපි බලාපොරොත්තු වෙන්නෙ. එහෙම සිතක් පහල වුනොත් අර කරඬුව ගැන හිතන්න එපා. අර නාගය ගැන හිතන්න එපා. නාග ලෝකෙ යන්න හිතන්නත් එපා. තමුන්නාන්සෙ තව දුරටත් මෙහෙම අපිත් එක්කම වැඩ සිටින්න ඕන. ඒකතමයි මට කියන්න තියෙන්නෙ. එහෙමනම් නයා වගේ පෙනේ පිප්පුවත් කමක් නැහැ. දෂ්ට කරන්න යන්න එපා. ඔහොම තමයි සභාපතිතුමා තමුන්නාන්සෙට තියෙන තත්වය ඔය පාඩම මටත් හොදටම හුරුයි. ඔය

පාඩම අපටත් හොඳටම හුරුයි. වැඩ කරන කොට මුල් පුටුවෙ ඉන්න කොට මේ 27 දෙනෙකුට ඇහුන් කන් දෙන කොට ඕක ඇත්තටම සමහර දාට මම දවස් දෙකක් විතර නිවාඩු දාල වගේ කොහේ හරි ගිහිල්ලත් ඉන්නවා. තමුන්නාන්සෙගෙ වැරදි ගොඩ වැඩි වෙන්නෙ සේවකයා විසින් සැපයිය යුතු දැනුම ඒ සේවාව හරියාකාරව ලැබෙන්නෙ නැති නිසා. සියලු දෙනාම සභාපතිවරයාට ඇඟිල්ල දික් කරනවා. සමහර කරුණු කාරණා පනිවිඩය මෙතනට යන්නෙත් නැහැ. ඒක මම හුගාක් දුරට බලපු දෙයක්. අන්න ඒක නිසා තමුන්නාන්සෙගෙ හැබැයි දුර්වලතාවය සීට් එකේ වාඩිවෙන කොට මේ වාර්තාව කියවන කොට, ඒ අවශ්‍ය පුද්ගලයට හෙට වෙන කොට මේකෙ පිළිතුර ඕන කියන්න ඕන. ඔය මම දීපු ලියුම ගහන කොට ගෙන්නල අහන්න ඕන. ඇයි හලෝ මේ ලියුම ගහල වැඩක් තියේද, ගිහිල්ල වදුරඹ පොලීසියෙ පැමිණිල්ල දානවා. ඒක තමයි සිදු වෙන්න ඕන. ලියුම් යවන එක නෙවෙයි. අදටත් මොකුත් වෙලා නැහැ. ලියුම අන්න තියෙනවා දැන් ඇහුවම ලේකම් තුමිය කියනවා. මොකුත් වුනේ නැහැ. ඒක නිසා මීට වැඩිය ක්‍රමවත් වෙන්න කියලා ඉල්ලා සිටිමින්, තමුන්නාන්සෙට ඒ ශක්තිය ලැබෙන්න කියලා මම ප්‍රාර්ථනය කරමින්, මා නිහඩ වෙනවා, බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

ගරු සභාපතිතුමනි, ඒවගේම මන්ත්‍රීවරු සියලු දෙනාගෙන්ම අවසරයි. මම මේ කතා කරන්න ඉස්සර වෙලා ගරු සභාපතිතුමාගෙන් පොඩි පිළිතුරක් බලාපොරොත්තු වෙනව. අද අපි කතා කරලා වාර්තාවට ඇතුලත් වෙන කරුණු, නැවත වාර්තාවක් අපේ නිවසට යනකම්, ඒ පිළිබඳව යම්කිසි නිලධාරියෙක් අධීක්ෂණය කරලා, කතා කරපුව පිළිබඳව වැඩකටයුතු කරනවද? එහෙම කරනවද නැද්ද කියන එක පොඩ්ඩක් දැන ගන්න ඕන මට. නැත්නම් කතා කරල වැඩක් නැහැ. මෙතන නිකන් දැන් අපිමේ කතා කරන ඒව වාර්තා ගත වෙලා සභා වාර්තාව අපේ නිවසට යනවා. ඒ යන කොට මම සභාවට යම් යෝජනාවක් ඉදිරිපත් කරලා, අත්‍යවශ්‍ය කරුණක් මගේ ගමේ නමුත් ඒ පිළිබඳ සොයා බැලීමක් වෙනවද නැද්ද නැත්නම් මට බලන්න විතරක් මේක හදල එවනවද.

**ගරු සභාපතිතුමා**

නැහැ.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

එහෙමනම් මම කතා කරන්නම්. එහෙනම් ගරු සභාපතිතුමනි, පහුගිය වාර්තාවෙ ඇති. සංවර්ධන ගම්මානයේ ප්‍රධාන මාර්ගයේ කොස් ගහක් පෙරලිලා ඇලක් හාරලා, වේල්ල කඩාගෙන යනවා. ඒ පිළිබඳව යම් විමර්ශනයක් කරන්න කියලා, මම ඒක කියලා ගෙදරට යන කොට, මට මම කතා කරපු අනිත් විරුද්ද පක්ෂයක් හැටියට නිර්මාණය කරගෙන. මම කතා කළේ විරුද්ද පක්ෂයකට නෙවෙයි. යම් කෙනෙක් ඒක වැරැද්දක් කරල තියෙනවා. ඒක විරුද්ද වාදියෙක් විදිහට එතනට කතා කරල කියනවා අන්න ඔබ වෙනුවෙන් විරුද්දව කතා කළා කියලා. මේ සභාවෙන් ,මේ සභාවෙ මේ කතාවල් ඇහෙන කෙනෙක් කතා කරල කියනවා. ඔබට විරුද්දව කතා කළා. හැබැයි මම ඒ කතා කරපු දේ ක්‍රියාවට නංවලා අද වෙනකම් ඒ පාරෙ ඇල වහලා නැහැ. අද වර්ෂාවට ඒ වෙලේ පස්ටික කඩාගෙන යනවා, කියන එක මම තාක්ෂණ නිලධාරී මහත්තය එක්ක ගිහිල්ල පෙන්නුවා. මේ තියෙන්නෙ වෙලේ පස් දාල තියෙන්නෙ වේල්රටේ. එතකොට වේල්ලෙ පස් ටික තමයි මේ වෙලට දාල තියෙන්නෙ කියලා. එතකොට මට කියන්න බැහැ. මේ කට්ටිය කිව්වට තාක්ෂණ නිලධාරීන් ගත්ත තීන්දු තීරණ වැරදිය කිව්වට, මම එදා සභාවෙ කියලා ඇත්තෙ, මට කියන්න බැහැ මේක වැරදිද , හරිද කියන එක. තාක්ෂණික නිලධාරියෙක් ගිහිල්ල බලලා, මේකට තීන්දුවක් තීරණයක් ගන්න කියන එක තමයි මම එදා කිව්වෙ. එහෙමනම් අද වෙනකම් පාර කඩාගෙන යනවා. කොන්ක්‍රීට් එක කඩාගෙන ගියාට පස්සෙ දැන් කණ්ඩිය කඩාගෙන වැටිලා බුරුල් වුනාට පස්සෙ, ඊට

වැඩිය විශාල මුදලක් වියදම් කරන්න වෙනවා. නමුත් වියදම් කරන්න අවශ්‍ය වෙන්නෙ නැහැ. සභාවෙන්, රජයෙන් මුදල් වියදම් කරන්න බැහැ. මොකද කරල තියෙන්නෙ ඇල මාර්ගය ස්කැවේටරයක් දාලා හාරපු කෙනා තමයි මේකෙ වග කීම දරන්න ඕන. එහෙමනම් ගරු සභාපතිතුමනි, කොස් ගහ කපාගෙන අරගෙන ගිහිල්ල තියෙනවා. දැව සංස්ථාවට .හැබැයි එතනින් එහාට පස් කියුබ් දෙකක් විතර දාලා අර බොරු පිළියමක් යොදල විතරයි තියෙන්නෙ. නමුත් අද වෙනකම් මේ සභාවෙන් ඒ ගැන අවදානය යොමු කරල නැහැ.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා, සභාවෙන් තාක්ෂණ නිලධාරී, එතනට ගිහිල්ලා වාර්තාවක් දුන්නා.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

ගරු සභාපතිතුමනි, වාහනවල තෙල් පුච්චගෙන මෙතන මේකට ගමන් වියදම් දාගෙන ගිහිල්ල විතරක් වැඩක් නැහැ .මොකක් හරි වෙන්න ඕන. එක්කො මටත් කතා කරන්න ඕන. එතනට ඇවිල්ලා මේක කරන්න ඕන. මෙහෙමයි මගෙනුත් ඉල්ලන්න ඕන. මගේ මේ ගන්න පඩියත් ගමේ ජනතාව වෙනුවෙන් තමයි වියදම් කරන්නෙ. පාරවල් හදන්න තමයි දීල තියෙන්නෙ. මේ රුපියල් 18000 ක් විපුලසාර සංස්කෘතික මධ්‍යස්ථානය සහ ඔය පාරවල් හදනතැන් කීපයකට යොදවලා තියෙනවා. දැන් කියල වැඩක් නැති හින්ද කියන්නෙ නැහැ. නමුත් මට කතා කරල කිව්වෙ නැහැ. මේක කර ගන්න බැහැ. එහෙනම් මට කියන්න මම ගිහින් ඒක වහලා දාන්නම්. එහෙම බැරිනම් හැබැයි මේක මේ ක්‍රියාව වෙන්න ඕන. මේ නීති විරෝධී ක්‍රියාව කරපු කෙනා තමයි මේක හදන්න ඕන. එතකොට ගරු සභාපතිතුමනි, මීට පෙර මම නයිගලන බෝක්කුව පිළිබඳව කිව්වා. ප්‍රධාන පාරෙ අඩි තුනක් විතර මැදට වෙන්න කොන්ක්‍රීට් එක කඩාගෙන ගිහිල්ලා, බොක්කුව අස්සට හැරිල තියෙනවා. ඊට එහා බෝක්කුව මම ගිහිල්ලා, අපේ මේ තාක්‍ෂණ නිලධාරියෙක් ගෙන්නලා, මගේ වියදමින් මම ඒවෙලාවෙ කැප වෙලා ඒ බෝක්කුව හැදුවා. නමුත් මට මේක හදන්න බැහැ. එතකොට අද වෙනකනුත් දැන් මේක මම හිතන්නෙ මීට වාර මාස ගණනාවකට කලින් අපි ඔය බෝක්කුව පිළිබඳව ඔබතුමාට කියලා තියෙනවා. කවුරු හරි මේකෙ බයිසිකලයක් ගිහිල්ල මොකක් හරි සිද්ධියක් වුනොත්, ගමේ මන්ත්‍රීවරය වශයෙන් මටත්, විපක්‍ෂ මන්ත්‍රීවරය වශයෙන් වනමල් මන්ත්‍රීතුමාටත් දෝෂාරෝපණ පනවා.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමනි, ඔය සේරම තාක්ෂණ නිලධාරීන් දැනුවත් කරලා, ඒ කටයුතු කරන්න කියලා කිව්වා. දැන් තමයි සල්ලි ඇවිල්ලා තියෙන්නෙ.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

ඒ මැනුම් කටයුතු සියල්ලම කරලා තියෙන්නෙ. නමුත් වැඩෙ කෙරුනෙ නැහැ. මැනුම් කටයුතු කර කර ඉදල අපට වැඩක් නැහැ. වැඩ කෙරෙන්නයි අපට ඕන. මම ඒකයි කියන්නෙ ගරු සභාපතිතුමනි, ඒක වැඩේ කෙරිල නැති එක පිළිබඳව මම ඔබතුමාට නැවත සිහිපත් කරනවා. මම බලාපොරොත්තු වෙනවා. මේක ලබන මාසෙ වෙන කොටවත් අපට මොකක් හරි දෙයක් කර ගන්න පුලුවන් වෙයි කියලා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, ඔබතුමන් දැනුවත් වෙලත් නැතිව, මාත් දැනුවත් වෙලා නැති, වාඩිය කන්ද වත්තෙ ගල් වැඩපොළක් පටන් ගැනීම සඳහා කටයුතු කරනවා.. තේක්ක වත්ත පාලම ගාවට ජේනවා. මම ඔබතුමාට කතා කරල ඇහුවම, ඔබතුමා කිව්වා අවසර අරගෙන නැහ. ඔබතුමා

දැනුවත් වෙලා නැහැ කියන එක. එතකොට ඒක මම දැක්කා අර මහ කන්දෙ විශාල ප්‍රමාණයක් සුද්ද කරලා තියෙනවා. මේ වෙන කොට රතු පස් පේනවා. හැබැයි ඒක කරන්නේ කාගෙ අවසරයක් මතද කියලා මම දන්නෙ නැහැ. මම ග්‍රාම නිලධාරීට කතා කළාට පස්සෙ ග්‍රාම නිලධාරීතුමිය එතනට නිරීක්ෂණ චාරිකාවක ගියාය කියලා මම දැනුවත් වුනා. හැබැයි සභාවට ඒකෙ වගකීමක් දරන්න වෙනවද? නැද්ද? යම් ආපදාවක් සිදු වුනෝතින්, ඒ කන්ද ගලවගෙන ආවොත්, තේක්ක වත්ත ඇල මාර්ගය කෙලින්ම වැහිල යනවා. එතකොට ගමේ ජනතාව දැන් විරුද්ද තාවය ප්‍රකාශ කරලා මේ වෙනකොට මට ලිපියක් එවලා, මම ඒක පෙත්සමක් හැටියට ප්‍රාදේශීය ලේකම් වරියට යොමු කරන්න ඉල්ලීමක් කළා. එතකොට ගරු සභාපතිතුමනි, ඒ පිළිබඳ සොයා බලල ඔබතුමා දැනුවත් වෙලා, දැන් මම ඉල්ලීමක් කරනවා. ඒක මගේ කොට්ඨාසෙ හැටියට ඔබතුමා යම් අවදානයක් යොමු කරලා, අපෙන් අවසර අරගෙන නැති නිසා, ඒ පිළිබඳව සොයා බලන්න කියලා. මොකද අපේ සංවර්ධන කටයුතු වලට ගලුත් අවශ්‍යයි. නමුත් ඒක අපට යම් බාදාවක් නොවෙන විදිහට සිදු කරන්න ඕන.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යොමු කල එම ලිපිය ප්‍රාදේශීය සභාවටත් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

ඊට පස්සෙ ගරු සභාපතිතුමනි මේ වෙන කොට සංවර්ධන ගම්මානයට යන ප්‍රධාන මාර්ගය ඉතාම අබලන් වෙලා තියෙනවා. පහුගිය දවස්වල වාණිජ සංසදය කියලා අපේ ගමේ ස්වේච්ඡා සංවිධානයක ඒ අය එකතු වෙලා, අර ගෙයක් කඩපු එකක, සිමෙන්ති කැලි ටිකක් ගෙනිහින් දාල වලවල් ගොඩ කරගෙන ගියා. ඒ වගේම ඉතාමත් අනාරක්ෂිත පාලමක් තියෙනවා. අර ජයසේකර මහත්මයලගෙ නිවස ඉදිරිපිට පොල්ගහ දුව වේල්ල ගාව. ඒ අය කිතුල් පටි යොදලා, තාවකාලික ැටක් හදලා තියෙනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නෙ මොකද ඒක ප්‍රධාන මාර්ගයක් නිසා, ඒක මැනුම් කටයුතු කරල තියෙනවා. අපේ තාක්‍ෂණ නිලධාරින් ගිහිල්ලා. හැබැයි මුදල් පාස්වෙන්නෙ කොයිකවදද අපි දන්නෙ නැහැ. නමුත් මේ වෙනකොට ඒ ප්‍රදේශයේ ඉන්න පාසල් ළමයින්ටවත් සමග පාරෙ එන්න යන්න විදිහක් නැති තත්වෙට පත්වෙලා තියෙනවා. ඒක නිසා ඔබතුමාගේ අවදානය යොමු කරලා, මේ සභාවෙන් යම් මුදලක් වෙන් කරලා, කොරිපස් ටිකක් දාල, ඒ මඩවලවල් ටික වහන්න අවශ්‍ය කටයුතු සිදු කරන්න කියලා ඔබතුමාගෙන් මම ඉතාම ගෞරවයෙන් යුක්තව ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මම මීට පෙරාතුවත් අවස්ථා කීපයකදි ඒ වගේම වසර ගණනාවක් තිස්සෙ මේ කතා බහට ලක් වෙච්ච ඇල මාර්ගය සම්බන්ධයෙන් මේ වෙනකොට ගරු ජනාධිපතිතුමාගේ අවදානය යොමු වෙලා තියෙනවා. කෘෂි කර්මාන්තය පිළිබඳ ලොකු කැපවීමක් තියෙනවා. ඒ වගේම ඒවගේ අවස්ථාවකදිවත් මම මේ නැවත මතක් කරන්නෙ අපේ මේ ඇල මාර්ගය දයානන්ද වීරසිංහ මහත්මා විසින් ඇල මාර්ගය වසලා, දැන් අවුරුදු පහකට වැඩි කාලයක් නඩු මාර්ගයක් යනවා. හැබැයි නඩු ගියත්, උසාවිය දැන ගන්න ඕන ගොවියගෙ පැත්ත අරගෙන, මේ වෙනකොට ගොවිතැන් කරගෙන යන්න පුලුවන් වෙන විදිහට මේ ඇල මාර්ගය සකස් කරල දීලා නඩුව අරගෙන යන්න. නමුත් ඇල මාර්ගය වහගෙන මේ වෙනකොට අක්කර 75 කට වැඩි ප්‍රමාණයක් පුරං බවට පත්වෙලා තියෙනවා. පරණතානායම්ගොඩ කොට්ඨාසෙ ග්‍රාම නිලධාරී වසම් නියෝජනය වන කුඹුරු අක්කර 75 කට එහා ප්‍රමාණයක් මේ වෙනකොට පුරං කුඹුරු බවට පත්වෙලා තියෙනවා. ඒක නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමා මේක දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට යොමු කරලා, මේකට යම් විසඳුමක් අරගෙන දෙන්න කියලා මම ඔබගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති තුමා**

පුලුවන්. ඒ සම්බන්ධයෙන් කෘෂි කර්ම දෙපාර්තමේන්තුවෙ නිලධාරීන් සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරීන් මොනවද කියන්නෙ.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කතා කරල තියෙනවා. උපවාස කරලා තියෙනවා. උපවාස කරලා යම් විසඳුමක් ආවා. ඒ පාර කොමසාරිස් වරයාට විරුද්දව මහාධිකරණයේ නඩුවක් විභාග වෙනවා. නමුත් ඒ විභාග වුනත්, මේකෙදි අපට යම් තීන්දුවක් දෙනවනම්, ඉල්ලීමක් කරනවනම් කොහෙන් හරි නැවත තිබුන විදිහට ඇල මාර්ගය සකස් කරගෙන, කුඹුරු වගා කරගෙන යන්න පුලුවන් කමක් තියෙනවා. ඒකනිසා මම ඔබතුමාට පුලුවන්නම් සංවර්ධන කමිටුවෙදි මේක කතා බහට ලක් වේවි. මම ඉල්ලීම් කරල ලිපි යවල තියෙනවා. ඔබතුමත් එතනදි කරුණු දක්වන්න.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමනි අනිද්දා ප්‍රාදේශීය සංවර්ධන කමිටුවෙදි ඔයා කතා කරන්න. ඒක යනවා දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට. ඕක ඉදිරිපත් කරන්න එදාට.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

ඊලගට ගරු සභාපතිතුමනි දැන් මේ කොරෝනා පිළිබදව පරණතානායම්ගොඩ නමත් කියවුනා. එතනදි ඇත්තටම විශේෂයෙන්ම මම සිහිපත් කරන්න ඕන. ඔබට බියක් සැකක් ඇතිවෙන කාරනාවක් බවට පත්වෙලා තියෙන නිසා. මීහිරිගම බ්‍රැන්ඩෙක්ස් ආයතනයේ තමයි ඒ ආපු සේවක මහත්මයා රාජකාරි කරල තියෙන්නෙ. ඒකෙ කිසිම පුද්ගලයෙකුට එතනින් එලියට බහින්න එපයි කියද්දි මෙයා හොරා පැනල ඇවිල්ල තියෙන්නෙ. හැබැයි කොරෝනා රෝගියෙක් නෙවෙයි. ඒක තවම තහවුරු වෙලා නැහැ. එතකොට ඒ පුද්ගලයා ඊයෙ හැන්දෑවෙ 9.30 විතර වෙනකොට ඒ නිවසට පැමිනියාට පස්සෙ, නිවැසියන් බය වෙලා ඉක්මනින් පොලීසියට කෝල් එකක් දීලා, ඒ ගෙදරම පුතා තමයි කෝල් එක දීල තියෙන්නෙ. කොහොමත් රාත්‍රී 12 වෙනකොට පොලීසියෙන් ගිහිල්ලා, ඒ ගෙදරට සීමා කරලා, මේ වෙනකොට මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් ගිහිල්ලා, එම නිවස නිරෝධායන නිවසක් හැටියට නම් කරල තියෙනවා. එතකොට කිසිම නිවසකට මේ වෙනකොට ගිහින් නැහැ. නමුත් ඇවිල්ල තියෙන්නෙ පිටිගලට ඇවිල්ල පිටිගල ඉඳල ආපු ත්‍රීවිල් එකක ඇවිල්ල තියෙන්නෙ. එතකොට දින අටක් යනකම් මෙයාට නිවසේ ඉන්න ඕන. දින අටකට පස්සෙ තමයි මෙයාට යම්කිසි රෝග ලක්ෂණයක් තියෙනවද කියලා බලලා, ඒ පිළිබදව කටයුතු කරන්න කියලා තියෙන්නෙ. එතකොට මීහිරිගම ඉදල තමයි ඇවිල්ල තියෙන්නෙ එතකොට ඒ එද්දි බස් කීපයක ඇවිල්ල තියෙනවා. ඇවිල්ලා කොහොම හරි ඒ බස් රථව තොරතුරු කිසිම දෙයක් මෙයාට කියන්න දන්නෙ නැහැ. ආපු ත්‍රීවිල් එකෙත් කොලපාට ත්‍රීවිල් එකක ආවයි කියන එක විතරයි කියන්නෙ. ගල්වාන මංසන්දියෙ නිවස තියෙන්නෙ. ඒක නිසා දැනට ගල්වාන පැත්තට නැවිල්ල ඉන්නෙයි කියල මම ඔබෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මම මේ වහින වෙලාවෙ එහා පැත්තට ගියා. අර එහා පැත්තෙ ගොඩනැගිල්ල තෙමෙනවා. එතන ඉන්න නිලධාරින්ගෙ පොත්පත් එහාට මෙහාට කරගෙන, අර ෆෑන් එකට වතුර වැක්කිරිල, මුලු කාමරේම තෙමිලා. මේ සභාවෙ වහල හදාගන්න කියල මම ඔබට මතක් කරනවා. මට දැන් ඒක මතක් වෙච්ච වෙලාවෙ අපේ ඒව හැදුවෙ නැතත් කමක් නැහැ. මේ සභාවෙ එහා පැත්ත තෙමෙනවා. අර සිවිලිම කඩාගෙන ඔලුව උඩට වැටේද දන්නෙ නැහැ. අනිත් කට්ටියත් අපි ඒ ගැන ගැන කතා කරන්නෙ නැතෙයි කියාවි.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා ඒ නිලධාරින්ට මම කිව්වා. එයාල දන්නවා. දැන් ඕක හදන්න ලීත් ඉරලා සේරමත් කරලා තියෙනවයි කියලා.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගණේවත්ත මහතා**

හදපු නැති එක මම කිව්වෙ. නැතුව ඒ අය මට කියන්න කියලා කිව්වෙ නැහැ. නැත්නම් අර සිවිලිම කඩන් වැටේවි ඔලුව උඩට දිරල තියෙන්නෙ. ඒ පාර ඒකෙත් වගකීම භාරගන්න වේවි සභාපතිතුමාට. ගරු සභාපතිතුමනි එහෙම අපි ඔබතුමා අපහසු තාවයට පත් කිරීමට නෙවෙයි මේ සියලුම දෙනා කතා කරන්නෙ. ඔබතුමාට යම් වැඩ කටයුත්තක් කරන්න. මම තව ඉල්ලීමක් කරනවා අපි කොට්ඨාස 15කට දැන් ඉස්සර වගේ නෙවෙයි ඉස්සර සභාපතිවරයට මම හිතන්නෙ මන්ත්‍රී ආසන 13 යි තිබුනෙ. දැන් 27 ක් තියෙනවා. හැබැයි එතනදි කොට්ඨාස ක්‍රමයට බෙදල තියෙනවා. දැන් මේ කොට්ඨාස 15 ක් තියෙනවා. හැම කොට්ඨාසෙකටම අපේ පක්ෂ යේ මන්ත්‍රීවරයෙක් ඉන්නවා. එතකොට විපක්ෂ යේ තවත් අතුරු මන්ත්‍රීවරු ඉන්නවා. හැබැයි කොට්ඨාසෙ මන්ත්‍රීවරයා කතා කළ යුතු දේ අනිත් කොට්ඨාසවලින් කතා කරනවනම් ඇත්තටම කණගාටු දායකයි. මොකද කොට්ඨාසෙ මන්ත්‍රීවරයා පැත්තක, මේ කෙහෙවත් යන එකක් අල්ලගෙන අනිත් මන්ත්‍රීවරු ගොඩක් කතා කළා. හැබැයි කොට්ඨාසෙ මන්ත්‍රීවරයා දැනුවත් කරලා, එයත් එක්ක සාකච්ඡා කළානම්, මෙතන ඔය ප්‍රශ්නෙ මෙච්චර දුර දිග යන්නෙ නැහැ. මම ඇත්තටම කණගාටු වෙනවා. මොකද තමන්ගෙ කොට්ඨාසය පිළිබදව, ඒ කොට්ඨාසෙ වගකීම ඒ මන්ත්‍රීවරයගෙන් පැහැර හැරලා, ඒ ගැන කතා කිරීම පිළිබදව මම ඇත්තටම කණගාටු වෙනවා. මෙතන මොකද අපි පහුගිය කාලෙ රැස්වීමක් තියා ගන්න බැහැ කොට්ඨාසෙ අස්සෙ ආවෙ මොකටද කියල අහපු මන්ත්‍රීවරු, අද මෙතන එහෙම කතා කරනවනම් , මම ඇත්තටම ඒකට කණගාටු වෙනවා. දූරියන් ගස් නිසා මෙතන මේ සභාවෙ ඇදිච්ච කාලය ඇත්තටම කාලය අපතේ යැමක් වුනේ. ඒක නිසා මීට පස්සෙ තමන්ගෙ ඒ අදාල කොට්ඨාසෙ ඉන්නවනම්, ඒ මන්ත්‍රීවරයා දැනුවත් කරන්න. මේක කෙරෙන්න ඕන . මෙන්න මෙහෙමයි එතකොට එයාගෙ ගෞරවයත් තියෙනවා.

ඊට පස්සෙ ජයවීර මන්ත්‍රීතුමා කිව්වා. සභාවෙ වාහන ගෙන ගොස් මුදල් නාස්තියක් පිළිබදව. හැබැයි අපේ ජනාධිපතිතුමාගෙ සෞභාග්‍යයේ දැක්ම පිළිබදව. එදා සිද්ද වුනේ අපේ පාර්ලිමේන්තු මන්ත්‍රී සම්පත් අතුකෝරල මැතිතුමන් සංවර්ධන කමිටු සභාපතාවරයා වශයෙන් පැමිණ සිටි යා. එතුමාගේ යෝජනා වගයක් තිබුනා මාර්ග පිළිබදව. ඒ පිළිබදව සාකච්ඡාවක් තමයි කෙරුනේ. එතනදි ඉතිං යම්කිසි විදිහකින් ඔබට ඇහුනද මම දන්නෙ නැහැ. එහෙම කිව්වද මම දන්නෙත් නැහැ. මොකද මගේ ගමේනම් එහෙම එනවුන්ස් එකක් ගියෙත් නැහැ. ඒ වැඩසටහන ඊට ඉස්සෙල්ල මගේ ගමේ කරල තිබුන නිසා. ඒ නිසා හැබැයි එතනදි සභාවි වාහනයක් යොදවල තමයි ඒ සංවර්ධන කටයුතු කිරීමේදී, යෝජනා ගැනීමට මිනිස්සු ඒකරාශී කරගෙන, ඒ අයගෙ යෝජනා තමයි ගත්තෙ. ඒ පිළිබදව ජයවීර මන්ත්‍රීතුමා එහෙම කියනවනම් මම හිතන්නෙ ඔබතුමාට මම මෙතනදි කතා කළ යුතු ප්‍රශ්යක් නෙවෙයි. මම මීට ඉස්සෙල්ල කතා කළා . හැබැයි මේක තියෙන්නෙ මම ගොවිජන සංවර්ධන කමිටුවේ කතා කළයුතු ප්‍රශ්නයක්. දැන් ජයවීර මන්ත්‍රීතුමා මේ මුදල් නාස්තිය පිළිබද කතා කළ නිසා, මම මේ කියන්නෙ පුරං කුඹුරු හැම සදහා මහ ටැක්ටරයක් ගෙනවිත් කුඹුරු අක්කර පහක් පමණ පහක් මේකෙ තියෙන්නෙ මට. මේ ගොවි සංවිධානෙන් ආපු ලියුම්. අක්කර පහක් හෝ හයක් පමණ බිම සැකසූ අතර, ටැක්ටරයේ මුදල් ගෙවීම සදහා රජය විසින් රුපියල් 150000 ක මුදලක් දැනට අරගෙන තියෙනවා. පනස් දහස අරගනිපු චෙක් පතේ පිටපතක් මට එවල තියෙනවා. මේ තියෙන්නෙ චෙක් පතේ පිටපත. එතකොට මේ මුදල තියෙනවා මේ මුදල ඇවිල්ල තියෙන්නෙ මේක ඇවිල්ල තියෙන්නෙ ගොවිසංවිධානය කුඹරු හේන එකමුතු ගොවි සංවිධානය නමින් තමයි. චෙක්පත ඇවිල්ල තියෙන්නෙ. හැබැයි මේ මුදල ජයවීර මන්ත්‍රීතුමා ප්‍රකාශයට පත් කරලා තිබුනේ, ඒ

වප්මගුල් උත්සවය වෙලාවෙ ජනතා විමුක්ති පෙරමුණෙන්ය මේ මුදල් කියලා. හැබැයි චෙක්පතේ සීල් එක තියෙන්නෙ ගරු ආණ්ඩුකාරතුමා මගින් කෘෂි කරම දෙපාරතමේතුවෙන් තමයි. මේ මුදල් නිකුත් කරල තියෙන්නෙ. එතකොට ජනතා විමුක්ති පෙරමුණෙන් ලබා දුන්විදිහට තමයි හුවා දැක්වුවෙ. රංජිත් ජයවීර මන්ත්‍රීතුමා ගිහිල්ලා ගමේ මිනිස්සුන්ට මෙන්න මෙහෙම මුදලක් අපට ආවෙ, මේ මුදල අපට ආවෙ ජනතා විමුක්ති පෙරමුණෙන්ය කියලා. හැබැයි චෙක්පත ආවට පස්සෙ තමයි මේක එළි දැක්වුනේ. එත් ඔබතුමන්ල කරන්නෙ නීති විරෝධී වැඩක්. මම එදත් කිව්වා නලින් හේවගේ මන්ත්‍රීතුමා එතනට ගෙන්න ගෙන මොකක්ද කිව්වෙ? එතුමා ගිහිල්ලා මාධ්‍ය සාකච්ඡාවෙදි, කිව්වෙ කිසිම පොහොරක් තවම මේ නාගොඩ ප්‍රදේශයටවත් නැතෙයි කිව්වා. හැබැයි ඒ වෙන කොට සියලුම ගොවීන්ට පොහොර දීල ඉවරයි. අපි එදා ඒ පොහොර දීල ඉවර වෙලා තියෙද්දි තමයි ඔබතුමා එතනදි ඒ කතාව කරලා, ඊට පස්සෙන්ද මාධ්‍ය සාකච්ඡාවෙදි කියන්න පටන් ගත්තෙ. ඉතිං මුදල් නාස්තිය පිළිබඳ ඔබතුමාට ඉදිරියෙදි දක්වන්න පුලුවන් වේවි. යම් පුරං එක කුඹුරක් හරි අස්වැද්දුවනම් මම සතුටු වෙනවා. නමුත් අපි ජනතාවගෙ පැත්තෙ ඉදගෙන ජනතාවට සේවයක් කරනවා මිසක්, අපි ඒකෙ යම්කිසි මුදලක් තර කර ගනීමක් නෙවෙයි. ඒ නිසා එතනදි මට හැගිල තියෙනවා. මේ වෙන කොට ඔබතුමා නීත්‍යානුකූල නොවන මාර්ගයකින්, මේකෙ මුදල් යම්කිසි විදිහකින් අවභාවිතා කරලයි කියලා, ඒ නිසා අපි ඒක පස්සෙ ඔප්පු කර ගමු.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මේ කොරෝනා කියන වසංගතය දැන් ඉස්සරහට වැඩි වෙන්න ඉඩ තියෙනවා. අපි එහෙම වුනෝතින් කළ යුතු ක්‍රියා කලාපයන් ඔබතුමාගේ මූලාසන කතාවෙදි සඳහන් කළොත් හොඳයි, කියල හිතනවා. මොකද අපට නැවත සභාවකට කැඳවීමක් කරන්න වේද? මොකද අපට එකමුතුවක් වෙන්න පුලුවන් වේද අපි දන්නෙ නැහැ. ඒක නිසා ඔබතුමා ඒ පිළිබඳව හිතාමතා, මොකද ගියපාර වගේ අපි නොකළ යුතු වැඩ නෙවෙයි. කළයුතු වැඩ ටිකක් ජනතාව වෙනුවෙන් කරමු. කියන එක මම සිහිපත් කරමින්, ඔබ සියලු දෙනාටම තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරමින්, මම නිහඩ වෙනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, මේ වෙලාවෙ කාල වේලාව ඉක්ම ගියත්, නාගොඩ ප්‍රධාන පාලම අසල පසුගිය රජයෙන් ඉදිකරන ලද පාලමේ වැඩකටයුතු අවසන් වෙලා තිබුනත්, පාලම ගලවගෙන යන තත්වෙට ඒ අය නිර්මාණය කරපු කානු පද්දතිය සකස් කරන්නෙ නැතුව, ඔවුන් දැන් ඒ වැඩ බිමෙන් ඉවත් වෙලා යනවා. පාලමේ වැඩ අවසන් කරලා. නමුත් එහි පාර සහ එහි ඒ ඉතිරි වැඩ කොටස සම්බන්ධයෙන් ඒ ඉංජිනේරුතුමාට කතා කරලා, ක්‍රියාමාර්ගයක් ගන්න කියන ඉල්ලීම ගරු සභාපතිතුමාගෙන් මේ වෙලාවෙ මම ඉල්ලා සිටිනවා. මොකද මහා අනතුරුදායක තත්වයක් තියෙනවා. ඒ කපපු කානු වලවල්, වගේම ඒ පාලමේ දැනට ගොඩ වෙන්න තියෙන්නෙත් මහවලකට. ඒ ඇස්තමේන්තුවෙ කොහොම තිබුනත්, එයා හදපු වලවල් ටිකනම් අනිවාර්යයෙන් ගොඩ කළ යුතුමයි. නැත්නම් ඒ පාලම හදපු එකෙත් වැඩක් නැතිවෙලා යනවා. සේරම ගලවගෙන යන්න පුලුවන් කම තියෙනවා. ඒ නිසා ඒ පිළිබඳව ඔබතුමාගෙ අවධානය විශේෂයෙන් යොමු කරන්න කියන ගෞරවණීය සිහිපත් කිරීම මේ වෙලාවෙ සඳහන් කරනවා.

ඒ වගේම අපේ උඩවැලිවිටිය ප්‍රදේශයෙන් මේ ප්‍රාදේශීය සභාවට පවරන ලද ප්‍රජාශාලාව, දැනට අලුතෙන්ම සකස් කරලා, අපේ සභාවට භාරදීපු, අපට අයිතිය පවරපු ඒ ප්‍රජාශාලාව, දැන් ජරා ජීර්ණ වෙලා. ඒ වගේම අබලන් තත්වයට පත්වේගෙන යනවා. ඒ නිසා මේ වෙලාවෙ මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලනවා. මේ අපේ සුලු කම්කරු ප්‍රමාණයක් හිටියත්, එම කම්කරුවො ටික අපට ලබා දීලා ඒ කටයුත්ත සිදු කරන්නත්, ඒ වගේම එහි විදුලිය දැනට විසන්ධි වෙලා තියෙනවා. මීට පෙරත් ප්‍රජාශාලාවට විදුලිය ලබා ගැනීම සඳහා ඔබතුමාගේ විශේෂ මැදිහත්වීමක් කරන හැටියට, මම ඉල්ලීමක් කළා. මොකද අපට ලැබුණු සම්පතක් එය. ඒකට විදුලිය ලබා ගැනීමට අවශ්‍ය මූලික

ඉල්ලීම් කරලා, ඒ කටයුත්ත කරන්නට මැදිහත් වෙන්න කියන ගෞරවණීය ඉල්ලීම, මේ වෙලාවෙ මම සිදු කරනවා.

ඒ වගේම මේ වෙලාවෙ හැම දෙනාම කතා කළත්, මේ සභාව තුල අපේ කොට්ඨාස තුල මම හැමදාම කිව්වා. අපේ පොදු අරමුදලෙ සල්ලි අවශ්‍ය නැහැ. මේ අපේ ප්‍රදේශයන්වල තියෙන සංවර්ධන කටයුතු කරන්න. මොකද ගම්සභා කාලෙ තිබුන ක්‍රමවේදය තිබුනහම, මේ රටේ වැඩ කටයුතු කරන්න රජයෙන් සල්ලි ලබා දුන්නෙ නැහැ. නමුත් හැම ගමකම දේශපාලන නායකත්වයක් තෝරලා, මන්ත්‍රීවරු පිරිසක් 27 දෙනෙක් මේ නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පත්කරලා එවලා තියෙනවා. එහි නායකයා හැටියට ගරු සභාපතිතුමාට තමයි මෙහි සියලු වගකීම් තියෙන්නෙ. මොකද රටේ ව්‍යවස්ථාව අනුව ගත්තහම, නාගොඩ ප්‍රාදේශීය සභාවේ පළවෙනි පුරවැසිය හැටියට සැලකෙන්නෙ  වෙනත් රාජ්‍ය නිලධාරීන් නෙවෙයි. ඔබ තමයි මේ රටේ මේ නාගොඩ ප්‍රාදේශීය සභාවේ පළවෙනි පුරවැසියා. ඒ නිසා ඔබට යම් බලයක් මේ ජනතාව විසින් ලබා දීල තියෙනවා. ඒ සඳහා හැරෙන්න වැරෙන්න දෙයක් නැහැ. ඒ නිසා දැන් ඔබට ජනාධිපතිතුමාගෙ බලය, ඒ වගේම පාර්ලිමේන්තුවෙ බලය, ඒ වගේම පළාත් සභාවෙ ආණ්ඩුකාරයගෙ බලය කවර කවමදාවත් නැති විදිහට, කිසිම ප්‍රාදේශීය සභාවක නොමැති විදිහට, මේ මන්ත්‍රීවරු 27 දෙනාම එකහෙලාම මම හිතන්නෙ ඔබතුමාට සහය දක්වනවා. ඒ නිසා මේ සභාව නගා සිටවන්න මම මීට පෙරත් යෝජනා කළා. ස්වේච්ඡා සංවිධාන අති විශාල ප්‍රමාණයක් හැම කොට්ඨාසෙකම තියෙනවා. ඒවගෙ ගිණුම් පරීක්ෂා කරල බැලුවොත්, කෝටි ගණන් මුදල් ඒ සමිති සමාගම් සතුව තියෙනවා. මම කියන්නෙ ඒ මුදල් ගන්න කියන එක නෙවෙයි. නමුත් අපි නිවැරදි නායකත්වයක් දීලා මේ ස්වෙච්ඡා සංවිධාන ටික නිවැරදිව පෙළ ගස්සලා, ඒ වගේම මේ රටේ විශාල සංඛ්‍යාවකට සමෘද්ධි සහනාධාරය ලබා දෙනවා. ඒ සමෘද්ධි සහනාධාරය 3500 ය 3000 හ 2000 හ 1500 ය වශයෙන් විශාල මුදල් ප්‍රමාණයක් මේ රටේ අඩු ආධායම් ලාභීන් අතරෙ බෙදා දෙනවා. ඒ  අඩු ආධායම් ලාභීන්ට ඒක බෙදල දෙන අතරෙ, ඒ අයගේ යම්වූ ශ්‍රමය මාසෙකට එක දවසක් අපට නාගොඩ ප්‍රාදේශීය ලේකම් තුමිය සමග සාකච්ඡා කරලා, එහෙමත් නැත්නම් අපේ මේ ඉන්න මන්ත්‍රීවරු සමග එකතුවෙලා, ගමේ පන්සලේ විහාරස්ථානයේ හාමුදුරුවො එකතු කරගෙන, විදුහල්පතිතුමා එකතු කරගෙන, යම් සංවිධානයක් සූදාණම් කරලා කටයුතු කරනවානම්, ප්‍රාදේශීය සභාවෙ සත පහක්වත් මේ සඳහා යොදවන්න වෙන්නෙ නැහැ. එදා අපට මතකයි අපේ අම්මල තාත්තල අද කාලෙ ඒක කරන්නෙ නැහැ නමුත් ශ්‍රමදාන මට්ටමින් මේ සියලු පාරවල් තොටවල් හදා ගත්තා.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සියලු දෙනාගෙන් අවසරයි. ගරු ධනංජය මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. මම මොකක්ද කිව්වා කියලා. දේශපාලනේ ඔබතුමා දකින කෝණයෙන් ඔබතුමා දකින්න. ඒක ඔබතුමාගෙ අයිතිය. ඒ වගේම ඔබතුමා පරිසරයට ආදරෙයි කිව්වා. ඒකටත් මම මොකක්ද කිව්වයි කිව්වා. ඒකත් ඔබතුමා කැමති විදිහට දකින්න. ඒක ශබතුමාගෙ අයිතිය. ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට මම කියන්න ඕන ටික, ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්වා. ඒ නිසා ඒ ගැන මම ආපහු කතා කරන්නෙ නැහැ.

ගරු සභාපතිතුමනි, ඒ වගේම මම එම් එම් දිසානායක මහත්තයගෙන් අවසර ගන්න ඕන. එයාගෙ කොට්ඨාසෙ ගැන කතා කරන්න. අක්කර 25  පාර ගරු සභාපතිතුමා පස් කියුබ් 100 ක් විතර දාලා පාරෙ කොන්ක්‍රීට් එක වහල තියෙනවා. මේ පහුගිය 09 වෙනිදට මාසයක් වෙනවා. පතිනායක මන්ත්‍රීතුමා ලියුම යවලා, ඒ වෙනකම් ගත්තු ක්‍රියාමාර්ගයක් මොකුත් නැහැ. දැන් අපි මොනව හරි

කිව්වම, දැන් පිට්ටනියෙ ගල් ටික අයින් කරන්න කිව්වා. අවුරුදු දෙක හමාරයි කිසි ප්‍රශ්නයක් නැහැ. මම කියන්නෙ කොන්ක්‍රීට් එකක් උඩ පස් කියුබ් 100 ක් විතර දැම්මම, මේ සභාවෙන් කොන්ක්‍රීට් කරලා, කොන්ක්‍රීට් එක උඩ පස් දානකොට ,ඔහේ බලන් ඉන්නවා. අපි කාර්මික නිලධාරියා ගිහිල්ලා, එතුමා වාර්තාවක් දීලා තියෙනවා. ඒ වාර්තාව ක්‍රියාත්මක කරන්නෙත් නැහැ. ඇත්තටම සභාපතිතුමා, අපි ලැජ්ජ වෙන්න ඕන. ඔබතුමා හුගක් උත්තර කියයි මේකට ලැජ්ජ වෙන්න ඕන.

ඒ වගේම ඔබතුමා කිව්වා මේකෙ වගකීම මම භාර ගන්නවයි කියලා. මොකක්ද වගකීම භාර ගන්නෙ සල්ලි ටික වියදම් වෙනවා. තෙල් ගහනවා. දැන් 252-6478 පරන කැබ් එකට ලීටර් 300 ක් තෙල් ගහනවා. අපේ මන්ත්‍රීවරුනි, සාමාන්‍යයෙන් එතකොට දවස් 25 ක් අපි වැඩ කරන්නෙ. කිලෝ මීටර් 100 ක් විතර මේක දවසකට දුවන්න ඕන. නිකන් කල්පනා කරන්න. මම දන්නෙ නැහැ. ඔබතුමාල ඕන මතයක ඉන්න. නමුත් මෙහෙම අපි නිලධාරීන්ට ගමන් දීමනා දෙනවනම්, මේ කැබ් එක කොහේද යන්නෙ කියලා ඔබතුමාල බලන්න. අපි බලන්න ඕන නැහැ. වගකීම ගන්න එක නෙවෙයි. මොනව හරි අපට උත්තරයක් දෙන එකට වඩා සාධාරණය කරන්න. සම්පත් අතුකෝරල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවෙ සභාපතිතුමා කෙහේට හරි එනවනම්, ඒකෙ සාකච්ඡාවක් තියෙනවනම්, කිසි ගැටලුවක් නැහැ. පාරවල් සංවර්ධනය පිළිබද රැස්වීමක් තියෙනවා අපි ඔබට ආරාධනා කරනවා. යනුවෙන් දැනුවත් කරලා යන්න. ඒ මොකුත් වගක් කිව්වෙ නැහැ. ජයවීර මන්ත්‍රීතුමා, ඔබ කියපු එක හරි. ඒ වගක් කිව්වෙ නැහැ. ධර්මසිරි මන්ත්‍රීතුමා, ඒ නිසා මෙහෙම කරන්න එපා. නාගොඩ සමූපකාරෙටත් ඔය ටික තමයි සභාපතිතුමා වුනේ. අපි දිගින් දිගට සමූපකාරෙ කතා කරන කොට ඒක තනිකරම දේශපානය කළා. සමූපකාරෙ අද වෙන කොට දොර ලෑලි ටික විතරයි තියෙන්නෙ. ප්‍රාදේශික 22 ක් තිබුනා. අද ප්‍රාදේශික 06 ට වෙනකම් වහන්න වුනේ ඔන්න ඔය දේශපාලනේ නිසා. මේක ඇතුලේ දේශපාලනේ කරන්න ගැටලුවක් නැහැ. හැබැයි සභාවෙ සම්පත් මීට වැඩිය අඩුවෙන් පාවිච්චි කරලා, සභාවෙ සංවර්ධනය පැත්තට මොනව හරි කරලා, ඒව කරන්න. අපි මහජන නියෝජිතයො හැටියට, මේකෙ දෙන සල්ලි ටික අරගෙන ගිහිල්ලා, ගමේ පාරක් හදන්න කියනවට, ඒකට මන්ත්‍රීවරය එනකොට එනවුන්ස් කරනවනම්, ඒයා පිළිගන්න, සල්ලි වියදම් කරලා තොරණ ගහන්නෙ, ඇමතිවරයෙක් එනකොට පිළිගන්න තොරණ ගහන්නෙ සල්ලි වියදම් කරලා. මේ සභාවෙ පුංචි ගානකින් මේ දේවල් කරන්න අමාරුයි. මේ අපේ වෙරංග මන්ත්‍රීතුමාට මම ගරු කරනවා. මොකද දැන් කිව්වා. සභාවෙ සංවර්ධනයට, අපේ ප්‍රදේශයේ සංවර්ධනයට, කීයක් වියදම් කරල තියෙනවද කියලා. කණ්ඩායම් රැස්වීමෙදි අහන්න කීයක් වියදම් කරල තියෙනවද කියලා. විජිත් මන්ත්‍රීතුමා, අපේ කොට්ඨාසයේ මන්ත්‍රී ධූර 03 ක් තියෙනවා. යටලමත්තෙ කොට්ඨාසයේ සංවර්ධනය සඳහා මම මීට කලින් බැලුවා රුපියල් 55000 යි වියදම් වෙලා තිබුනෙ. දැන් ඒක වෙනස් වෙලා ඇති. අපි තුන්දෙනා අද වෙනකොට දීමනාව විදියට ඊට වැඩිය අරගෙන තියෙනවා. ඒ නිසා සභාවෙ සල්ලි නැහැ. ගරු සභාපතිතුමා අපි ඒක පිළිගන්නවා. ලක්රුවන් මන්ත්‍රීතුමාල හොද යෝජනා ගෙනාවා. නමුත් සල්ලි නැහැ කියන එකම නෙවෙයි උත්තරේ. මේ සඳහා වෙන ක්‍රමයක් හොයා ගන්න. අපි කියනවා සභාවෙ පාර උඩ අඩි 04 ක විතර පස් කියුබ් 100 ක් විතර දාලා, තුනී කරලා, මේ ගැන තීන්දුවක් ගන්න බැරුව ඉන්නවා. ගහ ගැන තීන්දුවක් ගන්න බැරුව ඉන්නවා.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා. ඒක ක්‍රියාත්මක කරන්න නිලධාරින්ට මම නියෝගය දීල තියෙන්නෙ..

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

ක්‍රියාත්මක කරන්න මාස ගානක් යනවද සභාපතිතුමා. ධර්මසිරි මන්ත්‍රීතුමා කියනව එයාගෙ වෙල්ල කඩන් ගිහිල්ලා, මොකුත් සිද්ධ වුනේ නැතිලු. අරෙහෙ ගහක් කපන්න ගියාම එය සිදු වෙලා නැතිලු. පතිනායක මන්ත්‍රීතුමා ලිද ගානෙ කතා කළා. සහබන්දු මහත්තයා කතා කරල කියනවා. මොකක්ද

බෝඩ් එකකට අදාළ සිද්ධියක්. මොනාද වෙලා තියෙන්නෙ. මේ සභාවෙ, මේ මාසෙ දීමනා ටික බැලුවම, ගිහිපු ගමන් බිමන් එතකොට ඩීසල් ගහපුව මොකක්ද වෙලා තියෙන්නෙ. මොකුත් නැහැ. අපට කියන්න. එහෙනම් මෙන්න මේ දේශපාලනය තමයි මේ මුදල්වලින් කරල තියෙන්නෙ. අකමැත්තෙන් වුනත් මම හිතට එකගව කියන එකක් නෙවෙයි. අපට කියන්න මොකද ඔබතුමා අපට උත්තර දෙයි. මොනව වුනත් නමුත් මාස ගානක් පතිනායක මන්ත්‍රීතුමා, ධර්මසිරි මන්ත්‍රීතුමා, වෙරංග මන්ත්‍රීතුමා, ධනංජය මන්ත්‍රීතුමා, ජයවීර මන්ත්‍රීතුමා අපි කවුරුත් කියන්නෙ. අපි සංවර්ධනය කරන්න කිව්වෙ නැහැ. දවසක් දෙකක් ඇතුලත පාරේ තියෙන මේ පස් කියුබ් 100 අයින් කරවන්න, එයාට කියලා. මොකද අපේ සභාවට අයිති කොන්ක්‍රීට් පාරක් උඩ පස් දාලා තියෙන්නෙ. මොනවද සභාපතිතුමා මේකට ආයිත් දෙපාරක් හිතන්න ඕනද? නැවත කියන්න ඕනද? සභාවෙ මීට කලින් මේ සම්බන්ධව  ලියුම් ගානක් ගැහුවා. මම දන්නෙ නැහැ. ඇත්ත බොරු. අපේ එම්.එම් මන්ත්‍රීතුමාගෙ හිතවත් එක්කෙනෙක් ගිහින් කිව්වලු. මම ඒක සමාවෙනවා ඔබතුමාගෙ නම පාවිච්චි කරන්න වීම ගැන. එහෙමනම් මේ සභාව දුවන්නෙ, එයාලට ලයිට් හයිකරන්න, එයාලට පාරවල් හදන්න කියලා. මේ සභාව පැත්තකින් තියලා, මේ තත්වෙට පත් කරන්න එපා. එක දෙයක් ගානෙ අපි කතා කරන්නෙ. තල්ගස්වල මාලු ලැල්ල ගානෙ කතා කළා. ඒ මිනිහ මගේ මූණ බලන්නෙ නැහැ. ඒක ඒ විදිහටම තියෙනවා. අපි බය නැහැ. නමුත් මේක තමයි සභාව ඔබතුමා ක්‍රියාත්මක කරන විදිහ. ඒ නිසා පුලුවන්නම් මෙන්න මේ පස් කියුබ් 100 ය අයින් කරලා දාන්න.

ඊලගට ගරු සභාපතිතුමා, අර සුනඛයින් ගැන කතා කරන්න ඕන. ජලභීතිකාව ගැන ප්‍රශ්නය  ජයවීර මන්ත්‍රීතුමා අපේ මේ කවුරුත් මන්ත්‍රීවරු කතා කළා. නමුත් මෙතන ප්‍රශ්නෙ තියෙන්නෙ මන්ත්‍රීතුමා ජල භීතිකා ප්‍රශ්නෙයි, බල්ලන් එන්නත් කිරීමයි නෙවෙයි. අයාලේ යන බල්ලන් එන්නත් කිරීමේ ප්‍රශ්නයක් තියෙනවා. නාගොඩ ප්‍රදේශයේ ස්ථාන 16 කද කොහෙද එන්නත් කරනවයි කිව්වා. නමුත් ඒ ඔක්කොම එන්නත් කරන්නෙ ගෙවල්වල ඉන්න සුනඛයො. නමුත් අයාලෙ යන සතුන්ට වැඩපිළිවෙක් ඒ වෛද්‍යවරු ගාව නැහැ. ළමයි අපහසුතාවයට පත්කරන්නෙ, විකන්නෙ, හූරන්නෙ, මේ ඔක්කොම කරන්නෙ අයාලේ යන බල්ලන්. මේකට ඔබතුමා දිස්ත්‍රික් සංවර්ධන කමිටුවෙ මේ ගැන කතා කරන්න. මෙන්න මේ තත්වෙ අයාලේයන සතුන්ට මොකක්ද අපි කරන්නෙ. අපි බල්ලා ගැට ගහගෙන ගිහිල්ලා, වෛද්‍යවරයා ගාවට ගිහිල්ල එන්නත් කරල තිබුනා. මේ පාර අයිනෙ ඉන්න මිනිස්සුන්ට කරදරයක් වෙන සුනඛයට කරන්නෙ? එයට පිළිතුර අද වෙනකම් පශු වෛද්‍යවරු ගාව නැහැ. ඒකට පළාත් පාලන අමාත්‍යාංශය එකතුවෙලා, තවත් රජයේ අනිත් ආයතනත් එකතුවෙලා, මේක දිස්ත්‍රික් සංවර්ධන කමිටුවෙ කතා කරන්න කියලා මම යෝජනා කරමින්, මම සියලූ දෙනාටම සුබ දවසක් කියලා, ප්‍රාර්ථනා කරනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

ගරු සභාපතිතුමනි, මම කාලෙකට පස්සෙ අදහස් කීපයක් දක්වන්න අදහස් කළා. දීර්ඝ වෙලාවක් ඔබතුමාගෙන් ගන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. ප්‍රශ්න කීපයක් තියෙනවා. අද ඒ පිළිබඳව කතා කරන්නෙ නැහැ. මට ඊලග සභාවාරෙ වෙනකොට, මම හිතන්නෙ අද ඔබතුමන්ට පිළිතුරු සොයා ගන්න අපහසු වෙයි ඒ ප්‍රශ්න කීපයට. පළවෙනි කාරණේ තමයි, මම මේ සභාවෙ මීට පෙර කතා කරල තියෙනවා. උඩුගම නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ ආනන්ද විජය විද්‍යාලය අසලින්, ඒ ගම්මානයට වැටෙන පාලම ඉදිකිරීම පිළිබඳව. වැඩ ආරම්භ කරලා දැනට වසර 06 ට වඩා පැරණියි. මේකට විවිධ අවස්ථාවල, සංවර්ධන කමිටුවල ඒ හැම තැනකම කතා කරල තියෙනවා. නමුත් මේකෙ වැඩ නිම වීමක් වැඩ ක්‍රියාත්මක වීමක් වෙන්නෙ නැහැ. මේ ගැටලුව පිළිබඳව ගමේදි මුහුණ දෙන්න වෙන්නෙ මට. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මම මීට පෙර සභාවෙ ඉල්ලීමක් කරලා, ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා. මේ පිළිබඳව දැනුම් දීලා, මේක සක්‍රීය භාවයට පත් කරන්නට

මාර්ග සංවර්ධන අධිකාරියට සභාව මගින් දැනුම් දීමක් කරන්න කියලා. මේ දැනුම් දීම කළාද? නැද්ද ? ඒකට ගනිපු පියවර මොකක්ද? ඒකට පිළිතුරක් ලැබුනද කියන කාරණයට මම ඊලග සභාවාරෙදි පිළිතුරු බලාපොරොත්තු වෙනවා.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමනි, අර පාලමේ නම මොකක්ද? අර භාගෙට හදපු පාලමද?

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි චනිගරත්න මහතා**

ඒ පාලමට නමක් නැහැ ආනන්ද විජය විද්‍යාලය අසලින් ජන සවිය ගම්මානයට යන පාලම

**ගරු සභාපතිතුමා**

ජන සවිය ගම්මානයට යන පාලම, ඕක දිස්ත්‍රික් සංවර්ධන කමිටුවෙත් කතා කරල තියෙන්නෙ. පහුගිය දවස්වලත් ඔය ජන සවිය ගම්මානයට යන පාලම පිළිබඳව කතා කළා. මම හිතන්නෙ මුදල් ප්‍රතිපාදනසම්බන්ධයෙන් මොනව හරි වුනා. අපි සභාව වශයෙන් මමත් කතා කළා.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි චනිගරත්න මහතා**

එහෙම කිසිම කාරණයක් නැහැ. ගරු සභාපතිතුමනි, මේ ඊයෙ පෙරේද දිනවලත් ගම්මානෙ මිනිස්සුන්ගෙ දැඩි විරෝදය මැද, මම ඒ නිලධාරීන් ගෙන්වල දැනුවත් කළා. එහෙම කිසිම දෙයක් නැහැ. මේකෙ එහෙම ක්ෂණිකව වැඩපිළිවෙලක්. මොකුත්ම දැනුම් දීමක්. ඒ නිලධාරීන්ට ඒ ඉංජිනේරුතුමියට එහෙම දැනුම් දීමක් මොකුත්ම නැහැ. මේක යන තාලෙට එහෙමම යනවා. කොන්ත්‍රාත්කරු දිගින් දිගටම අතපසු කරමින් යනවා. ඒ නිසා නැවත ඒ පිළිබඳව සොයා බලන්න.

**ගරු සභාපතිතුමා**

ඒක මම සම්පූරුණයෙන්ම කර ගන්නම් කොන්ත්‍රාත්කරුගෙ නොම්මරයක් තියෙනවනම් දෙන්න.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි චනිගරත්න මහතා**

ඊලගට දෙවනි කාරණය, අපේ ධනංජය මන්ත්‍රීතුමා කතා කළා. උඩුගම අලුත්වත්ත මංසන්දියේ කාරණයක් පිළිබඳව. මම ඔබතුමා සමග මීට අවුරුදු එකහමාරකට විතර පෙර මේ ගැටලුව පිළිබඳව සාකච්ඡා කරල මම සභාවට යෝජනාවක් ගෙනාවා. ඒ තියෙන භූමිය සභාවට පවරා ගැනීම සඳහා කටයුතු කරන්න. මොකද ඒ වෙලාවෙ ඔබතුමා දැනුම් දුන්නා. මාරග සංවර්ධන අධිකාරියට තමයි මේක අයිති. ඒ නිසා මේකට කටයුතු කරන්න, අපට බැහැ. ඒ නිසා මම ඒකට විකල්ප යෝජනාවක් ගෙනාවා. ඒ ඉඩම පවරාගෙන, ඒ අනුව සභාවට අයිතිය අරගෙන, ඒ අනුව ඒක නියමානුකූල කරන්න කියලා. විශේෂයෙන් අපේ ගම්මානවල ඉන්න පිරිස් පිළිබදව කතා කළාම, ඒ අය හිතන්නෙ කොට්ඨාසෙ මන්ත්‍රීවරයා මේ මොකුත්ම කතා කරන්නෙ නැහැ. මොකුත් දෙයක් සොයන්නෙ බලන්නෙ නැහැ. ඒ පිළිබඳව අවදානයක් යොමු කරන්නෙ නැහැ කියන මතය. ගමේ යනවා. ඒ නිසා අපි මේව කතා කරලා, අවශ්‍ය පියවර අරගෙන තියෙනවා. ඒ නිසා ඔබතුමාගෙන් මම දැනගන්න කැමතියි. ඒ පිළිබදව ඔබතුමා මීට කලින් කතා කරන කොටත් කිව්වා. අවශ්‍ය පියවර අරගෙන තියෙන්නෙ කියලා. ඒ නිසා මට ඊලග සභා වාරෙදි දැනුම් දෙන්න. ඒ සදහා ගත්තු පියවර සහ ඒ ගැටලුව විසදීමට කාරණය.

මීලග ගැටලුව, මම හිතන්නෙ ඔබතුමන්ට මේකටනම් මේ වෙලාවෙ පිළිතුරක් දෙන්න පුලුවන්. පසුගිය සභාවාරයේදී ඔබතුමන්ට උඩුගම රෝහලේ රෝහල් කමිටුවෙන් ලිපියක් ලැබුනා. ඒ රෝහල

ඉදිරියේ තියෙන බල්බ්ස් ටික සවිකරලා, ඒ රෝහලට යන පාරකට සිලින්ඩර් වගයක් ඉල්ලීමේ ලිපිය සභාවෙ සභාගත කළා. ඒ සම්බන්ධව සභාවෙ කතා කළා. එතකොට මම දැනගන්න කැමතියි ඔබතුමාගෙන්. ඒ ලිපියට අදාලවමද ඔබතුමා කටයුතු කළේ. ඒ ලයිට් ටික දාල ඒ කටයුතු කළේ එහෙමද? එහෙම නැත්නම් වෙන කාගෙ හරි ඉල්ලීමක් මතද?

**ගරු සභාපතිතුමා**

අදාල බල ප්‍රදේශයේ මන්ත්‍රීතුමා ඔබතුමාගෙ ඉල්ලීම අර මේ සභාවට ඉදිරිපත් කරලා, ඒ ලයිට් හැදුවා. හැබැයි සිලින්ඩරය තවම නැහැ. සිලින්ඩරය ඇස්තමේන්තු අරගෙන, යථා කාලෙදි සිලින්ඩරය ලැබෙයි. ඉස්පිරිතාලෙයි කියල නෙවෙයි ඒක මහ ජනතාව පාවිච්චි කරන පාරක් නිසා, ඉදිරි කාලෙදි ගේනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

ඒකට ඔබතුමාට විශේෂයෙන් ස්තූතිය පිරිනමන ගමන්, ඒ පිළිබඳව මම කොට්ඨාසෙ මන්ත්‍රීවරයා හැටියට බරපතල ගැටලුවකට මුහුණ දුන්නා. මොකද මේ ලයිට් ටික ඇවිල්ල හදනකොටත්, මට කතා කරල කිව්වා. මන්ත්‍රීතුමා අද ඇවිල්ල තියෙනවා. ලයිට් ටික හදනවා කියලා. නමුත් දවසකට, දෙකකට පස්සෙ මගෙන් ඇවිල්ල අහනවා. ඔබතුමා මොකද කරන්නෙ? ඔබතුමා මේව ගැන සොයන්නෙ බලන්නෙ නැහැ. කොට්ඨාසෙ මන්ත්‍රීතුමා හැටියට නිශ්ශබ්දව ඉන්නවා. වෙනින් මන්ත්‍රීවරයෙක් මේක කියලා මේ රෝහල අසල තියෙන මේ ලයිට් ටික සකස් කරල හදල දුන්නා. අපි එතුමාට ස්තූති කළා. මම දන්නෙ නැහැ ෆේස් බුක් එක හරහා මොකක් හරි ක්‍රමවේදයක් ගිහින් තියෙනවා. මම බැලුවෙවත් නැහැ. ෆෙස් බුක් එකේ තියෙනවලු. වෙන මන්ත්‍රී කෙනෙක් කලා කියලා. හැබැයි එහෙම කළානම් මම කියනවා. මේ වෙලාවෙ එක තුච්චයි. නීචයි. කැතයි වැඩේ. අපේම මන්ත්‍රීවරයෙක් වුනත් මට ප්‍රශ්නයක් නැහැ. කවුද කියලවත්, මම ඇහුවෙ නැහැ. කවුරු වුනත් මට කමක් නැහැ ඒක ඉතාම සදාචාරාත්මක නැති කටයුත්තක් ලෙස මම මේ වෙලාවෙ සිහිපත් කරනවා. ඊට පස්සෙ තව ඒකට කමෙන්ට්ස් දානවලු අපේ මන්ත්‍රීතුමා නැතුව වෙන කවුරු හරි මේක හරි කළානම්, අපි ඒකට සතුටු වෙනවයි කියලා. ඉතිං මම දන්නෙ නැහැ මම ෆේස් බුක් ඇත්තෙත් නැහැ. මම ඒවා සොයන්නෙත් නැහැ. මට කට්ටිය ගෙනැල්ලා පෙන්නුවා. සභාපතිතුමනි, ඔබතුමන්ට ඒකෙ ගැටලුවක් එනවා. ඔබතුමන්ට මම මගේ කොට්ඨාසෙ තියෙන කරුණු පිළිබඳව සභාවෙදි, වගේම පෞද්ගලිකවත් කතා කරනවා. සමහර විට ඔබතුමා මංගැන සමහර වෙලාවට තරහෙනුත් මට බනිනවා. ඇත්තටම අද උදෙත් මට බැන්නා. මොකද මම නිතරම නිතරම කතා කරනවා. මම ඊයෙත් කතා කළා. පෙරේදත් කතා කළා. අද උදෙත් කතා කළා. ඒ නිසා යම් විදිහකින් ඔබතුමා එහෙම එහෙනම් මම කියන කාරණා මග අරිනවනම් ඒක මට කරන බලවත් අසාධාරනයක්.

ඒ එක්කම අපේ ධර්මසිරි මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි, ඕනම මන්ත්‍රීවරයෙකුට අයිතියක් තියෙනවා. මේ ඕනම තැනක ඕන දෙයක් පිළිබඳව සොයල බලන්න. හැබැයි සදාචාරාත්මක අයිතියක් තියෙනවා වෙන කෙනෙක්ගෙ කොට්ඨාසයක ප්‍රශ්නයක් නම්, ඒ මන්ත්‍රීතුමා සමග සුහදව කතා කරලා, ඉවර වෙලා, ඒ පිළිබඳව පොදුවේ කතා බහ කිරීම. අයිතිය පිළිබඳ ගැටලුවක් නැහැ. ඒක සදාචාරයක් නැති කටයුත්තක් හැටියට මම දකිනවා. මොකද ඒකෙ බරපතල ගැටලුවක් තියෙනවා. ගම්වල ඉන්න මිනිස්සු හිතන්නෙ කොට්ඨාසෙ මන්ත්‍රීවරයා සද්ද නැතුව සිටියදී, පිටස්තර අය ඇවිල්ලා මේකෙ වැඩ කරනවා. මේකට හේතුවක් මම දකිනවා. සමහර අයගෙ තියෙනවා ඉස්සරහට මේ මැතිවරණ ක්‍රමය වෙනස් කරලා, කලින් තිබුන මනාප ක්‍රමය එනවයි කියලා. ඉතිං මේකට දැන් ගොඩාක් අය සූදානම් වෙනවා. හැබැයි මම එකක් කියනවා. මම මේ මැතිවරණයට ඉදිරිපත් වුනේ, කිසියම් වූ කාරණයක් නිසා. නමුත් ඉදිරියට අපේ වැරදි ආදර්ශ සහ වැරදි කටයුතු තුල, අපේ රජය වුනත් යනවනම්, මම ඒකට එකහෙලාම විරුද්ධව නැගී සිටිනවා. ඒ නිසා මගේ එහෙම අනාගත බලාපොරොත්තුවක් නැහැ. මේකෙ සභාපතිකම ගන්න, උප සභාපතිකම, ගන්න ඒවට අපේ

බලාපොරොත්තුවක් නැහැ. ඒ නිසා මම මේ වෙලාවෙ අන්න ඒ කාරණය පොඩ්ඩක් සිහිපත් කරනවා. ඒ නිසා තමයි මේක වෙන්නෙ කියන අදහස මගේ තුල තියෙනවා.

ඊලග ගැටලුව, සභාපතිතතුමනි, ඔබතුමත් එක්ක අර කලින් කතා කළා වගේ ගැටලු ගොඩක් හදා ගන්න අවස්ථා තියෙනවා. මම ඒව කතා කරන්නෙ නැහැ. අද ඔබතුමාට ලැබුනු පීඩනය වැඩියි. මට මතකයි. හැම සභාවාරයකදිම වගේ කතා කළා. ගවයින්ගෙ ප්‍රශ්නෙ මමත් කතා කළා. මට අලුත්වත්ත ප්‍රදේශයෙන් මිනිස්සු කතා කරලා, මේකට විසඳුම් ඉල්ලනවා. පසුගිය මැතිවරණ වෙලාවෙ, අපි දේශපාලන රැස්වීම්වලට ගියාමත් මේක තමයි සාකච්ඡා කරන්නෙ. ඉතිං අපි එතනදි දේශපාලන රැස්වීමනෙ, අපි පොරොන්දු වෙනවා. හරි හරි අපි පියවරක් ගන්නම්, කියලා ඇවිල්ලා, සභාවෙත් කතා කරනවා. මේකට පියවරක් ගත්තෙ නැහැ. මේකට ගන්න පියවරක් ඇත්තෙ නැද්ද? එහෙම නැත්නම් මොකක්ද කරන්න පුලුවන් කියන එක පිළිබඳව, මට ඊලග සභාවෙදි දැනුවත් කිරීමක් කරන්න කියලා, ඉල්ලීමක් කරනවා.

ඊලග කාරණය ජල භීතිකා රෝගය ගැන කතා කළා. අවශ්‍ය කරුණු අපේ සියලු මන්ත්‍රීවරුන්ගෙන් ආ.වා ඒකෙදි මට සිහිපත් කරන්න තියෙන්නෙ මම ආයතනයක් පාලනය කරන නිලධාරියෙක් හැටියට, මම එතනදි කියන්න ඕන. හැම පාසලකම බරපතල ගැටලුවක් තියෙනවා. විශාල සුනඛයො සංඛ්‍යාවක් රාත්‍රියටත්, දවල්ටත් පාසලේ ඉන්නවා. හේතුව දරුවො දවල්ට ගේන අර කෑම එකේ ඉතුරු ටික සුනඛයන්ට දාන්න පුරුදු වෙලා, විශාල සංඛ්‍යාවක් හැම පාසලකම ඉන්නවා. මම මේකට අදාල තැන් මගේ රාජකාරි මට්ටමෙන් දැනුවත් කරනවා. උත්තරයක් නැහැ. මේකෙ අවසානෙ උත්තරේ ගිහින් බැලුවහම, දැන් සුනඛයන් මරන්නත් බැහැ. මොකද සත්ව ආරක්‍ෂක පිරිසක් ඉන්නවා. ඒ සංගම්වලින් විරුද්ධ වෙනවා. මරන්නත් බැහැ. ඊලගට මේ ගැටලුව කිව්වම, දැලක් දාල සුනඛයන් ගන්න එනවා. වාහනේ හන්දියෙන් හරවන කොටම බල්ලා දන්නවා. මේ එන්නෙ මොකටද කියලා. උන් ඉන්නෙ නැහැ. ඊලගට මේකෙ තව බරපතල ගැටලුවක් තියෙනවා. මම හිතන්නෙ, මේ සභාවෙ තව බරපතල ප්‍රායෝගික ගැටලුවක් තියෙනවා. සභාවෙ කතා කළාට කමක් නැහැ. සමහර වෙලාවට ළමයි හාරපන්සීයක් තියාගෙන උදේ රැස්වීම කරන්නත් අපහසුයි. පැහැදිලිවම මේක ගැටලුවක්. අපි මොකක්ද කරන්නෙ. ඒ නිසා පැහැදිලිවම, ඒක ඔබ තේරුම් ගන්න ඕන. මේක ප්‍රායෝගික ගැටලුවක්. ඒ නිසා සභාපතිතුමනි, මම දැනගන්න කැමතියි. අයාලේ සිටින සුනඛයන්ට මොකක්ද වෙන්නෙ කියන කාරණය පිළිබඳව අපි දැන ගන්න කැමතියි. මොකක්ද මේකට කරන්නෙ අපට ගන්න පියවරක් නිලධාරි මට්ටමින් හරි සොයල බලල දැන් බැරිනම් සභාපතිතුමා ඉදිරියට හරි දැනුම් දෙන්න. මේකට මොකක්ද කරන්නෙ කියලා. මෙය විසඳන්න ක්‍රමයක් හදන්න කියලා ඉල්ලීම් කරනවා.

ඊලගට අනිත් කාරණය මේකට අමනාප වෙන්න එපා. ගස් කැපීම පිළිබඳව, ඔබතුමන්ලා, ඔබතුමියන්ලාගේ අදහස් කීපයක් පළවුනා. මොකද ඒ ගැටලුවෙදි, මේ හා සමාන ප්‍රශ්නයක් මගේ කොට්ඨාසෙ ආවා. ඒ වෙලාවෙ මම සභාපතිතුමාට යෝජනාවක් කළා. සභාපතිතුමනි, එහෙම ගහක් කපනවනම්, ගෙවල් දෙකක් අතරෙ තියෙන ගැටලුවක්නෙ. මේ නිලධාරියා ගිහිල්ලා, කටයුතු කලාම පැහැදිලිව මේ නිලධාරිනියට තමයි ඇගිල්ල දික් වුනේ. මම ඒක සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරනවා. අපේ හිටපු උප සභාපතිතුමා, අජිත් මන්ත්‍රීතුමා, කියපු විදිහට ප්‍රායෝගික ගැටලු රැසක් මත, ඒ නිලධාරිනිය තීන්දුවක් ගත්තා. ඒ තීන්දුව අරගෙන එතුමිය නිලධාරිනියක් හැටියට, එතුමියගෙ කටයුත්ත කළා. එතුමියගෙ වැරැද්දක් නැතෙයි කියන එක මම දකිනවා. මම කලින් යෝජනාවක් කළා. ඒ වගේ වෙලාවක තීන්දුව, ඔබතුමා අත්සන් කරන්න කලින්, මේ දෙපාර්ශවය ගෙන්නන්න. ගෙන්නලා, සාකච්ඡා කරලා බලන්න. එතකොට ඔය වගේ බරපතල අර්බුදකාරී තත්වයක් තියෙනවනම්, ඔබතුමාගෙ අත්සන දාන්න කලින් ඒ පිළිබඳව අවබෝධ වෙනවා. ඒ අනුව තීන්දුවක් ගන්න පුලුවන්. මම හිතනවා ඒක කරන්න පුලුවන් කියලා. පස්සෙ අර වැඩේ නොකළොත් ගෙන්නනවට වඩා, ඉස්සර වෙලා දෙපාර්ශවයම ගෙන්වන්න. නැත්නම් නිලධාරිතුමිය ගිහින්

කියනවා. අතු ටික හරි කපන්න කියලා. ඇවිල්ලා ලියලා යවනවා, ගහ කපන්න කියලා. මේ මනුස්සය ලියුම ගියාම උඩ බිම බලනවා. අන්දුන් කුන්දුන් වෙනවා. මේ මොකක්ද වෙලා තියෙන්නෙ කියලා. ඒ නිසා ඒ ගැටලුව ඔබතුමාට හැකියාවක් තියෙනවනම්, මේ ක්‍රමයට කරන්න. මින් ඉදිරියට මේ වගේ ගැටලු සඳහා මේ අපි කාලය යොමු කරන එක නිවැරදි වෙයි කියන එක විශ්වාසය තියෙනවා.

ඊලගට තවත් ප්‍රශ්නයක්. මේකටත් ලබන සභාවාරෙදි වුනත් කමක් නැහැ පිළිතුරු දෙන්න. උඩුගම නැතෙනහිර බංගම මාර්ගයේ, දොලමාවත සහ අකුරැස්ස අපේ දිස්ත්‍රික් මායිම තියෙනවා. ඒ දිස්ත්‍රික් මායිම සම්බන්ධව සභාවට මම යෝජනාවක් ගෙනැල්ල තියෙනවා. අපේ සභා බල ප්‍රදේශයට ඇතුලු වෙනකොට, දැන්වීම් පුවරුවක් නැහැ. මම කතා කළාම ඔබතුමා කිව්වා. හරි ඒක භාර ගෙන, අපි අනිවාර්යයෙන්ම ඒක කරනවා කියලා, මම දෙතුන් සැරයක්ම කතා කළා.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා ඔය බංගම පාරෙ ඉස්සර තිබුනනෙ නේද?

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

බංගම පාරේ ඉස්සර කොන්ක්‍රීට් බෝඩ් එකක් තිබුනා. දැන් මොකක්වත් නැහැ. ඒ නිසා ඒ පිළිබඳව මොකක් හරි පියවරක් ගන්න කියන කාරණය පිළිබඳව මම මේ වෙලාවෙ විශේෂයෙන් සිහිපත් කරනවා. මීට අමතරව මම හිතන්නෙ තව කරුණු තිබුනට කතා කරන්න යන්නෙ නැහැ. මොකද මම ඉදල හිටල තමයි කතා කරන්නෙ. මේ අවශ්‍යම ටික කතා කළේ. නමුත් මේ අනිත් ගැටලු ඔක්කොමත් මට තියෙනවා. ලයිට් ප්‍රශ්න, පාරවල්වල ප්‍රශ්න තියෙනවා. හැබැයි මම හිතනවා මේ සියල්ල තිබුනට, මම මේ වෙලාවෙ ඔබතුමාට ඒ පිළිබඳව පීඩනයක් දෙන්න සූදානම් වෙන්නෙ නැහැ. ඒ පිළිබඳව අපි විශේෂයෙන් මේ වෙලාවෙ සිහිපත් කරන්න ඕන. අද ඔබතුමත් එක්ක කතා කරපු බොහෝ දේවල්, අපේ මේ සභාවෙ කතා කළ යුතු දේවල්වලට වඩා, කණ්ඩායම් රැස්වීමෙදි, ඔබතුමා සමග කතා බහ කරලා බේරගන්න තිබුනු දේවල් ගොඩක් තිබුනා. ඒ නිසා ඒ පිළිබඳවත් සිහිපත් කරමින්, ඉදිරි සභා වාරෙදි මේ ප්‍රශ්නවලට පිළිතුරු ලැබෙයි කියලා බලාපොරොත්තු වෙමින්, සභාපතිතුමන්ට ඔය ආතතිය නැතිකරගෙන, හොඳින් මේ සභාවෙ කටයුතු ඉදිරියටත් කරගෙන යන්න ශක්තිය ධෛර්යය වාසනාව උදා වේවා කියලා, ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. ස්තූතියි.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමා, ඇතුලු මන්ත්‍රීතුමනි,මන්ත්‍රීතුමියනි, වෙනත් කරුණු යටතේ බොහෝ දීර්ඝ කරුණු කාරණා පැහැදිලි වුනා. ආතතිය බොහොම වැඩියි. ඉතිං මම මගේ ආතතිය පිට කරගන්න, කේන්තියෙන් කතා කරනවා. අද උදෙත් අපේ ගරු වනිගරත්න මන්ත්‍රීතුමා කතා කලාම, අන්තිමට මට කේන්තියි. මම දුරකතනය තිබ්බා. විදුලිය පිළිබඳව කතා කලේ. එතකොටත් ඒ ප්‍රදේශයේ තමයි විදුලිය හදන්න ගියේ. ඉතිං ඒ පිළිබඳව මම කණගාටුවට පත්වෙනවා. ගරු මන්ත්‍රීවරුනි, අද රටේ පවතින තත්වය අනුව කොහොමත් අපට ගුණදායක නැහැ. විශේෂයෙන්ම මේ කොවිඩ් 19 වසංගත තත්වය තුල, ලෝකයේ රටවල් අතර කොරෝනා මර්ධනය කරපු දෙවනි රට හැටියට ලංකාව පත්වුනා. ඒ පත්වුනේ වර්තමාන අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන්ගේ දුර දක්නා නුවන, දුර දර්ශී පාලනය නිසාය කියලා අපි පිළිගන්නවා. ලෝකයේ කවුරුත් පිළිගත්තා. කොහොම නමුත් මෙවර නොසිතූ විදිහට දෙවනි කොරෝනා රැල්ලට අපට මුහුන දෙන්න සිදුවෙලා තියෙනවා. අපි බලාපොරොත්තු වෙනවා. පළවෙනි කොවිඩ් රැල්ල මර්ධනය කළ ආකාරයටම, මෙම වසංගත තත්වයත්, යථා කාලෙදි අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන් එක්ක ඒ රජයට මර්ධනය කරන්න අපට හැකියාව ලැබෙයි කියලා,

ගරු මන්ත්‍රීවරුනි අපි ගියවර කොවිඩ් වසංගත තත්වය තුල නාගොඩ ප්‍රදේශීය සභාවෙන් අපට යම් යම් දේවල් කරන්න පුලුවන් වුනා. එහිදී අපහාස සහ නොයෙකුත් කතා අහන්න ලැබුනා. නමුත් ඉදිරියෙදිත් අපට මේ බල ප්‍රදේශවල ඉදිරියෙදි යම් එවැනි තත්වයක් ඇති වුනොත්, ඔබතුමන්ලගෙ සහය අපට දෙන්න කියලා සියලු මන්ත්‍රීවරුන්ට මම මේ අවස්ථාවෙ ප්‍රසිද්දියෙ කියන්නෙ. ඉදිරයෙදි අපි එහෙම බලාපොරොත්තුවක් නැහැ. නමුත් යම් වෙනසක් වුනොත්, අපට ඒ අපේ සභාවෙන් විය යුතු කර්තව්‍ය ඉටු කරන්නට ඔයාලගෙ සහය මට අවශ්‍යායි. විශේෂයෙන්ම මේ අවස්ථාවෙත් අර ධර්මසිරි මන්ත්‍රීතුමා කිව්ව වගේ, ගල්වාන ප්‍රදේශයේ, බ්‍රැන්ඩෙක්ස් ආයතනයේ සේවය කරපු කෙනෙක් ආවයි කියලා කතාවෙනවා. මම දන්නෙ නැහැ මේ සත්‍ය අසත්‍යතාවය. නමුත් එහෙම වුනොත් එච්චර හොද නැහැ. විශේෂයෙන්ම උඩුගමත් ඉන්නවා. ගාල්ල ප්‍රදේශය කොවිඩ්වලට ආරක්ෂිත වුනත්, ගාලු වරායෙන් එලියට එන ගාල්ලට එන්නෙ. එයින් 80% ක් කොවිඩ් වෛරස් කාරයො. ඒ නිසා අපි ආරක්ෂිතයි කියල අපට හිතන්න බැහැ. ඔය පිටරට ඉන්දියන් කියල කියන්නෙ. ඒ කට්ටිය ඇවිල්ලා, නවාතැන් ගන්නෙ, ගාල්ලෙ හාබර් එකෙන් එලියට එන්නෙ. ඉතිං ඒ කට්ටිය නිසා අපට කියන්න බැහැ. කොයි මොහොතින්, මේවා ව්‍යාප්ත වේද කියලා, මේ කොවිඩ් රැල්ල අවසන් නැහැ. මොකද ඉන්දියාවෙ තියෙනකම්, අපට අවශ්‍ය කියලා හිතන්න බැහැ. මොකද මුහුදු මාර්ගයෙන්, යාපනය ප්‍රදේශයේ හොර බඩු ව්‍යාපාර වෙනවා. මොකද අපේ මිනිස්සු මුදලට යටවෙන මිනිස්සු. කොවිඩ් නෙවෙයි වසංගත මොනව ආවත්, මුදලට යට වෙනවා. ඒ නිසා අවදානෙන් නොහිටියොත් අපට මේ වසංගත තත්වෙන් බේරෙන්න හැකියාවක් නැහැ. විශේෂයෙන් බලන්න. බ්‍රැන්ඩෙක්ස් ආයතනය ලංකාවෙ ව්‍යාප්ත වෙලා, මට සමහර වෙලාවට හිතෙනවා. මේක යම් කුමන්ත්‍රණයක්ද කියලත්. ගරු මන්ත්‍රීවරුනි, වරදවා හිතන්න එපා මොකද, කොවිඩ් වසංගතය තුරන් කිරීම අතරින්, ලෝකෙ අංක දෙකට පත්වෙලා තියෙන ලංකාව කියන මේ පොඩි රට මේ කොවිඩ් වෛරසයෙන් බේරුනාට පස්සෙ, ලෝක නායකයන්ටත්, සමහර විට යම් යම් සිතුවිලි ඇතිවෙනවා. ඒක මගේ අදහසක්. නමුත් බ්‍රැන්ඩෙක්ස් කියන ආයතනය ලංකාවෙ ව්‍යාප්ත වෙලා ඉන්නෙ. දැන් බෝම්බයක් පටවගෙන එක තැනකට ගියොත් එතන දෙසීයයි මැරෙන්නෙ. ඔය කොවිඩ් හැදුන එක්කෙනෙක් බස් එකෙන් ගියානම්, මුලු පළාතටම හදලා ඉවරයි. ඒ නිසා අපි කොහොමත් පරිස්සම් විය යුතුයි. බ්‍රැන්ඩෙක්ස් ආයතනයේ 638 ක් ඉන්නවා. 819 ක් ඇවිල්ලා, 638 ක් මෙහේ නිරෝධායනය වෙනවා. ඒකෙන් 206 ක් පොසිටිව්. බ්‍රැන්ඩෙක්ස් එකෙන් 638 ක් ඉන්නවා 819 ක් ඇවිල්ල 638 ක් මෙහේ නිරෝධායනය වෙනවා ඒකෙන් 206 ක් පොසිටිව්. වෙන පිටින් ඇවිල්ලා ගාල්ලේ නිරෝධායනය වෙනවා. හම්බන්තොට 118 ක් ඉන්නවා. එහෙනම් මම මීට වඩා ඒ පිළිබද කියන්නෙ නැහැ. එවැනි රැල්ලක් ඇති නොවේවා. මේ බල ප්‍රදේශයේ නිරෝගීමත් ජනතාවට, ඒ කොවිඩ් වසංගතය බෝ නොවේවයි කියල ප්‍රාර්ථනා කරනවා.

ගරු මන්ත්‍රීතුමාල අහගන්න. ඒ වගේම කොවිඩ් වසංගතයත් එක්ක මම අනිත් වසංගත තත්වයක් තමයි ඩෙංගු වර්ධනය. මේ අවුරුද්ද තුල අපේ කොට්ඨාසයේ උඩුගම නාගොඩ 28 කට ඩෙංගු හැදිලා. 2020 අවුරුද්දට එක්කෙනෙක් මැරිලා තියෙනවා. 2004 වර්ෂයේ සිට බලන කොට 2004 දෙකයි. 2015 දහයයි. 2016 නවයයි. 2017 දාහතරයි. 2018 එකයි. 2020 දෙකක් වශයෙන් මේ ඩෙංගු රෝගය නිසා ජීවිතක්ෂයට පත් වෙලා තියෙනවා. ඊලගට මී උණ පිළිබද අපට සතුටු වෙන්න බැහැ. අපේ ගාලු දිස්ත්‍රික්කය තුල මී උණ හැදිලා 421 ක් ඉන්නවා. ඒ අතර, 15 දෙනෙක් අපේ ගාලු දිස්ත්‍රික්කෙ කරාපිටිය රෝහලෙත්, ගෙනැල්ල මැරුණ අය පිටින් ඇවිල්ල තියෙනවා පස්දෙනෙක් එවැනි ආකාරයට ජීවිතක්ෂයට පත්වෙලා තියෙන්නෙ.

ඊලගට දැන් අපි කතා කළ පිස්සු බලු උවදුර, බලු ජනගහනයෙන් 80% කට බෙහෙත් විදින්න ඕන. නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලු ජනගහනය අටදහස් ගණනක්. ඉතිං ඒ සේරටම බෙහෙත් විදින්න ඕන කිව්වා. සුනඛයින් ලියාපදිංචි කළ යුතුයි. නමුත් ඒ ලියා පදිංචියක් වෙන්නෙ නැහැ. සති 06 මාස 06 අවුරුද්ද හැම බල්ලටම බෙහෙත් විදින්න ඕන. ඒවගේම ජල භීතිකාව

කියන්නෙ සුනඛයන්ගෙන් විතරක් නෙවෙයි. පූසො, කිරි බොන හැම සතාම ජල භීතිකා රෝගය වපුරන්න පුලුවන් අය. අපි බල්ලොයි කියල හිතා ගත්තට, ඒක වැරදියි. මේ අවුරුද්දෙ දෙන්නෙක් මිය ගිහිල්ල තියෙනවා. අපේ බල ප්‍රදේශයේ ඔය පොඩි ළමයත්, යටලමත්තෙත් දෙන්නටම ජලභීතිකා රෝගය හැදිලා. නමුත් බල්ල කාපු එකවත්, කොයි බල්ලද කෑවෙ කියලවත් දන්නෙ නැහැ. මේ ළමයත් මාස එකහමාරකට උඩදි මාපලගම පංතියකට ඇවිල්ලා බල්ලෙක් සූරලා තියෙනවා. පොඩි යාලුවෙක් එක්ක විතරයි කියල තියෙන්නෙ. අනිත් එක්කෙනත් බල්ලෙක් කෑවයි කියලා තියෙන්නෙ පස්සෙ. නමුත් පරීක්‍ෂණයෙදි තමයි හෙළිවෙලා තියෙන්නෙ ජල භීතිකාව බව. ඊට පස්සෙ තමයි දැන් මේ වෙන කොට මේ ප්‍රදේශයේ යම් යම් ස්ථානවල මේ වන විටත් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරු විසින් සුනඛයන් එන්නත් කරනවා. මේ සේරම සුනඛයන් වන්ද්‍යාකරනය කරන්න ඔපරේෂන් එකක් තියෙනවලු. ඒ ඔපරේෂන් කළ යුතුයි. අයාලේ යන සුනඛයන්ටත් යම් ක්‍රමවේදයක් කිව්වා. ඒක ඉදිරියෙදි ක්‍රියාත්මක වෙයි.

ගරු මන්ත්‍රීතුමන්ලා, මේ අනතුරුදායක ගස් ප්‍රශ්නය නිසා අද සභාව සඳහා බොහෝ කාල වෙලාවක් ගතවුණා. හෙට සභාවෙන් ගස් තුනක් කැපීමට යනවා. පොලිසියටත් දැනුම් දීල තියෙන්නෙ. කැප්පිටියගොඩ, තල්ගස්වල තවත් ස්ථානෙක පොලිසිය සම්බන්ධ කර ගෙන, අපේ සභාවෙන් ඒ ගස් කපනවා. මේ ගස් පිළිබඳව කතා කළාම, ඇත්තටම නිලධාරි වැරදි නැහැ. මම අදත් කියනවා. නිලධාරි වැරදි නැහැ. නිලධාරින්ගෙ අඩුවක් තියෙනවා. මේ කටයුතු සඳහා කාන්තා නිලධාරිනියක් ඉන්නෙ. තවත් නිලධාරියෙක් එක්ක තමයි මේ කටයුතු සඳහා යායුතු. නමුත් අපේ නිලධාරී අඩුකම නිසා, කාන්තා නිලධාරියෙක් යොදවලා ඒ කටයුත්ත කරන්නෙ. ඒ නිලධාරිනිය ඒ කටයුතු සාධාරණව කරනවා. ඒ නිලධාරිනිය ඇත්තටම සමහර අවස්ථාවල මිනිස්සුන්ගෙන් බැනුම් අහනවා. නමුත් ඒ නිලධාරිනිය බය නැතුව සත්‍ය කතා කරනවා. සමහර වෙලාවට මට කියනවා. අනේ සභාපතිතුමා, මම මේ රාජකාරියෙන් ඉවත් කරන්න කියලා. එයත් අසරණ වෙනවා. මට කරන්න දෙයකුත් නැහැ. මමත් එයාට බනිනවා. සමහර වෙලාවට කඳුවල, කැලෑවල තනියෙන් ගිහිල්ලා, මේ කටයුත්ත කරන්නෙ. ඉතිං එතුමියත් එතුමියගෙ කර්තව්‍ය හරියට කරනවා. නමුත් අඩුපාඩු නැත්තෙ නැහැ. අපි කාගෙත් අඩුපාඩු තියෙනවා. ඒ පිළිබඳ මම වැඩි යමක් කියන්න යන්නෙ නැහැ. මොකද යම් තැන්වල ක්‍රෝධය, ඊර්ෂාව තමයි මේ ගස් ප්‍රශ්නවලට හේතුව. ඒවගේම මාපලගම වැඩිහිටි සමිතිය තාප්පෙ බැදල තියෙන්නෙ ගහ අයිනෙ. දැන් ගහ කපන්න කියනවා. තාප්පෙ බැදලා තියෙන්නෙ පස්සෙ. නමුත් ගහ කපන්න වෙනවා. ඒ ගස දැන් තාප්පයට අනතුරුයි. නමුත් ඒ ගොඩනැගිල්ල අනවසර ඉදිකිරීමක්. මේ සම්බන්ධව කවුරුවත් කතා කරන්නෙ නැහැ. ගොඩනැගිල්ල අනවසරයි. මේවට උත්තර දෙන මාත් එක්ක තමයි වෛර බඳින්නෙ. අපි සාධාරණේ කරන කොට දැන් ඔබතුමාලා අහනවා. ගහ කපන්නෙ නැත්තෙ ඇයි කියලා. මම කියන්නෙ හිටපු සභාපතිතුමාල දන්නවා. අපට කිව්වොත් මේ ගහ අනතුරුදායකයි කියලා, සොයා බලා සභාවට ගහ කපන්න වෙනවා. අපට අදාල නැහැ තාප්පෙ බැන්දයි කියලා, අපි නීතිය ක්‍රියාත්මක කරන්න ඕන. මොකද මේ ගොඩනැගිල්ල අනවසර ඉදිකිරීමක් නිසා ඒක මීට පෙර ගොඩනැගිල්ල හදන එක නවත්වන්න ඕන. ඒක නිසා ගරු මන්ත්‍රීවරු, කතා කරනකොට දැනගෙන හැම පැත්තක්ම බලල කතා කරන්න. මොකද එක පැත්තක් බලලා මම තීරණ ගන්නෙ නැහැ. අවංකව මේ අවස්ථාවෙ මට දිව්රා ප්‍රකාශ කරන්න පුලුවන්, මම කිසිම දේශපාලන පක්ෂයක් බලලා, ඔය වැඩ කටයුතු කරන්නෙ නැත. අදත්, හෙටත්, මතුවටත් එසේ කරන්නේ නැත. නමුත් අපේ පාක්ෂිකයන්ට දේශපාලන උදවු කරනවා. ඒ මගේ වගකීම. මම නිතරම බලන්නෙ, දෙපාර්ශවය තුලනය කරලා, සාධාරණය පෙන්නල දෙන්න. නමුත් මේ ක්‍රෝධයත් එක්ක මිනිස්සු සාධාරණය පිළිගන්නෙ නැහැ. ඊලගට අර දූරියන් ගහේ ගැටළුවට අදාළ ආච්චි අම්මට, ගෙයක් හදල දෙන එක ඒ මිනිස්සුන්ට වටිනවා. නමුත් ඒක කරන්නෙ නැහැ. දැන් ඒ ගහ තක්සේරු කරලා තියෙනවා. ඒක කපලා ඉවත් කරගෙන යයි. කොහොම නමුත් ගස් පිළිබඳව හරිම ප්‍රශ්නයක් තමයිතියෙන්නෙ. මම අන්තිමට ලේකම් තුමියට

කිව්වා. ඒ නියෝගය එතුමියගෙ අත්සනින් යවන්න කියලා. මොකද අපි ලියුම යැව්වම, දේශපාලන වශයෙන් ප්‍රශ්න ඇතිවෙනවා. නමුත් අපි එහෙම අසාධාරණයක් නෙවෙයි කරන්නෙ.

ඒ වගේම විදුලිය පිළිබඳව කතා කලොත්, ගරු මන්ත්‍රීතුමන්ලා මම සතුටින් කියන්න ඕන. දැන් මේ වන විට පොදු අරමුදලෙ හැත්ත නව ලක්ෂ අනූ නව දහසක්, සේවක ණය දෙලක්ෂ අනූ හත්දහසක්, රජයේ ආධාර දසලක්ෂ හැට අටදහසක්, තියෙනවා. ගරු මන්ත්‍රීතුමන්ලා, මේ මුදල් අපට මුල් කාල වකවානුවෙ දුන්නෙ නැහැ. හිටපු මහ ඇමතිතුමා අපේ මුද්දර ගාස්තු අපට ගෙවීම අඩු කළා. ඊලගට මම අර එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් කිව්වෙ වෙන අදහසකින් නෙවෙයි. අපිට ඒ අර මහ ආණ්ඩුවකින් තියෙන සහය ලැබුනෙ නැහැ. පළාත් සභාව තිබුනා. පළාත් සභාවත් විසිරුවා හැරියා. ඒ පළාත් සභාවෙන් සුලු මුදලක් තමයි ආවෙ. ඊලගට අපි අපේ ජනාධිපතිතුමා පත්කර ගත්තා. අපි බලාපොරොත්තු වුනා ලොකු සංවර්ධනයක්. ඒ අනුව තමයි නාගොඩ නගර සංවර්ධනයට අපි ඉල්ලන කොට බොහොම සතුටින් භාර ගත්තා. ඊට පස්සෙ මාසෙ ඉදලා කෝවිඩ් ආවා. අද වෙනකනුත් ඒ සංවර්ධනය කර ගන්න බැහැ. ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලීම් කරලා, දැන් මුද්දර ගාස්තු හැටියට මුදල් ටික ටික එවනවා. ගරු මන්ත්‍රීවරු හිතන්න, මේ වෙනකොට පෙනුනෙ නැති වුනාට, කොට්ඨාස මට්ටමෙන්, වැඩක් නොකෙරුනාට, මේ සභාවට සරිලන අවශ්‍යතාවයක් ඉටු කරගන්න දැන් 90% ම අවසන්. එකක් තමයි ආදාහනාගාරය. ආදාහනාගාරය හදන්න වලකුඹුරෙන් අක්කරයක බිම් ප්‍රමාණයක්, කිසිම මුදලක් නොගෙවා, අපි පවරගත්තා. කිසිම ආයතනයකට එහෙම දෙන්නෙ නැහැ. මම ඒ කටයුත්ත කර ගත්තා. දැන් මුදල් ලක්ෂ 258 ක අවශ්‍යතාවය තියෙනවා. ගරු ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලුම් කලාම, ගරු ආණ්ඩුකාරතුමා කිව්වා. මුද්දර ගාස්තුවලින් ඉදිරියෙදි අඩුකරගන්න, සල්ලි ටිකක් දෙන්නම් කියලා කිව්වා. මම කිව්වා ගරු ආණ්ඩුකාරතුමනි, එහෙම කරන්න එපා අපට මුදල් නැහැ කියලා. කොහොම හරි මම උත්සාහ ගන්නවා. මේක කොහෙන් හරි වෙන විදිහකට හරි ගන්න. මම මේ බැලුවෙ මේ අපේ තියෙන මුදල්වලින් යම් කිසි ගානක් වියදම් කරලා, පාරයි, ගෙපලයි සකස් කරන්න.

අපේ අතිගරු ජනාධිපති ගෝඨාභය මැතිදුන් උඩුගමට ආපු වෙලාවෙ, එතුමගෙ පළවෙනි යෝජනාව හැටියට නාගොඩ නගරය සංවර්ධන කරන්න යෝජනා කළා. නාගොඩ නගරය සංවර්ධනය කරන එක නාගරික සංවර්ධන අධිකාරිය හරහා යම් සැලැස්මක් කරවගෙන කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා. අපට යතා කාලෙදි කර ගන්න පුලුවන් වෙයි.

ඒ වගේම එල්ආර්සී ඉඩම්වලින්, තල්ගස්වල එල්ආර්සී සතු ඉඩම අපි පවරා ගත්තා. දැන් ඒකට මුදල් ගෙවන්න තියෙනවා. එල්ආර්සී එකට යම් මුදලක් ගෙවන්න ඕන. අපිට පවරගන්න තව එල්ආර්සී ඉඩම් කීපයක් තියෙනවා. ඒ සඳහා අපට මුදල් ගෙවන්න වෙනවා. ඊලගට ඇප්තොප්වත්ත ඉඩම පිළිබඳව කතා කරනවනම්, ඇප්තොප් වත්තෙ ඉඩම් බෙදාදීම දීර්ඝකාලීනව තියෙන ප්‍රශ්නයක්. අපි ගාල්ලට කැඳවලා, පසුගිය දිනවල රැස්වීමක් තිබුණා. ඒකෙදි මම ඇප්තොප්වත්තෙ කලින් අපි භුක්ති වින්ද අක්කර 35 ම දෙන්න කියලා ඉල්ලීම් කළා. අක්කර 35 ලබා ගන්න කලින් දැනට ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පවත්වා ගෙන යන අක්කර පහ ලබා දෙන්නම් කිව්වා. එම රැස්වීමේදී, මේ ඉඩම අත්කර ගැනීමේදී ගෙවිය යුතු වන්දි මුදල් ලබා දෙන්නත්, ගරු ආණ්ඩුකාරතුමා පොරොන්දු වුණා. දැන් සභාවෙනුත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙනුත් තක්සේරුවට යවල තියෙනවා. තක්සේරු වාර්තාව ආවට පස්සෙ, තක්සේරු වාර්තාව හා අනිකුත් ලිපිලේඛන ඉදිරිපත් කරලා, අපට ඒ අක්කර පහ ප්‍රමාණය ලබා ගන්න පුළුවන්. ඒ නිසා ඒකෙත් අපි ජයග්‍රහනයක් කළා.

ඒ වගේම අලුත්වත්ත ප්‍රදේශයේ අනවසර ඉදිකිරීමක් පිළිබඳව, අනවසර ඉදිකිරීම සිදු කල අය සභාවට කැඳවූ නමුත් ඔවුන් නොපැමිණි නිසා ඒ සම්බන්ධව සොයා බැලීම සඳහා මම අජිත් මහත්තයත් සමග ඒ ප්‍රදේශයට ගියා. ඔවුන්ට විරුද්ධව නඩුවක් දාලා තියෙනවයි කිව්වා. ඔවුන් අපෙන් බලපත්‍රයක් ඉල්ලනවා. නමුත් අනවසර ඉදිකිරීමක් නිසා අපෙන් වෙලඳ බලපත්‍රයක් දීම කල

නොහැකි බව මම ප්‍රකාශ කළා. ගරු මන්ත්‍රීවරුනි දැන් බුලත් විඩ විකුණන පුද්ගලයෙක්, අපේ සභාවෙ බලපත්‍රයක් අරගෙන බුලත් විඩ විකුණනවා. රුපියල් 50 යි 100 යි 200 යි ව්‍යාපාරෙ ආදායම. ඒකෙන් අපට රුපියල් 100 ක් 200 ක් බලපත්‍ර ගාස්තු හැටියට දෙනවා. නමුත් අනවසර ලෙස ලක්ෂ ගණන් ව්‍යාපාර කරන අයගෙන් අපට සත පහක්වත් නැහැ. ගරු මන්ත්‍රීවරුනි, අනවසර කියලා, ඒ අනවසරබව නීත්‍යානුකූල නොවෙන්නත්, ඒක එයාලට අයිතියක් නොවෙන්නත්, නමුත් අපට සභාවට ආධායමක් ලැබෙන්නත්, මේකට මොකක් හරි යම් ක්‍රමවේදයක් තියෙන්න ඕන. දැන් හැම තැනම අනවසර මාලු ව්‍යාපාර කරනවා. අපට ගන්න ක්‍රියාමාර්ගයක් නැහැ. ඊලගට පියල් මන්ත්‍රීතුමා කිව්ව වගේ, තල්ගස්වල අනවසර ටොයිලට් එකක් හදනවයි කියලා. මට ආරංචි වුනාම, මම පොලීසිය දැනුවත් කළා. මාර්ග සංවර්ධන අධිකාරියටත් මම කිව්වා. මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඒ අනවසර ඉදිකිරීම ඉවත් කරනවා කිව්වා.

ඊලගට අර පොළේ ඉඩමට යාබද ඉඩමෙ නිමල් කියන පුද්ගලයා ඉඩම් ප්‍රශ්නයකට නිතරම සභාවට එනවා. අපේ ඉඩමෙන් අල්ලගන්නෙ නැතිව එයාගෙ ඉඩම එයාට ඕන විදියට මැනගන්න කියලා මම කිව්වා. සම්පූර්ණ පොළ භූමිය සුද්ධ කරන්න මට අවසර දෙන්න. දැන් ඒ සඳහා ඇස්තමේන්තුවක් හදා ගන්න ඕන. මේ සල්ලිවලින් මම මොනව හරි දෙයක් කරනවා. ඊලගට කොට්ඨාස 15 වත් ඉදිරියේ වැඩපිළිවෙලක් සකස් කරන්න අපි කතා කර ගන්නවා. සුමානෙකට තනිකරම එක කොට්ඨාසෙක මන්ත්‍රීවරු සමග ශ්‍රමදාන මට්ටමින් කටයුතු කරන්නත්, අපට තියෙන මුදල් ප්‍රමාණයක් වියදම් කරගෙන, විදුලිය, පාරවල් ටික යම් මට්ටමකට, අපට කරන්න පුලුවන් ආකාරයේ කටයුතු කරන්නත්, ඒ වගේම පොළවල් දෙක පිළිබඳව අදාල කටයුතු සිදු කරන්නත් බලාපොරොත්තු වෙනවා. ඒ පොළවල්වලටත් යම් ක්‍රමවේදයක් කරන්න පුළුවන්. දැන් මුදල් තියෙනවා. ඒ එක්කම තව මුදල් අපි ඉල්ලලා තියෙනවා.

මම පහුගිය දවස්වල අපේ ගරු අමාත්‍ය රියල් අද්මිරාල් සරත් වීරසේකර මැතිතුමා හමුවෙලා, එතුමාට අපි ඉල්ලීමක් කළා. අපේ ආදාහනාගාරයේ වැඩ කටයුතු කරන්න මුදල් ලබාදෙන්න කියලා. ඒ මුදල් ලබන අවුරුද්දෙ ලබා දෙනවයි කියලා එතුමා පොරොන්දු වුනා. එතුමා ඇත්තටම ගෞරවණීය අමාත්‍යවරයෙක්. එතුමා අපට බොහොම සුහදව, ලබැදිව ඒ කටයුත්තෙදි අපට උදවු කරන්නම් කිව්වා. මේ සභාවලට එනවයි කියලත් කිව්වා. මම කිව්වා අපි බොහොම දුප්පත් සභාවක්. එතුමා අපට උදව් කරාවි. මොකද මම වෙළඳ හැටියට කටයුතු කරන අවධියේ එතුමා මම වැඩ කල නැවක නිලධාරියෙක් විදිහට කටයුතු කළා. ඒ පිළිබඳත් පොඞ්ඩක් දැනුවත් වෙලා, කොහොම හරි මට යම් උදව්වක් ගන්න පුලුවන් කියලා විශ්වාස කරනවා.

ඒ වගේම තමයි විදුලිය ප්‍රශ්නෙ, ගරු මන්ත්‍රීවරුනි, මම යම් මුදල් ප්‍රමාණයක් ආයෝජනය කරලා, අලුත් විදුලි ලාම්පු ගේනවා. බල ප්‍රදේශයේම අවශ්‍ය තැන්වලට, ඔබතුමන්ලා මාර්ගයෙන්, ඔබතුමන්ලා දැනුවත් වීම තුල, විදුලි ලාම්පු සවි කරන්න මම බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා ඔබතුමන්ලගේ සහය මම බලා පොරොත්තු වෙනවා. වෙනද වගේ වංචා සහගතව කටයුතු කරනවා කියලා වචන කියන්න එපා. ක්‍රමානුකූලව කටයුතු කරන්න අවශ්‍ය නිසා පරක්කු වෙනවා. මේ කටයුත්තෙදි මම විනිවිද භාවයෙන් කරනවා. මම හිතන්නෙ ඉදිරි දෙසැම්බර් වෙනකොට ඔයාලගෙ තියෙන විදුලිය ප්‍රශ්නත් අනිත් කටයුත්තත් සිදු වෙයි. මොකද මේ පහුගිය කාල වකවානුවල හැම දේම අපට පරක්කු වුනේ කාලගුණයත් අපට බලපෑව නිසා. එක් පැත්තකින් ගංවතුර, වරුසාව අපි යම් දෙයක් කරන්න යනකොට ඒක මගඇරෙනවා.

ඊලගට සමහර වෙලාවට ජනතාව මේ මන්ත්‍රීවරුන්ට වැඩ කරන්නෙ නැහැ කියලා බනිනවා. මම ප්‍රතිපාදන දුන්නොත් විතරයි මන්ත්‍රීවරු වැඩ කරන්නෙ, ඒ නිසා මන්ත්‍රීවරුන්ට දොස් කියන්න එපා මට දොස් කියන්න කියලා මම කිව්වා. කිසි මන්ත්‍රී කෙනෙකුට දොස් කියන්න මම ඉඩදෙන්නෙ නැහැ. මම දොස් අහගන්නවා. මම මන්ත්‍රීවරු පාවා දෙන්නෙ නැහැ. නමුත් මම කියන එක මූනට කියනවා. ඒ වගේම අර මන්ත්‍රීවරුන්ට වෙන් කල රුපියල් ලක්‍ෂයක මුදලින් මම ලබා ගත් රුපියල් ලක්ෂයක මුදල මම තාම වියදම් කළේ නැහැ. මම මේ මුදල් ආරක්‍ෂා කරගෙන හිටියෙ, මට ඉලක්කයක් තියෙනවා. මට අවශ්‍යතාවයක් තියෙනවා. මෙන්න මේ සභාවෙන් මම ඉවත්වෙලා යන කොට, යම් දෙයක් කරල යන්න. කොහොම හරි ඒක කරනවා. කොහොම නමුත් මේ මුදල් මම මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් නොවෙන්න, බල ප්‍රදේශයේ යම් යම් සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා යොදවනවා. ගරු මන්ත්‍රීතුමනි කොට්ඨාස මට්ටමින් ඔබතුමන්ලා සියලු දෙනාම එකතුවෙලා ඒ කටයුත්තට සහය දක්වන්න. මම ගැන යම් වැරදි වැටහීමක් තියෙනවනම් ඒක ඉවත්කර ගන්න. මේ සභාවෙ හිටපු සභාපතිවරු දෙන්නෙක් ඉන්නවා ඒ අය දන්නවා මෙතනට ආවම තියෙන ආතතිය මොන වගේද කියලා. ඉස්සර 13 දෙනෙක්ගෙ පීඩනය. දැන් 27 දෙනෙකුගෙන් එන පීඩනය දරා ගන්න ඕන. ඒ වගේම අද අපේ දරුවො දෙන්නටම විභාගෙ. මම මෙහේ. මෙහෙම වුනාම ආතතිය වැඩියි.

අද බොහොම කාල වේලාව ඉක්මවෙලා ගියා. කොවිඩ් වසංගත තත්වය මත අපට තවම නියෝගයක් දුන්නෙ නැහැ. රැස්වීම් තියන්න එපා කියලා. නමුත් අපි දන්නවා පහුගිය කාල වකවානුව තුල අපි කොවිඩ් එක්ක හැසිරුන ආකාරය. ඒ නිසා ඉදිරි අනාගතයෙදි ඔබ සියලු දෙනාත් කොවිඩ් වෛරසයෙන් බේරෙන්න කටයුතු කරන්න. ඒකට අනුගත වෙන්න. සමාජයත් එක්ක සම්බන්ධ වෙලා, යහපත් රටක් ඇති කරන්න උදවු වෙන්න කියලා ඉල්ලා සිටිමින්, ඔබ සියලු දෙනාට නැවත ආරාධනා කරනවා 15 වෙනිදා සංවර්ධන කමිටුවට සහභාගි වෙන්න. යෝජනා ඉදිරිපත් කරන්න. ප.ව.12.00 සිට ප.ව. 2.00 දක්වා නාගොඩ මාපලගම කොට්ඨාසෙ මන්ත්‍රීවරුන්, ප.ව.2.00 සිට ප.ව. 4.00 වෙනකම් යටලමත්ත උඩුගම කොට්ඨාසෙ මන්ත්‍රීවරුනුත් සහභාගි වෙලා, ඒ සංවර්ධන කටයුත්තට දායක වන්න. එතනදි ඔබගේ යෝජනා චෝදනා ඇත්නම් ඉදිරිපත් කරන්න කියලා ඉල්ලා සිටිමින්, අද පැමිණි උප සභාපතිතුමා, ඇතුලු ගරු මන්ත්‍රීතුමාල මන්ත්‍රීතුමියන්ලා සියලු දෙනාටම නිදුක්, නිරෝගී, මේ වෛරස් වලින් තොර වාසනාවන්ත සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කරන්න වාසනාව ලැබේවා කියල ප්‍රාර්ථනා කරමින්, මා නිහඬ වෙනවා. සියලු දෙනාටම බොහොම ස්තූතියි. තෙරුවන් සරණයි.

සභාපති,
නාගොඩ ප්රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                                        දිනය:-